FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
නොවැම්බර්(ඉල්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

24











**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

**UHF CH 60**
**PEO TV CH 22**
**Dialog Tv 21**
**Dish Tv 2532**

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

**FM 104.4 - 105.7**

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




**වස්සාන ඍතුවේ එළඹෙන අවසාන පොහොය ලෙස "ඉල් පොහොය" හැඳින්විය හැකිය.**

මෛත්‍රී බෝසතාණන් වහන්සේ දහසක් පරිවාර ජනයා සමඟ බුදුරජාණන් වහන්සේ වෙතට පැමිණ පැවිදි බව ලැබීය.බුදුවීම සඳහා අවශ්‍ය නියත විවරණ ලබාගත්තේද ඉල් පොහෝ දිනකය.

බරණැස ඉසිපතනාරමයේ දී පළමුවන ධම් දේශනාව පවත්වා තම ශ්‍රාවක භික්ෂූන් වහන්සේලාට මහජනතාවගේ යහපත සඳහා ''ධම්චාරිකාවේ '' යන ලෙසට උපදෙස්දීමත්, ඒ අනුව පළමුවන ධම්දූත කණ්ඩායම ධම් චාරිකාවේ යෑමත් සිදුවූයේ ඉල් පොහෝදාය.

උරුවේල් දනව්වෙහිදී තුන්බෑ ජටිලයන්ට දහම් දෙසා මාර්ගඵලයන් ලබාදුන්නේ ද ඉල් පොහෝ දිනකය.

පෙරවස් හා පසුවස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා වස් පවාරණය කිරීමෙන් පසු ''චීවර මාසය'' ලෙස සළකා වස් පිංකම් ප්‍රධාන අතිරේක පිංකම්ද සිදුකරනු ලබන්නේද මෙම පොහොය මූලික කරගෙනය.

වස් පවාරණය කළ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයට වැඩම කලාට පසු එම ස්ථානයට පැමිණි ධර්මසේනාධිපති සැරියුත් මහරහතන් වහන්සේ ආයු සංස්කාරය අත්හරින බව දන්වා සිටියේය. සම්බුද්ධ ශාසනයෙහි පැහැදීමක් නොමැතිව තම මව්තුමියට දහම් දෙසීමට අවසර ලබා ගත්තේද මෙම පොහෝදාය.මව්තුමිය වෙතට වැඩම කළ සැරියුත් මහරහතන් වහන්සේ තම මෑණියන් වහන්සේට දහම් දෙසා නිවාරදි මාර්ගයට යොමු කෙළේද මෙම පොහෝ දිනකය.

ශ්‍රී ලංකාවාසී බෞද්ධ ජනතාව මෙම පෙහෝදා තමන්ගේ විහාරස්ථානවලට ගොස් ආමිස පූජාවන් සහ ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙමින් පිංදහම් සිදුකර ගනිති. දළඳා මාලිගාව, රුවන්වැලිසෑ අභියස, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන අතිපූජනීය ස්ථානයන්හිදී විශේෂිත පූජාවන් පවත්වා පිං සිදුකර ගනිති. ඉල් පොහොය ඉතා වැදගත් සිදුවීම් වලින් යුක්ත පොහොයක් ලෙසට අගයකළ හැකිය.

**ඇම්.ඩී.විජයවර්ධන**

## පුදබිමක අසිරිය

# ලංකාතිලක පිළිමගෙය

පොළොන්නරු රාජධානියේ රජකළ පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් ගොඩනගන ලද බව ඉතිහාසගත තොරතුරු වලට අනුව සඳහන් කිරීමට පුළුවන. පොළොන්නරු යුගයේ සිටි වාස්තු විද්‍යාඥයින්ගේ නිර්මාණ ශක්තිය මෙම ගොඩනැගිල්ලෙන් තහවුරුවන බව ඉතිහාසඥයින්ගේ පිළිගැනීමයි. ප්‍රධාන වශයෙන් ගඩොල් යොදාගනිමින් බදම විශේෂයක්ද මේ සඳහා භාවිතකර තිබේ. ආරක්කු සහිත ගඩොල් පියස්සකින් නිමකර ඇති හෙයින් මෙයට ''ගෙඩිගේ'' යන නාමය ව්‍යවහාර කර තිබේ. මහල් පහකින් සමන්විතවන මෙයට ප්‍රදාන වශයෙන් යොදාගෙන තිබෙන්නේ පුළුස්සන ලද ගඩොල් හා බදම විශේෂයකි. මෙම පිළිමගෙයට ඇතුල්වීම සඳහා ගලින් නිමකරන ලද විශාල උළුවස්සක් තිබුණු බවට සාධක හමුවී තිබේ. ප්‍රධාන දොරටුවට අමතරව උතුරු දෙසින් දෙවන දොරටුවක්ද තිබුණු බවට සාධක හමු වී තිබේ. මෙය විවිධ ලතාවන්ගෙන් හා දේව, බ්‍රහ්ම රූපවලින් ද අලංකාර විය. මෙම ගොඩනැගිල්ල දිගින් අඩි 124ක්ද පළලින් අඩි 66ක්ද වේ. අභ්‍යන්තර අඩි 41ක් විය. සමචතුරස්‍රාකාර අන්තරාලයකින් සමන්විත වේ. ශේෂවී ඇති බිත්තියේ උස අඩි 58කි. අභ්‍යන්තරයේ ඉතා විශාල හිටි පිළිමයක් දක්නට ලැබේ. මෙම පිළිමය විශේෂ මණ්ඩපයක නිර්මාණය කර තිබෙණු පෙනේ. වර්තමානයේ මෙම ප්‍රතිමාවේ සිරස විනාශ වී ගොස්ය. වර්තමානයේ මෙම ප්‍රතිමාවේ උස අඩි 42කි. මෙම විහාර අභ්‍යන්තරයේ බිත්තිවල විසිතුරු මල්කම් වලින් යුක්ත චිත්‍ර ද පැවැති බවට දැනට ශේෂ වී ඇති සිතුවම් සාක්ෂි දරනු ඇත. මෙම ගොඩනැගිල්ලේ ආරක්ෂාව වෙනුවෙන් විශාල ප්‍රාකාරයක් තිබුණු බවට සාධක හමු වී තිබේ. එය ගඩොලින් නිර්මාණය වී තිබෙනු දක්නට ලැබේ. විහාරයට අතුල්වන ප්‍රධාන දොරටුව දෙපැත්තේ අලංකාර මුරගල් දෙකක් වේ. මේවා සියුම් ලෙස කැටයම් කර තිබේ. විහාරය ඉදිරිපිට සළපතල මළුවක්ද වේ.පරිවාර ගොඩනැගිල්ලක් තිබුණු බවට සාධක (නටඹුන්) දක්නට ලැබේ. පරසතුරු උවදුරු වලින් හා ස්වභාවික විපත් වලින් විනාශ වී ඇති බව නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වෙයි. පොළොන්නරු යුගයට අයත් මෙම විහාර කර්මාන්තය සුවිශේෂි නිර්මාණයක් ලෙසට පෙන්නුම් කිරීමට පුළුවන. මතු පරපුර සඳහා මෙවැනි ඓතිහාසික පුණ්‍යභූමි ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකම වන්නේය.





**විජය තලවත්තේගෙදර**

# පව්කරන්නා දෙලොවම තැවෙයි

- ධම්මපදයෙන් -

සතුන් මැරීම, සොරකම් කිරීම ආදී පස්පව් දස අකුසල් කළ තැනැත්තා තමන් කළ පව්කම් සිහිකරමින් මෙලොවදී තැවෙන බවත් මෙලොවදීත් කළ කර්මවල විපාක වශයෙන් මරණින් මතු සතර අපායාදී දුගතිවල ඉපිද දුක් විඳින බවත් බුද්ධ දේශනාවේ සඳහන් වේ. මේ බව ප්‍රකාශවෙන දේශනා අතර ධම්මපදයේ යමක වග්ගයේ 17 වන ගාථාවෙන් පැහැදිලි කිරීම ගැන අවධානය යොමු කරමු.

*ඉධ තප්පති පෙච්ච තප්පති*
*පාපාකාරී උභයත්ත තප්පති*
*පාපං මේ කතන්ති තප්පතී*
*භියෙපා තප්පති දුග්ගතිං ගතෝ*

ධම්මපදයේ ඇතුලත් සෑම ගාථා ධර්මයකටම යම් නිධාන කථාවක් පවතී. ඉහත දැක්වූ ගාථාව දේවදත්ත තෙරුන්වහන්සේ දුගතිගාමී වීම පිළිබඳ කළ දේශනාවකි. අනෝමා නදී තීරයෙහි පිහිටි මල්ලරට අනුපිය නම් වූ අඹ උයනක බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරද්දී අසූ දහසක් පමණ ශාක්‍ය වංශික කුමාරවරු පැවදිබව ලැබූහ.

ඒ අතර සුවිශේෂී වූ කුමාරවරු හය දෙනෙක් වූහ. එනම්, භද්දිය, අනුරුද්ධ, භගු, කිම්බල, දේවදත්ත යන අයයි. මොවුන් අතරින් භද්දිය තෙරුන් වහන්සේ නොබෝ දිනකින් ත්‍රිවිද්‍යාලාභී වූහ. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද දිවැස් ලැබ රහත් වූහ. ආනන්ද කිම්බිල යන තෙරුන් වහන්සේලා ද පසුකාලීනව රහත්වූහ. දෙව්දත් තෙරුන් වහන්සේ රහත් නොවූහ.

එහෙත් ලෞකික සෘද්ධිබල ලබා සිටියහ. එම සෘද්ධිබලය මහා බලයක් ලෙස පෙන්වා බිම්බිසාර මහරජ පුත් අජාසත්ත කුමරු පහදවාගෙන නොයෙකුත් වැරදි මඟපෙන්වීම් ලබාදුන්හ.

අජාසත්ත කුමරු සිය පියා ඝාතනය කොට පිතෘඝාතක අකුසල කර්මය සිදුකර ගත්තේය. බුදුන් වහන්සේ කෙරෙහි බැඳුණු දැඩි වෛරයක් නිසා බුදු පදවිය ලබා ගැනීම පිණිස විවිධ පාපකර්මවල යෙදුනු දේවදත්ත තෙරුන් සංඝ භේදය හා බුද්ධ ශරීරයේ ලේ සෙලවීම යන ආනන්තරිය පාප කර්මවල යෙදීම නිසා රහත් නොවී අවීචිමහා නරකයෙහි ඉපදුනේය. ඒ සංවේගදායී අවස්ථාව මදක් සිහිකර බලමු.

බුදුන් වහන්සේ ඇතුළු මහා සංඝ පිරිවර කෙරෙහි පහන් සිත් ඇති සැදැහැතියෝ විවිධ අයුරින් උන්වහන්සේලා පිදූහ. අසූමහ ශ්‍රාවකයන් වහන්සේලා කෙරෙහි ද මහජන ප්‍රසාදය වැඩිවූහ. දෙව්දත් තෙරුන් කෙරෙහි කිසිදු ප්‍රසාදයක් නැත. මේ බව දැන බුදුන් වහන්සේ ගෙන් භික්ෂු සංඝයා පාලනය කිරීමට වරමක් (අවසරයක්) ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේගෙන් එය ප්‍රතික්ෂේප විය. පසුව භික්ෂූන් වහන්සේලා කෙරෙහි පංචවරයක්



පනවන ලෙස ඉල්ලා සිටියහ.
එනම්

(i) භික්ෂුව දිවි හිමියෙන් ආරණ්‍ය ගත විය යුතුය.
(ii) භික්ෂුව දිවි හිමියෙන් රුක්ඛමූල ගත විය යුතුය.
(iii) භික්ෂුව දිවි හිමියෙන් මස් මාංශ අනුභව නොකළ යුතුය.
(iv) භික්ෂුව දිවි හිමියෙන් පිණ්ඩපාතික විය යුතුය.
(v) භික්ෂුව දිවි හිමියෙන් පාංශකූල චීවරය පමණක් දැරිය යුතුය.

ඒ සියල්ල ද බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ කල්හි සංඝ භේදය කොට ශ්‍රාවකයින් වහන්සේලා පන්සිය නමක් බුදුරජාණන් වහන්සේගෙන් වෙන්කරගෙන ගයා ශීර්ෂයට ගොස් විසූහ. පසුව අගසව් දෙනම එහි ගොස් උන්වහන්සේලාට නිවන් අවබෝධ කරවා රැගෙන ආහ. පසුව නව මසක් ගිලන්ව සිටි දෙව්දත් තෙරුන් බුදුන් දකිනු කැමතිව හඬා වැළපුනහ. දෙව්දත් තෙරුන් යහනක තබා භික්ෂූන් වහන්සේලා විසින් ඔසවාගෙන එන අතරතුර දෙව්රම් වෙහෙර සමීපයෙහි පොකුණ අසල පිපාසයට පැන් ඉල්ලා සිටියදී පැන් බීමට බිමට බසිත්ම පොළව පලාගෙන අවීචිමහා නරකයට ඇද ගෙන ගිය බව සඳහන් වේ. අවසන් මොහොතේ ඔහු බුදුන් සරණ ගියද කළ මහා පාපකර්මවල විපාකය බලවත් විය.

මේ සිදුවීම පිළිබඳ සංවේගය පළකළ තථාගතයාණෝ ඉහත දැක්වූ දේශනාව සිදුකළහ. මේ අනුව පව්කරන පුද්ගලයා මෙලොවදී තැවෙයි. පරලොවද තැවෙයි. දෙලොවම තැවෙයි. මා විසින් පව්කරන ලදැයි සිහිකොට තැවෙයි. දුගතියට ගොස් බොහෝ සේ තැවෙයි.

මෙහිදී දුගති ලෙස දැක්වෙන්නෙ නරක, තිරිසන්, ප්‍රේත, අසුර යන අපාය සතරයි. නරකය, සංජීව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහා රෞරව, තාප, ප්‍රතාප අවීචි යනුවෙන් අටවැදෑරුම් වේ. මේ නරකයන්හි පරිවාර නරක දාසයක් ද ඇත. සියළු නරකයන් එකසිය තිස් හතකි.

තිරිසන් යෝනියේ උපන් සත්වයෝ කාමයෙන් හා බියෙන් තැවෙන්නෝය. යමෙක් මෝහයෙන් මුළාවී අකුසල් කරයි ද ඔවුහු තිරිසන් අපායට පත් වී බොහෝ දුක් විඳිති. ප්‍රේත භවය සම්පූර්ණයෙන්ම සැපයෙන් තොර වූවකි. දන් නොදීම, ඊර්ෂ්‍යා කිරීම, ලෝභකම, දස අකුසල් කිරීම අනුන්ගේ ලාභ වැළැක්වීම, මව්පියන් කෙරෙහි විලිබිය නැතිබව, පින්කරන අයට හිරිහැර කිරීම, අනුන්නට පරිභව කිරීම, අල්ලස් ගැනීම, අගතියෙන් වැඩ කිරීම ආදී අකටයුතු මගින් ප්‍රේත ලෝකයෙහි උපදින බව සඳහන් වේ.

ඔවුන් සා පිපාසා දෙකින් පීඩා විඳිමින් කෙළ සොටු මළ ආදිය කමින් දුක් විඳිති. අසුර යෝනිය යනු මුවින් බැහැර උඩට හෝ යටට නෙරාගිය දත් පිහිටා ඇති සත්ව කොටසකි. දෙවියන්ට සතුරු වූ බැවින් අසුර නම් වේ. අසුරයෝ ප්‍රධාන වශයෙන් දෙකොටසකි.

එයින් වේපචිත්ති නම් අසුරයන් දෙවියන් සමානව සැප විඳිති. කාලකඤ්ජ නම් අසුරයෝ දුක් විඳිති.

මේ අනුව මග වරදවාගත් එවන් චරිත පිළිබඳව සිතා නිවන් මග සුචරිතවත් මාර්ගයක් ඔස්සේ පවතින බව තේරුම්ගෙන අපිද අපායගාමී පිළිවෙත් අතහැර දුකින් මිදෙමු. විපත හා සැපත ඇස් මනාපිට පෙනී පෙනී පාපයන් තුළින් පහත් වින්දන නොලබා උතුමන් ඇසුරු කොට උතුම් පිළිවෙත් පිළිපැද සසරින් මිදෙමු.

**වික්‍රමසිංහ අතපත්තු**

## මහපොළව පලාගෙන අපාගත වූවෝ

ගෞතම බුදුන් වහන්සේ ජීවමාන කාලය තුලදීම ශාසන විරෝධී මිනිස් ධර්මවලට නිගරුවන අයුරින් පාප කර්මවල යෙදුන බොහෝ කරුණු අතින් ප්‍රසිද්ධ හා බලසම්පන්න වූ පස්දෙනෙකු මහපොළෙව පලාගෙන නිරයට පත්වූ බව බෞද්ධ පතපොතේ සඳහන්ව ඇත. තමන් සතු බලය අයුතු විදිහට ක්‍රියාකරන්නට ගොස් මේ අයුරින් අපාගත වූවන් පස්දෙනාගේ විස්තර මෙසේය.

1. උපුල්වන් මහා ස්ථවිරයන් වහන්සේ දූෂණය කළ වූ "භාගිනෙය්‍ය" සිටු පුත්‍රයා

2. තමාගේ රූපයට නින්දා කරන ලද්දේ යැයි සිතා බුදුරජාණන් වහන්සේ කෙරෙහි ක්‍රෝධ සිතින් සත් දවසක් පුරාවට උන්වහන්සේට නොයෙකුත් ආකාරයෙන් චරිත ඝාතනය කරමින් දෝෂාරෝපණය කළ "මාගන්දි" නම් බැමිණිය


3. මිථ්‍යා දෘෂ්ඨිකයින්ගෙන් අල්ලස් ලබාගෙන සිව්වනක් පිරිස මධ්‍යයේ සිට බුදුරජාණන් වහන්සේට දෝෂාරෝපණය කළ "චිඤ්චිමානවිකාය. අල්ලස බුද්ධ කාලයේ සිටම පැවත එනබව මේ අනුව සිතාගත හැකිය.

4. බුදුන් වහන්සේට විවිධාකාර වූ හිරිහැර බාධක පැමිණ වූ දෙව්දත්හුගේ පියාණන් වන "සුප්‍රබුද්ධ" නම් වූ කෝලිය වංශික රජතුමාය.

5. දෙව්රම් වෙහෙර දොරටුවෙහිදී අවසාන මොහොතේ බුදුන් වහන්සේ දකිම්'යි හඬා වැළපෙමින් තම අනුගාමිකයින් සමඟ පැමිණ මහපොළවෙහි පයගසා ඇවිදගෙන යාමට තමා ඔසවාගෙන පැමිණ ඇදෙන් බසින විට නිරයෙහි ගිනිදැල් පොළොව පලාගෙන ඇදිවිත් "දෙව්දතුන්" වෙළාගෙන මහපොළව ගිලී ගිය බවද සඳහන්ව ඇත.

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

පෝතලීය සූත්‍රය ඇසුරින්



# ආර්ය විනයට අනුව පාපයන්ගෙන් මිදෙන අයුරු

තුන් ලොවක් ශ්‍රී සද්ධර්මයෙන් සනසා වදාළ භාග්‍යවතුන් වහන්සේ එක් දිනක් පිඩු සිඟා වළඳා දිවා විහරණය පිණිස අංගුත්තරාප ජනපදයෙහි කුඩා වනයකට වැඩම කළ සේක.

පෝතලීය නම් එක්තරා පුරුෂයෙක්ද කුඩයක් ඉසලා පාවහන් සහිත ශරීර ව්‍යායාමය සඳහා මේ වන රොදට පිවිසියේය. පෝතලීය සම්බුදු පියාණන් දැක ඉතා සතුටට පැමිණ පසග පිහිටුවා වැද එකත් පස්ව හුන්නේය. එවිට තථාගතයන් වහන්සේ සුදුසු තැනකින් අසුන් ගන්නා ලෙස පෝතලීය හට වදාළේ "ගෘහපතිය" යන ආමන්ත්‍රණයෙනි.

මෙම නාමයට පෝතලීය අකැමැති බැවින් තුන් වතාවක්ම භාග්‍යවතුන් වහන්සේ ආරාධනා කරන තුරු ඉවසා සිට "භාග්‍යවතුන් වහන්ස, ගෘහපතිය යන නාමයට මම සුදුස්සෙක් නොවෙමි. ගෘහපතියා යන නාමයට මම සුදුස්සෙක් නොවෙමි. ගෘහපතීහු ධනය ඉපයීම සඳහා කරනු ලබන කර්මාන්ත සියල්ලෙන් මම ඉවත්ව සිටිමි. තිබුණාවූ රන්, රිදී, මුතු, මැණික්, ආදී සියල්ලක් දරුවන්ට පවරාදී නිදහස් වුණෙමි. මා සන්තකව ඇත්තේ ඇග වසන ඇඳුමක් හා ශරීර පැවැත්මට ආහාර පාන පමණකි. මම ගෘහපති භාවයෙන් මිදුණෙමි'යි පෝතලීය පැවසීය. එවිට සම්බුදු පියාණෝ "පෝතලීය, ඔබ කර්මාන්ත වලින් මිදිම ගෘහ බන්ධනයෙන් මිදීමට තරම් ශක්තිමත් නැත. ඔබ කැමති නම් ආර්ය විනයෙහි කර්මාන්ත වලින් මිදීම මිදෙන ආකාරය මට දේශනා කළ හැකියි. මෙසේ දේශනා කරන කල්හි ආර්ය විනයෙහි සියලු කර්මාන්ත වලින් මිදෙන ආකාරය ඇසීමට පෝතලීය උත්සුක විය.

"පෝතලීය කර්මාන්ත හෙවත් ව්‍යවහාර මුලින්ම සිඳලීම සඳහා ධර්මතා 8ක් වේ."

1. ප්‍රාණඝාත නොකිරීම ප්‍රාණඝාතාදිය භාවිතා කිරීමෙන් ප්‍රහාණය කළ යුතුය.
2. දුන්දෙය පමණක් ගැනීම භාවිත කිරීමෙන් සොරකම ප්‍රහාණය කළ යුතුය.
3. සත්‍ය වචන භාවිත කිරීමෙන් මුසාවාදය ප්‍රහාණය කළ යුතුය.
4. කේලාම් නොකීම භාවිත කිරීමෙන් කේලාම් කීම ප්‍රහාණය කළ යුතුය.
5. ගිජු ලෝභය නැතිකම භාවිත කිරීමෙන් ගිජු ලෝභය ප්‍රහාණය කළ යුතුය.
6. නින්දා අපහාස නොකිරීම භාවිත කිරීමෙන් නින්දා අපහාස ප්‍රහාණය කළ යුතුය.
7. ක්‍රෝධ උපායාස නොකිරීම භාවිත කිරීමෙන් ක්‍රෝධ උපායාස ප්‍රහාණය කළ යුතුය.
8. නිහතමානි බව භාවිත කිරීමෙන් අතිමානය ප්‍රහාණය කළ යුතුය.

මේ ආකාරයෙන් ආර්ය විනයෙහි සියලු කර්මාන්ත හෙවත් ව්‍යවහාරය පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කළ කල්හි පෝතලීය එය දීර්ඝ වශයෙන් විස්තර වශයෙන් පැහැදිළි කර දෙන මෙන් බුදුපියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය.

මෙහිදී අප කර්මාන්ත හෙවත් ව්‍යවහාරය තේරුම් ගත යුතුය. කර්මාන්ත යනු පුද්ගලයා විසින් කරන්නාවූ දේය. මෙය ආර්ය විනයට අනුව ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, කාමය වරදවා හැසිරීමෙන් වැළකීමය. එසේ නම් ප්‍රාණඝාත, අදත්ථාදාන, වැරදි හැසිරීමෙන් වැළකීම යන කයින් සිදුවන අකුසල ධර්ම තුනෙන් වැළකී සත්ව කරුණාව, අන්සතු දේ නොගැනීම, නිවැරදි හැසිරීම් රටාව පවත්වාගෙන යෑමය.

ව්‍යවහාරය යනු ද මෙයටම නමකි. එදිනෙදා ජීවිතය නිවැරදිව පැවැත්වීම, යහපත් ආකාරයෙන්, සුදුසු ආකාරයෙන් පාවිච්චි කිරීම යනු ව්‍යවහාරයයි. මෙම කරුණු තේරුම් ගෙන අත්හල යුතුදේ අත්හැරීමත්, කළ යුතුදේ කිරීමත් ව්‍යවහාර වේ. එසේනම් මෙහිදී පෝතලීය ආර්ය ව්‍යවහාරය මුලින්ම සිඳ දැමීමට පත් නොවුණේ කුමකින්ද? මෙහිදී පෝතලීය රන්, රිදී, මුතු, මැණික් ආදිය අතහැරියා නොව ගෘහස්ථයෙකු නැතහොත් පියකු විසින් කළ යුතු දේ කළ පමණි. තමාගේ කුටුම්භයේ දරුවන්ට පවරා දී ඇත. ඔහුගේ ගත වසා ඇති ඇඳුම්, හිස්වැසුම් පාවහන් හා ගමන් විලාශයද ගිහියෙකුගේ ඒවාය. එසේ නම් ගිහිගෙදරක වාසය කරන පෝතලීය සෑම අතින්ම ගෘහස්ථයෙකුය. ගිහි ගෙයක සිට සියල්ලෙන් මිදිම හෙවත් සසුන් බඹසර පිරිය නොහැකිය.

සසුන් බඹසර විසීමට නම් මුලින්ම ගිහිකම ඉවතලා කය මනස දෙකම පැවිදි කළ යුතුය. එසේම මතු දැක්වූ කරුණු අටද සපුරාලිය යුතුය.

**1. ප්‍රාණඝාත භාවිත නොකිරීමෙන් ප්‍රාණඝාතය ප්‍රහාණය කළ යුතුය.**

පාණ + අතිපාතා = පාණාතිපාතා යනුවෙන් දැක්වෙන්නේ ප්‍රාණය නැතිකර දැමීමය. යමෙකුගේ ප්‍රාණය නැතිකර දැමීම කරනකොට ගෙන අපට සිදුවන්නේ කුමක්දැයි ආර්ය ශ්‍රාවකයා ප්‍රඥාවෙන් විමසයි.
යම් කෙළෙස් බැඳීමක් හේතුකොට ගෙන මා ප්‍රාණඝාත කරන්නෙක් වන්නේ නම් ඒ කෙළෙස් බැඳීම ප්‍රහාණය කරණු පිණිස ප්‍රතිපත්තියෙන් යුක්ත වෙමි.

මා ප්‍රාණඝාත කරන කෙනෙක් වුවහොත් ඒ කිලිටි කර්මය නිසා මගේ හදවත මටම දොස් නගාවි.
ප්‍රාණඝාත හේතුවෙන් සිල්වත්, ගුණවත් බුද්ධිමත් අය මා හෙලා දකිවි.
ප්‍රාණඝාත හේතුවෙන් කය බිඳී මරණින් මතු දුගතියෙහි ඉපදීමට කැමති විය යුතුය.

එසේ නම් ප්‍රාණඝාතය වනාහී සසර අපව මුලාවට පත්කරන බැඳීම හෙවත් සංයෝජනයක්ම වෙයි. එම සංයෝජනයෙන් මිදීම නීවරණ ප්‍රහාණයයි. තමන් ප්‍රාණඝාතය කිරීම කරන කොටගෙන දුකකට, සන්දිස්ථානයකට පත්වන්නේ නම් ප්‍රාණඝාතය නොකරන්නාට එය නිදුකක්මය.

**02. දුන්දෙය පමණක් භාවිත කිරීමෙන් සොරකම ප්‍රහාණය කළ යුතුය.**

පංචශීලයෙහි දෙවන ශික්ෂාපදය බොහෝ දුරට අප අර්ථ ගන්වන්නේ සොරකම් කිරීමෙන් වැළකීම යන්නය. එහෙත් අදින්න + ආදාන = අදින්නාදාන වේ.

එය නිර්වචනය විය යුත්තේ නොදුන්දේ ගැනීමෙන් වැළකීමය. උදාහරණයක් දැක්වුවහොත් ඔබ ගිහිගෙයි වාසය කරන පියෙක්ය. ඔබට මුදල් අවශ්‍යතාවයක් වේ. තමා ළඟ මුදල් නැත. තම දරුවෙකු සතුව තිබෙන මුදලක් ගෙන ඔබගේ අවශ්‍යතාවය පිරිමසා ගනී.

ඔබට මෙය ගැනීම හේතුවෙන් දෙවන ශික්ෂාපදය බිඳී යයි. දරුවා ඔබට මුදල දුන්නා නොව ඔබ විසින්ම ගැනීම නුදුන් දේ ගැනීමයි. එහෙත් ඔබ තුළ වංචනික හැඟීමක් හෝ සොරා ගැනීමේ සිතුවිල්ලක් නැත. දරුවා පැමිණි පසු තමා මුදල් ගත් බව ඔබ පවසයි. එහිදී ඔබ නිවැරදි නොවේ. එබැවින් නිවන අපේක්ෂාවෙන් සසුන් බඹසර වෙසෙන උපසම්පන්න භික්ෂුවට හා භික්ෂුණියට විනය ශික්ෂා පැනවීමේදී මේ සම්බන්ධව කරුණු ගණනාවක්ම දේශනා කොට තිබේ.

තම විහාරස්ථානයට දායකයා විසින් දන්ගෙන එන්නේ භික්ෂුන් වහන්සේලා භික්ෂුණීන් වහන්සේලා උදෙසාය. එහෙත් දානය ගෙනවිත් තබා දායකයා ආපසු ගියේ නම් ඒ තිබෙන දානය වැළඳිය නොහැකිය. අවම වශයෙන් පන්සලේ සිටින කැපකරුවා විසින් හෝ පිළිගැන්විය යුතුය. නැතහොත් දායකයා භාජන පිටින්ම හෝ පිළිගැන්විය යුතුය.

භික්ෂුව මහමග වඩිනකල්හි කිසිවෙකුට මේ ගස මගේ යැයි කිව නොහැකි ගසකින් පළතුරු ගෙඩියක් වැටී තිබේ. කුසගින්න, ආහාර අවශ්‍යතාවය, කොතෙක් තිබුණද එය අහුලා වැළඳිය නොහැකිය. ඒ මන්ද යත් එය භික්ෂුවට කිසිවෙකු විසින් නොදුන් දෙයක් බැවිනි.

දැන් ඔබට ආර්ය විනයෙහි ශික්ෂා ආරක්ෂා කළයුතු ආකාරය වැටහෙයි. ඒ නිසයි පෝතලීය හට බුදුරජාණන් වහන්සේ ගෘහපතිය යන ඇමතුමින් ආමන්ත්‍රණය කළේ එසේම මෙම ශික්ෂාව බිඳීමෙන් තමා ලබන අකුසලයන් හා පාපයන් පිළිබඳව ඔබ ප්‍රඥාවෙන් බැලිය යුතුය.
අන්‍යයන් හෝ ස්වභාව ධර්මයට අයත් දෙයක් මා සතු කර ගැනීමෙන් මාගේ උතුම් වූ සීලය ශික්ෂාවන් බිඳී යයි. එසේ වීමෙන් උත්තරීතර සීල පාරමිතාව පිරිය නොහැකිය.

මේ කරුණ හේතුවෙන් මා තුළ කෙළෙස් බැඳීමක් සිදුවේ. මා විසින් ඒ කෙළෙස් බැඳීම ප්‍රහාණය කිරීම පිණිස උත්සුක වෙමි.
සොරකම හේතුවෙන් මාගේ හදවත මටම දොස් නගාවී.
එයින් මට සතර අපායෙන් එකකට යෑමට සිදුවේ.

එබැවින් මේ ශික්ෂාව කඩකිරීම සංයෝජනයක්ම වේ. එය නිවන වසාලන (නීවරණ) ධර්මතාවයකි. සොරකම හේතුවෙන් මාගේ කල්‍යාණ මිත්‍රයන් මා භාජනයෙන් ඉවත්වේ. මෙලොව වශයෙන්ම මානසික අසහනය, පීඩනය ඇතිව බොහෝ සිත් වේදනා ඇති කරයි. සොරකමින් මිදුනහුගේ සිත සන්සුන් වේ. සිසිල් වේ.

**03. සත්‍ය වචන භාවිතයෙන් බොරුකීම ප්‍රහාණය කිරීම.**

බොරුකීමෙන් වැළකී සත්‍ය වචන කථා කිරීමට ඔබට අවශ්‍ය නම් ඔබ පළමුව බොරුකීමෙන් ඔබට මෙලොව පරලොව සිදුවන හානිය පිළිබඳව ප්‍රඥාවෙන් බැලිය යුතුය.

යම් කෙළෙස් බැඳීමක් හේතුකොට ගෙන මම බොරු කියන්නේ නම් මෙළොව වශයෙන් මගේ කල්‍යාණ මිත්‍රයන් හා හැර දමාවි. සත්‍ය දහම වන ශ්‍රී සද්ධර්මය මට අවබෝධ කර ගැනීමට නොහැකි වේවි.

යම් දවසක මේ නරක ක්‍රියාව නිසා මගේම හිත මටම දොස් නගාවි.බොරුව නම් ක්ලේශය සසර දුක් වැඩිකරන නිවන දුරට යන ක්‍රියාවක් නිසා මුසාව ප්‍රහාණය කිරීමට උත්සුක වෙමි.

15 පිටුවට....

ශාස්ත්‍රවේදී වත්තේගම
කුසලධම්මා මෙහෙණින් වහන්සේ

# රෝග ව්‍යුප සමනය කිරීමට සමත් බුදුදහමේ ආනුභාව බලය

වර්තමානයෙහි දේවවරම ලාභීන් ලෙස පෙනී සිටිමින් ඔවුනට ලෙඩදුක් අපල උපද්‍රව ව්‍යුපසමනය කිරීමට විශේෂ බලයක් ඇතැයි පවසමින් ජනතාව නොමග යවමින් මිල මුදල් සූරාකෑමේ කූට ව්‍යාපාරය දියත් වී ඇති බව අප සියලු දෙනා දන්නා ප්‍රකට කරුණකි. බොහෝ දෙනා තමන්ට අසවල් අයවල් දෙවියන් ආරූඪ වී ඇති බව පවසතත් සත්‍ය ලෙසම මිනිසුන්ගේ දෙතිස් මහා කුණප කොටසින් සැදුම්ලත් පංචස්කන්ධයකට දිව්‍ය සැපසම්පත් අත්විඳින දෙවිදේවතාවුන් ආරූඪ වන්නේද යන්න සැකයට තුඩුදෙන කරුණකි. මෙහි යථාර්ථය නම් දෙවිවරුන්ගේ නාමයෙන් පහත් පෙළේ භූතාත්ම එහිදී සම්බන්ධවීමක් සිදුවෙතැයි කිවහොත් එය නිවැරදිය. ඇතැම් අවස්ථා වලදී සමහර තරුණ ස්ත්‍රීන් හා පුරුෂයින් සමාජ ආකර්ෂණය තමා වෙත ළඟා කරගැනීම උදෙසා ද හිතාමතාම මෙවැනි දෑ කරන අතර තවත් සමහරු තුළ පවතින මානසික රෝග හේතුවෙන් ද එවැනි හැසිරීම් චර්යාවල යෙදෙන බැව් පෙනේ.

අතීතයේ දී ගුප්ත ශාස්ත්‍රවලින් අපේක්ෂා කරන ලද්දේ ලෙඩරෝග සුවකර සමාජයට යහපත් සේවයක් කිරීමයි. ඒවා සැබවින්ම ශාස්ත්‍රයන් වූ අතර ඒවාට කළහැකි හා කළ නොහැකි සීමාවක් තිබුණි. මන්ත්‍ර ශාස්ත්‍ර ගැඹුරින් හැදෑරූ අය විසින් අතීතයේදී මහත්වූ වික්‍රමාන්විත ක්‍රියාකාරකම් සිදුකළ බවට ඉතිහාසයේ යම් යම් අවස්ථාවලදී අනාවරණය වී ඇත. එහෙත් වර්තමානයෙහි එවැනි ශිල්ප ශාස්ත්‍ර අභාවයට ගොස් ඇති අතර පැවතුනත් ඇත්තේ ඉතාම අතළොස්සක් දෙනෙකු ළඟ පමණකි. ඓතිහාසික තොරතුරු වලට අනුව දේවවරම් ලාභීන් අතර දුටුගැමුණු මහා රජතුමා හා මානවම්ම රජු කඳකුමරු (කතරගම දෙවිඳු) ගෙන් වරම් ලද බව කියැවේ. තවද තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් හා කුංතුණාවේ හිමිද බරණ ගණාතාචාර්යයා හා මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි ආදී ප්‍රබල චරිත කඳ කුමරුගෙන් වරම් ලද බව පැවසේ. එසේම මහා කවි කාළිදාස කාලිය ගෙන් වරම් ලද බවත් ඒ නිසා ඒ සියලුදෙනා ලොව පිළිගත් ප්‍රකට විද්වතුන් බවට පත්වූ බවද ජනශ්‍රැතියෙහි එයි.

මිනිසුන්ට වැළඳෙන ශාරීරික හා මානසික රෝග උපද්‍රව ව්‍යුපසමනය කිරීමේ කටයුතු වලදී ශ්‍රී ලාංකිකයින් වැඩිදෙනා බෞද්ධාගමිකයින් වන නිසා ඒ සඳහා බුදුදහමේ ආභාෂය ඒ සඳහා යොදාගෙන ඇත. ඒ අනුව බුද්දහමේ ප්‍රධාන විමුක්ති මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ එන සම්මා දිට්ඨිය හා සම්මා සතියෙහි හා සම්මා සතියෙහි බලය ඒ සඳහා ලැබී ඇත. සම්මා සතියෙන් පෙන්වන්නේ යහපත් සිහියෙන් යුතුව හරිහැටි යමක් කළහොත් එයින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන බවයි. අසිහියෙන් දෙවියන් ආරූඪ වනවා යැයි කියන අයගේ අදහස් සිහිනුවණින් සිටින පිරිස අසා ඒවාට නතුවන්නේ නම් එය බුදුදහම අමතක කර දැමීමත් යයි වීම නිවැරදිය. ත්‍රිවිධ රත්නයේ ආනුභාව බලය සම්බන්ධයෙන් බුදුදහමෙහි විරාගතව පැවත එන ආකල්පය වූයේ තුණුරුවන්ගේ ලෝකෝත්තර හා ආධ්‍යාත්මික ගුණ සමුදාය මෙනෙහි කිරීම යක්ෂ භූතාදීන්ගෙන් ඇතිවන හිංසාකාරී නපුරු චේතනාවන් නිෂ්ප්‍රභා කිරීමට තරම් ප්‍රමාණවත් වන බවය. බුදුරජාණන් වහන්සේ ධජග්ග සූත්‍රයේ දී ඒ ගුණ සමුදාය මෙනෙහි කිරීමට භයවීම, තැතිගැනීම්, ලොමුඩැහැගැනීම් ආදී කවරාකාරයක උවදුරක් වුවද දුරුකරගැනීමට සමත්වන බව වදාළ සේක. (ඒවං බුද්ධං සරන්තානං. ධම්මං සංඝඤ්ච භික්ඛවෝ භයංවා ජම්භිතත්තාවා න හෙස්සතිති)

භූතාවේශයන්ගෙන් හටගන්නා වූ යම් යම් අපල උපද්‍රව, ලෙඩ රෝග, තොවිල් සම්ප්‍රදායෙහි දක්නට හැකිවන අතර තුණුරුවන්ගේ ගුණ බලයෙන් ඒවා ව්‍යුප සමනය කළ හැකි බව සිංහල බෞද්ධ යාගකරුවන් පිළිගෙන ඇතිබව ඔවුන් විසින් ශාන්තිකර්ම විෂයෙහිලා තුණුරුවන්ගේ ගුණ මහිමය යොදාගැනීමෙන් සනාථ වේ. මේ නිසා තුණුරුවන්ගේ ආනුභාව බලය ලෙඩ දුක් අතුරු ආන්ත්‍රා ආදී සකලවිධ දෝෂාන්ධකාර දුරීභූත කිරීමට හැකි බලවේගයක් ය යන්න බෞද්ධයින්ගේ ප්‍රබල ආගමික දෘෂ්ටියක් බවට පත්වී ඇත.

ශාන්ති කර්ම විෂයෙහි බුදුදහමේ ආනුභාව බලයට පසුව යොදාගන්නා වූ ආගමික බලය වූයේ දෙවියන්ගේ බලයයි. ශ්‍රී ලංකාවට බුදුසමය හඳුන්වාදීමෙන් අනතුරුව විරාගතව පැවත ගෙන ආවාවූ දේශීය යාතුකර්ම වලට බුදුදහමේ ආභාෂය ලැබීමත් සමඟම එම යාතුකර්ම විධිවල ප්‍රමුඛ ස්ථානය බුදුරජාණන් වහන්සේට හිමිවිය. ඒනිසා රෝග උපද්‍රව නිවාරණය කිරීමට දෙවියන්ගේ බලය යොදා ගන්නා ලද්දේ බුදුරජාණන් වහන්සේගේ බලයට යටත්කොටය .



දෙවිවරු යනු විශ්වයේ ශුද්ධවන්ත තත්වයක සිටින බලවේග නිසා ඔවුන් යාග හෝම පුද පූජා පැවැත්වෙන යාග භූමියට වැඩමවා ගැනීමට සිතූ යකැදුරෝ යාග භූමිය ශුද්ධවන්ත තත්වයට ගැලපෙන ආකාරයකට සකස් කිරීමට කටයුතු කළහ. ඒ අනුව බෞද්ධ යකැදුරෝ දෙවියන් සම්බන්ධ කංකාරිවලදී සුදුපිරුවට වලින් සැරසීමෙන් හා පේවී ඉස් සෝදා නා පේවීමෙන් යුක්තව වත් පිළිවෙත් කිරීමට කටයුතු කරති. සුවඳ දුම් ගැල්වීමෙන් හා මල් පහන් පිදීමෙන් කහ දියර ඉසීමෙන් යාග භූමිය පවිත්‍රත්වයට පත් කරන ලදී. මෙවැනි චාරිත්‍ර විධි අකුගමනය කිරීමේ අභිලාෂය වන්නේ රෝග නිවාරණ ක්‍රියාවලියේදී දෙවියන්ට නිසි පුද සත්කාර සැලකිළි දැක්වීම කරන කොටගෙන දෙවියන් සමඟ අන්තර් සම්බන්ධයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය වූ ආගමික හා අභිචාර පසුබිම යාග භූමිය තුළ මවා පා එම ස්ථානය දෙවියන්ට පැමිණීමට සුදුසු ස්ථානයක් බවට පත්කර ගැනීමයි. අනෙක් අතට අශුද්ධවන්තයින් වන යක්ෂ භූතාදීන්ට මස් මාංශ පුළුටු ආදී අපිරිසිදු ද යාග භූමියෙහි තනා ඇති පිදේනි තටු ආදිය මල්යහන් තනා ඇති සීමාවෙන් පිටත හෙවත් දුරස්ථ කොට තැබීමක් කරන්නේ ද ඒ නිසා වනැයි සිතිය හැක.

සූත්‍ර පිටකයේ යම් යම් සූත්‍ර දේශනා වලදී දෙවිවරු නොයෙක් අවස්ථා වලදී අදෘෂ්‍යමාන රූප කායකින් බුදුරජාණන් වහන්සේ බැහැදකීමට පැමිණි බව සඳහන් වේ. උදාහරණ වශයෙන් සතරවරම් දෙවිවරුන් (විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ, ධෘතරාෂ්ඨ) බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණීම හා ඔවුන් හා බුදුරජාණන් වහන්සේ අතර ආටානාටිය සූත්‍ර දේශනාව පිළිබඳ සංවාදයත් ඇති වූ බව සඳහන් වේ. ඒ අනුව බුදුරජාණන් වහන්සේ ගිජ්ජකූඨ පර්වතයෙහි වැඩවාසය කරන සමයක සතරවරම් දෙවිවරු යක්ෂ, නාග, කුම්භාණ්ඩ ආදීන්ගෙන් සැදුම්ලත් මහා සේනාවක් පිරිවරාගෙන උන්වහන්සේ හමුවීමට පැමිණ ඇත. එසේ පැමිණ වන සෙනසුන්වල බණ භාවනා කරන භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව සඳහා උන්වහන්සේලාට ආටානාටිය සූත්‍රය පුරුදු කරවන ලෙස ඉල්ලා සිට බුදුරජාණන් වහන්සේගෙන් සමුගෙන ඒ ස්ථානයේදීම අතුරුදහන් වී ඇත. එසේම බුදුරජාණන් වහන්සේ කපිල වස්තු පුර මහා වනාන්තරයෙහි පන්සියක් භික්ෂූන් වහන්සේලා සමඟ වැඩවාසය කරන සමයේ දස දහසක් සක්වල සිටින දෙවිබඹුන් උන්වහන්සේ බැහැදකීමට පැමිණි බව මහාසමය සූත්‍රයේ සඳහන් වේ.

දස දහසක් සක්වල සිටින දෙවිබඹුන් පිරිත් හා ධර්මදේශනා පැවැත්වෙන ස්ථානවලට පැමිණෙතැයි යන විශ්වාසය බෞද්ධ සම්ප්‍රදායෙහි හැඩගැසී අවුත් ඇත්තේ මේ නිසා වියහැක. ඒ අනුව වර්තමානයෙහි ද පිරිත් හා බණ දේශනා ආරම්භ කරන අවස්ථාවෙහි (සමන්තා චක්කවාලේසු අත්‍රා ගච්ඡන්තු දේවතා) යනුවෙන් දෙවිදේවතාවුන්ට ආරාධනා කිරීම බෞද්ධ සම්ප්‍රදායක් බවට පත්වී ඇතිබව පෙනේ.

ඉහතින් සඳහන් කළ ආකාරයට දෙවිදේවතාවුන් යාග භූමියෙහි ඇති මල් යහන් වලට පැමිණීමත් සිදුනොවන අතර සත්‍ය ලෙසම සිදුවන්නේ දේව දිෂ්ටිය හෙළිමක් පමණකි. වැටීමයි. මේ අනුව දෙවි


**06 පිටුවෙන්...**


**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ ඩී.එම්.එච්. කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළකෙරේ.**

05 පිටුවෙන්...

දිෂ්ටි යනු බැල්ම වැටීමයි. මේ අනුව දෙවි දේවතාවුන්ට යාගභූමියෙහි තනා ඇති මල්යහන්වලට වඩින ලෙස කෝල්මුර කවි ගායනා කොට ආරාධනා කරන විට ඒවාහි පුදා පිණිස තබා ඇති සුවඳ දුම්, මල්, පහන්, සඳුන්, කපුරු, පළතුරු ආදී පුෂ්ප ද්‍රව්‍ය වෙත ඔවුන්ගේ ඇල්ම බැල්ම බලපාන බව පෙනේ. මේ පිළිබඳව සිය අදහස් දක්වන මහාචාර්ය ගණනාත ඔබේසේකර මහතා විසින් ඔහුගේ පත්තිනි දේව සංකල්පය නැමැති ග්‍රන්ථයේ දක්වා ඇති සඳහන විමසීමට භාජනය කිරීම වටී. එහි දෙවියන්ගේ හරය සහිත දිෂ්ටිය හින්දු හා බෞද්ධ පෙති පිළිම වන්දනාවේ මනාකොට ගැබ්ව තිබේ. හින්දු හා බෞද්ධ ප්‍රතිමාවක් සජීවී බවට පත්වන්නේ මහත් වූ තහංචි, සිරිත් විරිත් මධ්‍යයේ උත්සවාකාරයෙන් පවත්වනු ලබන නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය කිරීමේ චාරිත්‍රයෙන් පසුවයි. හින්දු දේවාලවල තබා ඇති දේවාභරණ වලින් හා ආයුධ වලින් ගම්‍යමාන වන්නේ දේව දිෂ්ටිය හා දෙවියන්ගේ බලය ඒවායින් නියෝජනය වන බවයි. එසේම ගම්මඩු වැනි ශාන්ති කර්ම වලදී පත්තිනි දෙවිඳුන්ගේ සලඹ (හලං) නැටුම්, ගැයුම් සහිතව ගෙනවුත් යාගමඩුවේ දේව තොරණේ තනා ඇති පූජාසනය මත තැන්පත් කිරීමෙන්ද පෙන්නුම් කෙරෙන්නේ එම භාණ්ඩ මත දෙවියන්ගේ දිෂ්ටිය පතිතවන බවයි යනුවෙන් දක්වා ඇත.

ඇතැම් ශාන්ති කර්ම වලදී යකැදුරන් විසින් බුදුරදුන්ගෙන් වරම් ගැනීමක් ගැන සඳහන් කරති. මෙම වරම් ගැනීම යනු බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලබාගැනීම යයි කල්පනා කළහොත් එයින් දේව මණ්ඩලය බුදුරජාණන් වහන්සේගෙන් වරම් ගැනීමට සැළැස්වීම මගින් පැහැදිළි වන්නේ. දෙවිවරුන්ගේ බලය බුදුන් වහන්සේගේ බලයට යටත් කොට බුදුරජාණන් වහන්සේගේ අණට අනුව ක්‍රියා කිරීමයි. මේ ආකාරයට දෙවිවරුන් බුදුන් වහන්සේගෙන් වරම් (අවසර) ගනිත් නම් ඔවුන්ගේ නායකයා විය යුත්තේ බුදුරජාණන් වහන්සේ බව සිතිය හැක. මෙසේ අපල උපද්‍රව රෝග නිවාරණය කිරිමේ යාග හා ශන්ති කරම වලදී යකැදුරෝ බුද්ධ බලය හා දේව බලය යොදා ගැනිමෙන් පැහැදිළි වන්නේ ඔවුන් ගැඹුරු ආගමික හා අභිචාර දෘෂ්ටියකින් එම කටයුතුවල නියුක්ත වන බවයි.

මුල් බුදුසමයෙන් රෝග නිවාරණය කිරීමට හෝ අමනුෂ්‍ය දෝෂ උපද්‍රව වලින් අත් මිදීමට යන්ත්‍ර මන්ත්‍ර වැනි අභිචාර විධි භාවිතා කිරීම ප්‍රතික්ෂේප කර ඇත. බුදුරජාණන් වහන්සේ විනය පිටකයේ එන භෙසජ්ජ - කඛන්ධක හි භික්ෂූන්ට ලෙඩ රෝග වලින් අත්මිදීම පිණිස ඖෂධ වර්ග නියම කළ බවක් මිස යන්ත්‍ර මන්ත්‍ර ආදිය කිරීමට නියම කළ බවට කිසිදු තොරතුරක් මුල් බෞද්ධ ග්‍රන්ථවල සඳහන් නොවේ. එසේ වුවද ශ්‍රී ලාංකික පොදු ජනයාගේ ලෞකික හා ලෝකෝත්තර අවශ්‍යතා සපුරාලීමේ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් වශයෙන් ඔවුන්ට තමන්ට රිසි අභිචාර විධි භාවිතා කිරීමට බුදුසමයෙන් අනුමැතිය ලැබී ඇති බව ඉතා සුවිශේෂී වූ බෞද්ධ ශාන්ති කර්මයක් වන පිරිත් සජ්ඣායනාවෙන් අනාවරණය වේ.

බලිතොවිල් ආදී ශාන්ති කර්ම වලදී යකැදුරන් විසින් පිරිත් සජ්ඣායනාව යොදා ගන්නා අවස්ථා දැකිය හැක. එහි මන්ත්‍ර යනුවෙන් දක්වෙන්නේ විශ්වයේ ඇති අධිභෞතික බලවේගයන්ට ආමන්ත්‍රණය කිරීම සඳහා පැරණි ගුප්ත විද්‍යාධරයින් විසින් නිපදවා ගන්නා ලද ගුප්ත විද්‍යාත්මක ගුරුකම්ය. මේ සඳහා ඔවුහු අක්ෂර වල හා වචන වල බලය යොදා ගත්හ. මන්ත්‍ර සැදීමේදී ඒවායේ මුලට යොදාගන්නේ (ඕම් - ඕං) යන අක්ෂරයෙන් විෂ්ණු, ශිව, බ්‍රහ්ම යන දෙවිවරු ගම්‍ය වන බවත් මෙම ත්‍රි මූර්තියට වැඳ නමස්කාර කොට එකී බලය උපයෝගී කරගෙන අධිහෙ?තික බලවේගයන්ට ආමන්ත්‍රණය කොට එමගින් තම අපේක්ෂාවන් ඉටුකරගත හැකිබව හින්දු භක්තිකයෝ තරයේ විශ්වාස කරති.

මේ අනුව ඉහතින් දක්වූ ආකාරයට දේව සංකල්පය ඔස්සේ ආරම්භ වූ යන්ත්‍ර මන්ත්‍ර විධි මුල් වකවානුවේදී ශාන්තිකර්ම වලට යොදාගත් අතර පශ්චාත් කාලීන වශයෙන් බෞද්ධ සංකල්ප මත හැඩ ගැසී එන්නට විය. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ ඇතුලු ත්‍රිවිධ රත්නයේ ආනුභාව බලය යොදා ගන්නා ලදී. වෙනත් ලෙසකින් දක්වතොත් පිරිත් ශාන්ති කර්මය යොදා ගන්නා ලද බව පෙනී යයි. විශේෂයෙන් රතන සූත්‍රය හා ආටානාටිය සූත්‍රය ආදී සූත්‍ර සජ්ඣායනා කිරිමෙන් ලෙඩරෝග ව්‍යුපසමනය වී ශාන්තිය උදාවන බැව් බුදුදහමෙහි කියැවෙන හෙයින් බෞද්ධ මන්ත්‍රකරුවන් යන්ත්‍ර මන්ත්‍ර සකස් කිරීමේදී පිරිත් සංකල්පය

සාමාවතී, ඛුජ්ජුත්තරා සහ මාගන්ධියා චරිත ඇසුරිනි

# රුදුරු දිවිමඟ සොඳුරු කරවන අමා දම් දිව ඔසු

පසුගිය කලාපයෙන්....

**පින් පව් කෙරුවොත්, සැක නැත නිසි සේ පින් පව් එනවා අප පසුපස් සේ**

**කාලයෙන් කාලයට වෙළඳ ලෝකයේ ඔබ මුලාකරන මුලාවකට රැවටී සැප, සුන්දරත්වය, ලෞකික දියුණුව, පුහු අහංකාරය ඉවතලා සත්‍යටම මුහුණ දී සිදුකල හැකි කළ හැකි සියලු පිං කුසල් සිදුකොට අපගේ ජීවිත දහමින් මෙන්ම සෞභාග්‍යයෙන් ආලෝකවත් කර ගනිමු.**

තමා කළ පින කිසිවෙකුටත් කිසිම හේතුවකින් නවතාලිය නොහැක. සෝෂක සිටු මැඳුරේ මහා සම්පත් විදිමින් හැදෙන වැඩෙන මේ රූමත් ප්‍රඥාවන්ත කුමරිය ගැන දැනගන්නට ලැබුණ උදේන රජතුමා ඈ රජමැදුරට ගෙන්වා කුමරියන් පන්සියයක් පිරිවර කොට අග මෙහෙසුන් කළාය.

මෙසේ රාජ අග්‍රමහේෂිකාවක් වීමට, රූප සම්පත් ලැබිමට, ප්‍රඥාවෙන් යුක්ත වීමට, නිරෝගි බව ලැබිමට රාජ යස ඉසුරු ලැබීමට ඈ සිදුකළ දේ මොනවාද?

බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා උදෙසා ඉතා ශ්‍රේෂ්ඨ ආකාරයෙන් අග්‍රකොට දානාමානාදිය, සිවුරු පිරිකර, බේත් හේත් පූජා කිරීමටත් රෝගීන්ට උපස්ථාන කිරීමටත් ගරු කළ යුත්තන්ට ගරු කිරීමටත් මව්පියන්ට සුවච කීකරු වීමත්ය.

එහෙත් වත්මන් යුගයේ රැල්ලට ගසාගෙන යන ඔබ ඔබට නැති රූප සම්පත ලබාගැනීම සඳහා විවිධ උපක්‍රම, ආලේපන, ඖෂධ සෙවීමට වෙහෙසෙති. තමාට ගැලපෙන, නොගැලපෙන විවිධ ඇඳුම්, පැළඳුම් සෙවීමට අධික ලෙස මුදල් සොයති. ඒ සඳහා වෙහෙසෙති. මේ සෙවීම පිළිබඳ ඔබේ සිතට සහනයක් නැත. නැවත නැවත තව තවත් දේවල් සොයති. ඒ සඳහා වෙහෙසෙති. මේ සෙවීම පිළිබඳ ඔබේ සිතට සහනයක් නැත. නැවත නැවත තව තවත් දේවල් සොයති. මෙහි කෙළවර වන්නේ විවිධ රෝග පීඩාවන්ට ගෝචර වී මරණයට පත්වීම පමණි. ඒ හිස් මරණයෙන් පසු නැවත ඔබට යහපත් මනුෂ්‍ය ජීවිතයක් නැත. මනුෂ්‍ය ජීවිතයක් ලැබුණත් රුව,ඥාන,ගුණ ලැබීමට ඔබ කළ පුණ්‍ය කර්මයක් නැත. එමනිසා ඔබට අවශ්‍ය කරන ලෞකික ලෝකෝත්තර සම්පත් ලබාගැනීම පිණිස උසස් මනසක් ඇති මිනිසුනි ඔබේ ප්‍රඥාව පුබුදුවා කළ යුතු යහපත් දේ සිදු කිරීමට වහා උත්සුක වන්න. නැතහොත් සිදුවන්නේ කුමක්දැයි සමාවතී චරිතයෙන්ම අවබෝධ කරගන්න.



මෙසේ උදේන රජුගේ අගමෙහෙසුන්ව රජුගේ සිත් දිනාගනිමින් රාජ සම්පත් විදිමින් ගත කළ සාමාවතී ඇතුළු මේ බිසෝවරු පන්සිය එක් දෙනාට සසරෙහි කර තිබූ තවත් පුණ්‍යකර්මයක් විපාකදීමේ කාලය එළඹිණි. එනම් ලොව්තුරු අමා දහම පානය කොට මාර්ගඵල ලැබීමයි.

සාමාවතී ඇතුළු පිරිසට මල් ගෙනවිත් දීම ආදී මෙහෙකිරීමට ඛුජ්ජුත්තරා නම් දාසියක් විය. ඈ දිනපතා සුමන මාලාකරුගේ නිවසට ගොස් බිසෝවරුන්ට පැළදීමට මල් ගෙනෙන්නීය. මෙම දාසිය උපතින්ම කුදුවූ කාන්තාවකි. දාසියකි. ඇගේ නම උත්තරාය. කුදුබැවින් ඈ හැඳින්වූයේ ඛුජ්ජුත්තරා නමිනි. මහා පුණ්‍යකර්මයක හේතුවෙන් ඈ මිනිසත් භවයක් ලැබුවද කුදු වීමට හා මෙහෙකාරියක් වීමට තරම් අවාසනාවන්තද විය. කළකම් පලදේමය. සිටුකුමාරියක්ව සිටි ආත්මයක ඈ භික්ෂු භික්ෂූණීන් ලගින් ඇසුරු කළාය. ධර්මයද ඇසුවාය. දන් පැන් ද පිදුවාය. සීලයද රක්ෂා කළාය. සුචරිතයෙහි යෙදුනාය. දිනක් සුවිශේෂී උත්සවයකට යෑමට සූදානම් වෙමින් ඈ සිටින විට කුළුපගව ඇසුරු කළ රහත් මෙහෙණින් වහන්සේ නමක් ඇගේ නිවසට වැඩම කළාය. ගමන යෑමට හදිසියෙන් සිටි ඇයට යම් ආභරණයක් ළඟට ගැනීමට අවශ්‍ය විය. ළඟ කිසිවෙකුත් නැති බැවින් එය ගෙනත් දෙනමෙන් රහත් මෙහෙණින් වහන්සේට දැන්වීය. එම මොහොතේ එය සිදුනොකළොත් කුමරිය අමනාප සිත් ඇති කරගෙන අපාගත වන බවත් එය කළොත් දාසියක් වන බවත් දත් තෙරණින් වහන්සේ අපාගතවීමට වඩා දාසියක් වීම යහපත් බැවින් එම ආභරණය ගෙනවිත් දුන්නාය. මෙහි අකුසල කර්ම හේතුවෙන් ඈ සාමාවතී ඇතුළු පිරිසට දාසියක් විය.

මේ තැනැත්තියම එක් භවයක රාජ කුමාරිකාවක්වී සිට රජගෙට වැඩමකොට වදාළ පසේබුදුවරුන් වහන්සේලාට දන්පූජා කළ අතර මහළුව කුදුගැසුන පසේබුදුරජාණන් වහන්සේ නමක් දැක උන්වහන්සේ වඩින විලාෂය කුදුගැසී පෙන්වීමේ විපාකයෙන් කුදුගැසී උපන්නාය.

මෙසේ කුදුවීගිය උත්තරා දාසිය දිනක් මල්ගෙන ඒමට සුමනමාලාකරුගේ නිවසට යන විට එහි බුදුපාමොක් මහසඟනට දනක් පිළියෙල වෙමින් තිබුණි. එය මහත් භාග්‍යවන්ත අවස්ථාවක් බව දැනුන ඛුජ්ජුත්තරාවෝද දානයට සහභාගීවී අවසානයෙහි දෙසූ ධර්මය මැනවින් ශ්‍රවණය කළාය. 'කසළගොඩේ තිබුණත් මැණික මැණිකක්මය' පෙර අකුසල හේතුවෙන් දාසිකම් කළද, ශරීරයේ අඩුපාඩුකම් ඇතද පෙර බුදු, පසේබුදු මහරහතන්වහන්සේලාට සකසා

09 පිටුවෙන්...

පූජ්‍ය වත්තේගම කුසලධම්මා මෙහෙණින් වහන්සේ



# කඨින චීවර පූජා මහෝත්සවය

සිංහල බෞද්ධ ජනතාව මහත් ශ්‍රද්ධා භක්තියකින් පවත්වනු ලබන උත්සවයක් වන්නේ කඨින චීවර පූජා කිරීමේ දානමය පුණ්‍ය ක්‍රියාවයි. වප් මස අවපෑලවිය දිනයේ පටන් ඉල් මස පුර පසළොස්වක දිනය දක්වා ඇති කාලය කඨිනය දියහැකි කාල වකවානුව ලෙස දක්වා ඇත.

භික්ෂූන් වහන්සේලාගේ වස් විසීම පිළිබඳව කරුණු විමසීමේ දී ඒ සඳහා විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව වඩාත් පිළිගැනීමට භාජනය වී ඇති විස්තරයක් බුද්ධ චරිතය ඇසුරින් ලැබේ.

බුදුරජාණන් වහන්සේ බැරණෑස මිගදායේ දී දේශනා කරන ලද පළමු ධර්ම දේශනාවෙන් පසු (දම්සක් පැවතුම් සූත්‍රය) පස්වග මහණුන් යසකුල පුත්‍රයා සහ ඔහුගේ යහළුවන් පනස් හතර දෙනා සමඟ භික්ෂූ පිරිස හැට නමක් විය. බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ ආකාරයට අනුව (චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්තාව හිතාය සුඛාය දේව මනුස්සානං) මෙම රහතන් වහන්සේලා සැටනම (60) ගම් නියම් ගම් සැරිසරමින් දහම් දේශනා කිරීම ආරම්භ කළහ. බුදුරජාණන් වහන්සේට සමකාලීනව භාරතයේ විසූ පරම අවිහිංසාවාදය ඉදිරිපත් කළ ෂඩ් ශාස්තෘන් අතර මහාවීර නමින් හැඳින්වූ නිඝණ්ඨනාථපුත්ත මෙහිදී යම් යම් චෝදනා මෙම රහතන් වහන්සේලා වෙත එල්ල කරන ලදී. ඔහු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ගෝලයින් නිල් තණ පයින් පාගමින් කෘමින් පණුවන් පාගා මරා දමමින් මේ කරන්නේ මොන තරම් අපරාධයක් දැයි දොස් නගන ලදී.

මෙයින් නව ආගමික දර්ශනයක් වූ බුදු දහමට කැළලක් ඇතිවේ යැයි අවබෝධ කරගත් බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා උදෙසා වර්ෂාව පවතින කාලයේ වස් සමාදන් වීම අනුදැන වදාළ බවත් මේ අනුව බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම වස් විසීම සඳහා කරවන ලද විහාරය මූලගන්ධකුටි විහාරය ලෙස හැඳින්වූ බවත් බෞද්ධ සාහිත්‍යය ග්‍රන්ථවල සඳහන් වේ. එවක් පටන් වස් විසීමේ චාරිත්‍රය භික්ෂූන් වහන්සේලා තුළ ප්‍රචලිත වන්නට ඇතැයි සිතිය හැක.

ඒ ඒ විහාරස්ථාන මූලික කරගෙන වස් වසන භික්ෂූන් වහන්සේලාට එකී තුන් මසක කාලය තුළ සිව්පසයෙන් ඇප උපස්ථාන කිරීම සතර පේරුවේ දායකයින්ගේ විශේෂ යුතුකමක් හා පුණ්‍ය කටයුත්තක් වෙයි.

> **ලංකා ඉතිහාසයේ තෙවැනි මොග්ගල්ලාන රජු [612-18] ලක්දිව සියලු විහාරස්ථානවලට කඨින චීවර පූජා කළ අතර දෙවැනි පරාක්‍රමබාහු රජු කඨින චීවර 80ක් මහා සංඝයා වහන්සේලාට පූජා කළ උත්සවයක් දඹදෙණියේ සංවිධානය කළ බව වංශකථාවල සඳහන් වේ.**

වස් වසා වැඩ වාසය කරන තුන් මාසයක කාලය තුළ දානාදී පින්කම් හා ධර්මදේශනා නොකඩවා පැවැත්වෙන් විහාරස්ථාන වලට සැදැහැවතුන් විශාල ප්‍රමාණයෙන් පැමිණ ඒ කටයුතුවල යෙදෙති.

ලංකා ඉතිහාසයේ තෙවැනි මොග්ගල්ලාන රජු (612 - 18) ලක්දිව සියළු විහාරස්ථාන වලට කඨින චීවර පූජා කළ අතර දෙවැනි පරාක්‍රමබාහු රජු කඨින චීවර 80ක් මහා සංඝයා වහන්සේලාට පූජා කළ උත්සවයක් දඹදෙණියේ සංවිධානය කළ බව වංශකථාවල සඳහන් වේ.

කඨින පූජාව සිදුකරන ආකාරය අන් සියලු පූජාවන්ට වඩා වෙනස් ක්‍රමයට සිදුකරනු ලැබේ. බුද්ධාගමට අයත් විවිධ ආගමික සිරිත් මේ හා බැඳී පවතින බව පෙනේ. ඇසළ මාසයේ අවපෑළවිය දිනයෙහි ඉහත දැක්වූ ආකාරයට පෙර වස් එළඹ වප් මස පුර පසළොස්වක් පොහෝ දිනයෙහි වස් පවාරණය කළා වූ භික්ෂූන් වහන්සේලා ඇති විහාරස්ථානයක චීවර මාසය තුළදී තුන් සිවුරෙන් එක් සිවුරකට අවශ්‍ය ප්‍රමාණයට අලුත් වස්ත්‍රයක් සිවුරු කිරීමට වුවමනා කරන ඉදිකටු නූල් පඬු ආදී උපකරණත් සමඟ සිවුරු කරන භික්ෂූන් වහන්සේලාට ආහාර පානාදියත් ගෙන ගොස් හිමිදිරි උදෑසන සංඝයාට පූජාකළ යුතුවේ. උදෑසන පූජා කළ යුතු වන්නේ ඒ වස්ත්‍රයෙන් එදිනම සිවුරක් කර ගතයුතු බැවිනි.

මෙසේ එකම දිනයක් තුළ පඬු පොවා වේලා ගන්නා ලද සිවුරක් පොරවාගෙන යම් නායක ස්වාමීන් වහන්සේ නමක් විසින් ධර්ම දේශනාවක් පැවැත්වීම එදින සිදුකරනු ලබන විශේෂ චාරිත්‍රයකි. ඉන් අනතුරුව දානමය පුණ්‍ය කර්මය සිදුකෙරේ.

කාලාතුරකින් සිදුකිරීමට ලැබෙන මෙම කඨින චීවර පූජාව මහත් හරසරින් හා ශ්‍රද්ධාවකින් සිදුකිරීමට බෞද්ධ ජනතාව පෙළඹී සිටිති. කඨින චීවර පූජාවට තවත් පරිස්කාර (පිරිකර) වශයෙන් සිවුරු, ආහාර පාන, බෙහෙත් වර්ග, ඇඳ පුටු, මේස ආදී දැව භාණ්ඩ, ඇඳ ඇතිරිලි, කොට්ට මෙට්ට ද, පිඟන් කෝප්ප, හැළි වළං, කැති පොරෝ, පිහියා උදළු ආදී යකඩ භාණ්ඩ ද ඉඳල්, මුසුන්, වට්ටි පෙට්ටි, පෙරහන්කඩ ආදී භික්ෂූන් වහන්සේලාට ප්‍රයෝජනවත් නොයෙක් දෑ එක්කාසු කොට පූජා කිරීම චාරිත්‍රයක්ව පවතී.

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂක ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කරන ලදි**

# වයසට ගිය පමණින් දැහැමි තෙර නමක් නොවේ

**ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බුද්ධ ශාසනය තුළ භික්‍ෂු භික්‍ෂුණී, උපාසක උපාසිකා වශයෙන් සිව්වනක් පිරිසක් සිටිති. ඔවුන්ට යා යුතු ගමන් මාවතක්ද ඇත.**

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ප්‍රඥාවන්තයින් උදෙසාය. මෝඩයින්ට ධර්මයෙන් පලක් නැත. එබැවින් සිව්වනක් පිරිස අතරින් භික්‍ෂු භික්‍ෂුණීන් නිතරම ධර්ම ගවේෂී විය යුතුය. හිස් මහල්ලෙක් වී ජීවිතය අවසන් කිරීම ප්‍රඥාගෝචර නොවේ. එම හේතුවෙන් බුදු සසුනේ ථෙර නමක් වීමට අවශ්‍ය ගමන් මාවත හැදෑරීමත්, එය ප්‍රගුණ කිරීමත් භික්‍ෂූන් වහන්සේලා සිදු කළ යුතුව ඇත.

ඒ බව බුදුරජාණන් වහන්සේ ධම්ම පදයේ ගාථා ධර්මයන් තුළින් දේශනා කොට ඇත. අද බොහෝ දෙනෙක් බුදු සසුන යැපීමේ ක්‍රම වේදයක් කොට ගෙවල් දොරවල් ඉදිකොට සියලු සැප විද කෙසේ හෝ (ස්වමතයට අනුව හෝ දුර්වල භික්‍ෂුවකගේ ආධාරයෙන් හෝ) චීවරයක් දවටාගෙන ලාභ ප්‍රයෝජන ඔස්සේ හිස් මහල්ලෝ වශයෙන් බුදුසසුන තුළ සැරි සරති. එවැනි පිරිස් බුද්ධ කාලයෙහි ද සිටියහ. බුදුරජාණන් වහන්සේ පිරිනිවීමෙන් පසු සුභද්‍ර භික්‍ෂුවගේ අභද්‍ර වචනය එයට කදිම උදාහරණයකි.

එවැනි පිරිස් උදෙසා බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කොට ඇත්තේ මොසපිණ්ණා හිස් මහල්ලා යනුවෙනි. ඒ අනුව අද වුවද බුදු සසුන තුළ කිසිදු ධර්ම ඥානයක් නැති හික්මීමක්, විනයක්, වැඩිහිටි ගෞරවයක් නැති නිකම්ම වයසට ගොස් හිස පැසී සිටින භික්‍ෂුහු සිටිති. ඔවුන් තුළින් බුදු සසුනට වන සේවයට වඩා විනාශයේ ප්‍රවණතාවය වැඩිය. භික්‍ෂුවකගෙන් විය යුතු සේවාව දූන හඳුනාගෙන බුදු සසුනටත් දායක පින්වතුන්ටත් සමස්ථ ජනතාවටත් යුතුකම් ඉටු කළ යුතුය.

ඒ අනුව,

- පවින් වැළැක්වීම
- සුචරිතයෙහි පිහිටුවීම
- යහපත් සිතින් අනුකම්පා කොට අනුශාසනා කිරීම
- නොඇසූ ධර්මය අසන්නට සැලැස්වීම
- ඇසූ ධර්මය පිරිසිදු කිරීම
- නිවන් මඟ පසක් කිරීම

යන කරුණු හය භික්‍ෂුවකට අයිති කොටස්ය. නිකම්ම වයසට ගිය භික්‍ෂුවක් විසින් සැදැහැවතුන් උදෙසා ඉහත කරුණු වලින් සේවාවක් සිදු වනවාද යන්න වගකිවයුතු භික්‍ෂූන් වහන්සේලා සොයා බැලිය යුතු කාලය පැමිණ ඇත.

ඊට අමතරව ඔවුන්ගේ අභ්‍යන්තරයේ ආධ්‍යාත්මික ගුණ වර්ධනයක් ඇත්ද සැහැදූවතුන්ගේ පැහැදීම වඩවන අයුරින් හික්මීමක් ඇත්ද යන්න පිළිබඳව ද අවධානය යොමු කිරීම ද ඉතා වැදගත් වේ.

**යම්හි සච්චං ච ධම්මොච**
**අහිංසා සඤ්ඤමො දමො**
**සවේ වන්තමාලො ධීරො**
**ථෙරො ඉති පවුච්චති**

යමෙක් හිස කෙස් පැසුණු පමණෙකින් ස්ථවිර නම් නොවෙයි. ඔහුගේ වයස මුහුකුරා ගියා පමණෙකි. ස්ථවිර බව ඇති කරන සීලාදී ධර්ම ඔහු තුළ නැති හෙයින් ඔහුට හිස් මහල්ලා යයි කියනු ලැබේ.

ඉහත ගාථා ධර්මයට අනුව ප්‍රගුණ කළ යුතු කරුණු සමූහයක් පිළිබඳ අවධානය යොමු කොට ඇත. එම උතුම් ධර්ම කරුණු නිකන්ම වයසට ගොස් පැවිද්ද තමන්ට ලාභ සත්කාරයක් කර ගත්තා වූ මහණන්නට වැදගත් නොවනු ඇත. චීවරයක් දාගත් පමණින් භික්‍ෂුවක් නොවේ. ගිහි පිංවතුන් සැබෑ තත්වය නොදන්නා බැවින් වන්දනාමාන, ගරු සත්කාර කරන්නා සේම සිව්පසයෙන් ද සංග්‍රහ කරති. වයසින් අඩු නමුදු වස් වලින් වැඩි භික්‍ෂූන් ද වැඩිහිටි එවැනි භික්‍ෂූන් උදෙසා වන්දනාමාන කරති.

එවැනි අවස්ථාවලදී වුවද හිස් මහල්ලන් වැනි භික්‍ෂූන් මුනිවත රකිමින් තුෂ්නිම්භූත ව එම ගරු සත්කාර ලබමින් තව තවත් පව් පුරවා ගනිති. ඒ අනුව ථෙර නමක් වීමට නම් ඉහත ගාථාවට අනුව එම කරුණු පිළිබඳ අවධානය යොමුකිරීම ඉතා වැදගත් වනු ඇත. ඒ අනුව,



**මිනිසා යනු උසස් මනසක් ඇති, දුර්ලභ ව ලැබූ ආත්මයක් රැගෙන සිටින්නෙකි. එවැන්නෙකුට කළයුතු, නොකළ යුතු දේ මනාව පැහැදිළිය. යුතුකම්, වගකීම් පිළිබඳ අවබෝධයක් ඇත. පිං පව්, මෙලෝ පරලෝ, තුණුරුවන් පිළිබඳ විශ්වාස කිරිමේ ඤාණ ශක්තියක්ද ඇත. එබැවින් පිරුණු කලයක් සේ සුවඳවත් මලක් සේ අරටුවක් ඇති ගසක් සේ ජීවිතය ලස්සන කරගත යුතුය.**

- **සච්චං**
(දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග යන සිවු සස් දහම)

- **ධම්මො**
(සතර මඟ - සතර ඵල හා නිවන යන නව ලොව්තුරා දහම)

- **අහිසංසා**
(මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා නම් වූ සතර බඹ විහරණ)

- **සඤ්ඤමෝ**
(කය, වචනය, දෙදොර හික්මවීමය)

- **දමො**
(පසිදුරන්ගේ මනා හික්මීමය)

- **වනතමලො**
(රහත් මඟ නැමැති මුවින් සියලු කෙලෙස් වමාරා දැමීම)

ඉහත කරුණු ඇති භික්‍ෂුව ධීරො නමින් නුවණැති යන අදහස ගෙන දෙන්නක් ලෙසද ඒ නුවණැති ශ්‍රමණයාට ස්ථවිර යයි කීම සුදුසු බවද බුදුරදුන් එම ගාථා ධර්මයෙන් දේශනා කොට ඇත.

ඉහත ගාථා ධර්මය භික්‍ෂූන් ගැන දේශනයක් වුවද එය ගිහි සැදැහැවතුනට ද ඉතා වැදගත් වේ. මිනිසෙක් වශයෙන් ලෝකෙට ඉපදුනාට පසු නිකම්ම නිකම් හිස් ජීවිතයක් ගතකොට මිය පරලොව යෑම මිනිස් කමට නිගාවකි. නොගැලපෙන්නකි.

මිනිසා යනු උසස් මනසක් ඇති, දුර්ලභ ව ලැබූ ආත්මයක් රැගෙන සිටින්නෙකි. එවැන්නෙකුට කළයුතු, නොකළ යුතු දේ මනාව පැහැදිළිය. යුතුකම්, වගකීම් පිළිබඳ අවබෝධයක් ඇත.

පිං පව්, මෙලෝ පරලෝ, තුණුරුවන් පිළිබඳ විශ්වාස කිරිමේ ඤාණ ශක්තියක්ද ඇත. එබැවින් පිරුණු කලයක් සේ සුවදවත් මලක් සේ අරටුවක් ඇති ගසක් සේ ජීවිතය ලස්සන කරගත යුතුය.

ඒ සඳහා ධර්මය පහුරක් කරගත යුතුය. උතුම් ධර්මයෙන් තොර අපට කිසි දෙයක් සිතා ගැනීමටවත් අපහසුය. ජීවත්විය යුත්තේ ධර්මය සමඟය. වයසට යා යුත්තේ ධර්මයත් සමඟය.

ධර්මයට පිටුපාන කෙනෙක් හිස් මිනිසෙක් වශයෙන් වයසට යන්නේ නම් හිස් මිනිසෙකු වශයෙන් ජීවත්වේ නම් ඔහුගේ ඊළඟ භවය ගැන කිවයුතු නැත.

බුදුරජාණන් වහන්සේ දෙසූ උතුම් බුදුවදන් හදාරමින් ඒවා ප්‍රායෝගික ජීවිතය තුළ ඔප්නංවමින් දුර්ලභව ලැබූ මිනිසත්කම ගුණධර්ම තුළින් පිරිපුන් කරගත යුතුය.

ඒ තුළින් මෙලොව ජීවිතය සාර්ථක වනු ඇත. පරලෝ දුක් නැති වනු ඇත. එපමණක් නොව සසර දුක්වලින් අතමිදී උතුම් වූ නිවන් මඟ පසක් කර ගැනීමට ද ශක්තියක් වනු ඇත.

මාස්පොත ඓතිහාසික බෝධිපූජා විහාරස්ථානවාසී
කු/නික/වාරි/රත්මලේ රතනසෙල මහ පිරිවෙනෙහි නියෝජ්‍ය පරිවේණාධිපති
ගලගෙදර රතනවංශ හිමි

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# මෙත් වඩමු - ලෝ දිනමු.

රළු බවින් මිදී සිනිඳු බවට පත්වීමේ මානව ධර්මතාව මෙත් බව නමින් හැඳින්වෙයි. මෙළොව වාසී සැවොම මිතුරු බවින් වෙසෙන්නේ නම් ලොව ස්වර්ග රාජ්‍යයක් වනු නිසැකය.

නමුත් සිදුව ඇත්තේ අනිකක්මය. දිනෙන් දින සිදුවන්නේද එයමය. ලෝකය පුරාම දක්නට ලැබෙන්නේ සතුරුකමය. මිනිසා මිනිසාටම සතුරුවීම තරම් අභාග්‍යයක් තවත් තිබිය හැකිද?

රට තුළ, ගමතුළ, නිවෙස තුළ වෛරයෙන් සිටියද අප සැවොම හුදකලා ජන කොටසකි. ඒ මේ දක්වා විශ්වය තුළ යම් තරමකට හෝ අපට මිතුරු හෝ සතුරු අන්‍ය ලෝකවාසියෙකු මුණ ගැසී නැති බැවිණි.

ඒ අනුව මේ ලෝකය තුළ අප සැවොම එකම මානව පරපුරක සාමාජිකයෝය. ගස්වැල්, සතා සීපාවා පවා එම ජීවන හිණිමගේම ගමන් සගයෝය. දියුණුව විසින්ද, මිනිසාම තනාගත් දේශපාලන හා ආර්ථික මිනුම් දඬු විසින්ද අප අපවම බෙදාගෙන තිබුණද උපත සහ විපත අතර පවතිනුයේ අනිත්‍ය, දුක්ඛ සහ අනාත්ම යන බුදුරජාණන් වහන්සේ දේශනා කළ ලෝක සත්‍ය පමණය. එය මෙලොව පවතින සෑම ජාතියකටම, ආගමකටම පොදුය. එසේනම් ඒ අතර තිබිය යුත්තේ මෛත්‍රිය පමණක්මය.

දුක් විඳින සත්වයා ඉන් මුදවාලීම පිණිසද ලෝක සත්වයාගේ හිත සුව පිණිසද අප විසින් සිදු කළ යුත්තේ මිත්‍රත්වය පෑමය. එනම් කායික මානසික වශයෙන් හිංසා පීඩා නොකිරීමය.

ලෝකයේ වෙසෙන කෝටි සංඛ්‍යාත මිනිසුන් පිරිස කුමන හේතුවක් මත හෝ හේතුවක් නොමැතිවම හෝ එකිනෙකා කෙරෙහි ද්වේෂයෙන් පසුවෙයි. නිවෙස තුළ හෝ වේවා, මඟතොටේදී හෝ වේවා, සමාජයේදී හෝ වේවා ද්වේෂය මූලික ජීවන ක්‍රමයකට අප ගොදුරු වී ඇති බව දක්නට ලැබේ. එය ව්‍යාපාදය, පටිඝය, ක්‍රෝධය, වෛරය ලෙසින්ද පෙනී සිටියි.

ද්වේෂය නසාලන දිව ඔසුව මෛත්‍රිය පැතිරවීමය. එමඟින් වඩාත් යහපත්, වඩාත් සාමකාමී සහ වඩාත් සොඳුරු ජීවන වටාපිටාවක් ගොඩනගා ගත හැකිය. එහි වැඩිම ප්‍රතිලාභය අවසානයේ තමාටමය.

වෛරී සහිත මිනිසුන් අතරේ අපි අවෛරීව සිටිමු'යි ධම්මපදයේ පවා එම කරුණ අවධාරණය කර තිබේ.

අපිට සමාජයේදී ආකාර සතරක මිනිසුන් මුණගැසෙයි. ඇතැමුන් අතිශ්‍ය ප්‍රියයන්ය. ඇතැමුන් මධ්‍යස්ථයින්ය. තවත් සමහරෙකුන් වෛරීත්වය ඇතැම්විට අප්‍රිය තැනැත්තන්ද අපට සිටිති.

මේ සතර පුද්ගලයින්ටම මෙත් සිත පතුරුවාලීම සත්පුරිසයාගේ වගකීමය. සීලව, ක්ෂාන්තිවාදී, චුල්ල ධම්මපාල, කපි, භූරිදත්ත, සංඛපාල, මාතුපෝසක වැනි ජාතක කථාවන්හි අප මඟ බෝසතාණන් වහන්සේ වෛරය, කෝපය, සංසිඳවූ ආකාරය මැනවින් විස්තර කර දී තිබේ.

මෛත්‍රිය වැඩීම සීමාසහිත, සීමාරහිත හා දිසා අනුව වශයෙන් ත්‍රිවිධාකාරය. බෞද්ධ පතපොත ඇසුරු කිරීමෙන් මෙම කරුණු මැනවින් වටහා ගත හැකිය.

කවුරු කෙසේ කීවද මිත්‍රත්වය මෙළොව ඇති අගනාම වටිනාම මානව ධර්මතාව බව ඉතා පැහැදිලිය. එය මෙළොව සැපත මෙන්ම පරලොව විමුක්තිය ද උදාකරණු ලබන මහා ගමන් මාර්ගයක පළමු පියවරය ද වන්නේය.

"මෙජ්පතීති මෙත්තා සීනියභතීති ආතෙථා"
රළු බව දුරුකරමු - සිනිඳු බවට පත්වෙමු.

06 පිටුවෙන්...

# රුදුරු දිවිමඟ සොඳුරු කරවන

දන්දුන් පිනින්ද වැඩූ භාවනාවේ කුසලයෙන්ද පරිපූර්ණවූ උත්තරාවෝ ප්‍රථමයෙන්ම ඇසූ ධර්‍මය මැනවින්ම වැටහුණු බැවින් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජනත්‍රය සිඳ බිඳ දමා සෝවහන් ඵලයෙහි පිහිටියාය. එපමණක් නොව බුදුරජාණන් වහන්සේ දෙසූ සියළු ධර්මයන් මතකයේ තබාගෙන එලෙසින්ම දේශනා කිරිමේ හැකියාවද එතුමිය ලැබුවාය. බුදුරජාණන් වහන්සේ සිව්වනක් පිරිසට අගතනතුරු දීමේදී,

'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසකානං බහුස්සුතානං යදිදං ඛුජ්ජුතරා' යනුවෙන් බහුශ්‍රැතිව බණ කියන මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතුරෙන් ඛුජ්ජුත්තරා උපාසිකාව අග්‍රවන්නේ යැයි දේශනා කොට වදාළ සේක.

මෙලෙස අගතනතුරු ලැබීමට ඈ කළ පුණ්‍යකර්මය කුමක්ද? බ්‍රහ්මදත්ත රජතුමා පසේබුදුන් වහන්සේලාට අග්‍ර සග්‍ය උණු කිරිබතක් පූජාකළ අවස්ථාවේ රත්වූ පාත්‍ර අත තබාගෙන වඩින්නට අපහසුව සිටි මොහොතේ ඉතාමත් ගෞරවයෙන් වටිනා සළුවක් ඉරා දරඬු සකස්කොට පිදීමේ ආනිසංසයත් පසේ බුදුන් වහන්සේලාට අග්‍ර දන්පූජා කිරීමේ ආනිසංසයත් හේතුවෙන් මෙලෙස ධර්මය අවබෝධ කර ගැනීමටත් ධර්මය දේශනා කිරීමටත් හැකි විය.

අංග සම්පූර්ණව බොහෝදේ ලැබීමට, සැප ලැබීමට, ධර්මය අවබෝධ කරගැනීමට සිතන ඔබ ඛුජ්ජුත්තරා උපාසිකාව මෙන් සතුටු සිතින් කර්මඵල අවබෝධයෙන් සුදුසු අවස්ථාවට සුදුසු පරිදි තමාගේම උවමනාවෙන් සුදුසු පුද්ගලයන්ට සුදුසු පරිදි යම් යම් දේ පූජා කරගන්න.

සාමාවතී ඇතුළු බිසෝවරුන්ට මල්ගෙන ඒමට සෑම දිනකම ඛුජ්ජුත්තරාට රජතුමාගෙන් කහවණු අටක් ලැබුණි. බිසෝවරුන්ගෙන් ලැබෙන කහවණු ප්‍රමාණයත් මල්වල මිලත් නොදන්නා බැවින් ඛුජ්ජුත්තරා කහවණු හතරක පමණ මල් ගෙනවිත් දුන්නාය. එදින ශ්‍රී සදහම් අසා අවබෝධ කරගත් හෙයින් නැවත කිසි දිනක පව් මළ සිදු නොකරන බැවින් අවබෝධකරගත් සාමාවතිය ඛුජ්ජුත්තරාට දඬුවම් දීම වෙනුවට සුවඳ පැනින් නහවා සුදුවත් හන්දවා අසුනක් පනවා ඈ එහි හිඳුවා ලොව්තුරු දහම දෙසන්නට ආරාධනා කළාය. ඈ දෙසූ ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කළ සාමාවතී ඇතුළු පිරිස සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සතර බැමි සිඳ සෝවාන් ඵලයෙහි පිහිටියාය.

මේ අතර තමන්ගේ රූපයට අවමන් කළැයි ලොව්තුරා සම්මා සම්බුදුන්කෙරෙහි වෛර බැඳසිටි මාගන්ධියා නම් බිසවද, වාසවදත්තා නම් බිසවක්ද උදේන රජුහට පිරිවර සහිත අගබිසෝ තනතුරු ගත්හ. සාමාවතී ඇතුළු පිරිස බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් සිටිය බැවිනුත්, ඛුජ්ජුත්තරා නම් දාසිය දාසී භාවයෙන් මුදා මව් තනතුරේ තබා ඇයගේ මාර්ගයෙන් ධර්මය අසන බැවිනුත්, රජතුමා පහදවාගෙන සසරුවන මාළිගාවට වඩමවා දන්දී වදරන බණ අසන බැවිනුත් සාමාවතී ඇතුළු පිරිස කෙරෙහි මාගන්ධියා වෛර බැන්දාය.

කීපවාරයක්ම රජුලවා සාමාවතිය මරන්නට තැත්කළද සිල්ගුනයෙන් අනූනවද, නුවණැතිවූ ද කිසි කලෙකින් කිසිවිටකත් වරදක්, අපරාධයක්, වෛරයක් නොකළාවූ බැවින් එය කරන්නට බැරි විය. නුවණ නැත්තේනම් වෛරය කිසිදා සිඳ දැමිය නොහැකිය. අකුසලයක් තිබේ නම් එයින් බේරීමටද නොහැකිය. සාමාවතිය මෙලොව මාර්ගඵල ලබා ඇතද, පිරූ පින්ඵල ඇතද පෙර තිබූ බලවත් අකුසලයක් ඵලදීමේ කාලයට එළඹ සිටියාය. ඇගේ සපිරිවරද එම අකුසලයම කළා වූවෝ වෙති. එබැවින් මාගන්ධියා බිසවගේ වෛරයේ ඵල දැකීමේ කාලය පැමිණියෙන් රජතුමාටත් සගවාම සාමාවතිය ඇතුළු පිරිස ඔවුන්ගේ මාළිගයේම සිරකොට මරණ ලෙස සුළු පියාට දන්වා රජුකැටිව මාගන්ධියා බිසව උයන්සිරි නැරඹීමට ගියාය. උයන්සිරි නරඹා ආපසු එන රජුට සාමාවතී ඇතුළු බිසෝවරු විනාශවී ඇති ආකාරය දැක මහත් කම්පනයට පත්විය. එහෙත් එය නොපෙන්වා එය සිදු කළ අය සෙවීමට උපායක් යෙදීය. එම උපායට අනුව නිවැරදිව මෙහි තතු අවබෝධ කරගත්තෙන් මාගන්ධියා බිසව සහ ඇගේ සුළු නෑයන් රජු විසින් විනාශ කළේය.

මේ සිදුවීම සම්බන්ධව මුළු රටපුරාමත් පැතිරී ගොස් සම්බුදු සව්වන් අතරටද ගියේය. සම්බුදු සව්වෝ බුදුහිමියන්ගෙන් අසා සිටියේ මාර්ගඵල ලැබූ මේ උපාසිකාවන්ට මෙසේ සිදුවූයේ කෙසේද යන්නය. එසේම හදිසියේ සිදු වූ මරණය හේතුවෙන් ඔවුන්ගේ පරලොව ජීවිතවල තත්වය කෙසේද යන්න සොයා බැලීමය.

මහණෙනි, මෙම කාන්තාවෝ සෝවාන් මාර්ගඵල ලබා සිටි බැවින් කිසිවෙකුටත් වෛර නොකර භාවනාවකට සමවැද සකෘද්ධාගාමී අනාගාමී ඵල ලබා සුවපත් සිතින් මිය ගියහ. වෛර සිතින්ම නපුරු සිතින්ම ජීවත් වූ මාගන්ධියා ඇතුළු පිරිස වෛරයෙන් වේදනාවෙන්ම මියගොස් අවිචි මහා නිරයේ උපන්නායැයි බුදුරජාණන් වහන්සේ දෙසූ සේක.

මේ වත්මන් සමාජය දෙස බලන කළ බහුතරයක් ජීවත්වන්නේ මාගන්ධියාලා ලෙසිනි. ඔවුහූ අනුන්කරන දේ වැරදි ලෙස දකිති. අනුන්ට පීඩා ගෙනදෙන සිතුවිලිම ඇතිකරගනිති. තමාකරන වැරදි තමාගේම මතයෙන් නිවැරදි කරගනිති. සාමාවතීලාවන් නිහඬ නිවැරදි අය තලාපෙලා පීඩාවට පත්කරති. මෙසේ කටයුතුකරන අයට මාගන්ධි ඇතුළු ඥාති පිරිසට සේ මෙලොවම දුක් විඳ පරලොව අපායගාමී වීමට සිදුවේ. සාමාවතීලාවන් නිවැරදි ඔබටද සතුරන් අමනාප පුද්ගලයන් සිටිය හැකිය. එහෙත් ඔබට සමාවතීට මෙන් සතුරාට මෛත්‍රී කරන්නට විපතේදී සමාධිගත සිතක් ඇති වේනම් ඔබටද මාගන්ධියට වූ දේම සිදුවේ. එම නිසා වෛර සහගත සිතිවිලි දුරලා මෛත්‍රී පූර්වාංගයම චේතනාවත්, ඉවසීමත්, ප්‍රඥාවත් ඇතිකර ගැනීමෙන් ඔබට මෙලොව පරලොව දෙලොවම ජයගත හැකිය.

සාමාවතී ඇතුළු පිරිසට ගෙයක් තුළ හිරවී දැවී මරණයට පත්වන්නට හේතුව කුමක්ද? මෙම බිසෝවරු පිරිස එක් ආත්ම භවයක රජකෙනෙකුගේ බිසෝවරු වී සිටියහ. එම රජතුමා පසේ බුදුවරු අටනමකට නිති දන් පූජා කළහ. එක් දිනක් දන් ලැබූ පසේ බුදුරදුන් 7ත් නමක් ගන්ධමාදන පර්වතයට වැඩියහ. එක් නමක් තණ බිමක සමාපත්තියට සම වැදුනහ. රජතුමා හා බිසෝවරු උයනට ගොස් ක්‍රීඩාකොට ගඟට බැස බොහෝවේලා ජල ක්‍රීඩා කොට ශීතල ඇතිවූයෙන් තණ බිස්සට ගිණි තැබීය. තණ ඇවිලී ගොස් අවසන බැලූකළ නිහඬව නිසලව සිටිනා පසේ බුදුරදුන් දුටු කාන්තාවෝ පසේ බුදුරදුන් පිලිස්සී පිරිනිවන් පා ඇතැයි සිතීය. මෙය රජතුමා දුටුවහොත්

15 පිටුවෙන්...

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.




## ගුරු සමර

සාහිත කලා කරුවන් ලොව අබිමාන
ගුරු බවතෙකුට බැති පුද දුන් අවසාන
වියොවින් ඔබගේ මම දැක ගත් දුක් සීන
පිවිතුරු සුසානය සරසවි මල් යාන

මිහිදන කළ පසුව මියැදුන ඔබ නමට
සිහිවටනයක් තැනවිය දරු සෙනෙහසට
දැනුමක් ලබාදුන් දරුනට දැරියනට
අභිමිව ගියා ගුරුවරයෙක් ජාතියට

පාලුවූ සොහොන් බිම දුක් මුසු කුරුළු හඬ
ගිලිහී වැටුන මල් පෙති තණ පියලි උඩ
එළියක් නොදෙයි කණ මැදිරියෝ අඳුර මැඩ
හදවත සසල කරවයි කවියකට ඉඩ

කළුවර ජනිත සොමි සඳ රැස් නැතිදාට
එක්වී එලිය දෙනවිට තරුපෙල ඊට
සංවේගය දැනී ඔබතුම නැතිවාට
යටගිය මතක තනියට එයි කවියාට

ගොළුපද වැලක අමුනා සත්සර ඔබගේ
මුළු දෙනවිටදි කෝ මට සතුටක් නෑනේ
කළුවර රැයක පළඟැටි මුමුණන වේගේ
රළු හඬ විලාපෙක අම්හිරි හඬ වාගේ

රසවන්තයාණෙනි ගලනා කඳුළු ගඟේ
මම හුදකලා වෙමි නොමියන මතක දිගේ
සොහොයුරු සබඳ නියැලුන කවි කොළඹ යුගේ
සංසාරයේ හමුවේවා පැතුම මගේ...

**විල්ප්‍රඩ් මීපුර**
**කුරන-මීගමුව**

## සාමය..

අපේ පුංචි මහිතලයේ
ගුවන උඩින් පියා සලන
පුංචි පරවියෝ
ජාතික ධජයේ ලෙළදෙන
දේශයේ අභිමන් රකිනා
පුංචි පරවියෝ...

ඈත අහසේ පියා සලන
තටු වහිදා ඉගිලී යන
සාම පරවියෝ..

ඈත අහසේ පියා සලන
තටු විහිදා ඉගිලී යන
සාම පරවියෝ..
එදා සිටියේ දුකින් තමයි
අද සිටියේ සොම්නසකිනි
කියා දෙන්න මට ඒ ගැන
පුංචි පරවියෝ..

ආර්.මහේෂිකා පවිත්‍රානි
වික්‍රමසිංහ

## නොකරන් මිනිසුනේ

ඉරුණු රෙද්ද මහලා පොරවන්න එපා
මැරුනු මිනිය වත්තේ වළලන්න එපා
ඇරුණු දීගේ නැවතත් පා ගන්න එපා
කරුණු නැතිව කීදේ පිළිගන්න එපා

ඉල්ලන සියළු දේ දරුවට දෙන්න එපා
කිළිටි ඇඳුම් ඇඳ පාරට යන්න එපා
බොරු කියලා දරුවන් රවටන්න එපා
දරුවන් ඉදිරිපිට අනුනට බනින් එපා

හිස් අතකින් පිට ගෙයකට යන්න එපා
හිත රිදෙනා යමක් එහි පවසන්න එපා
දෙන්න බැරි යමක් ඔබ ඉල්ලන්න එපා
හිත නොහොඳින් ඉන් ආපසු එන්න එපා

නිවසට ආ අයගේ හිත රිදවන්න එපා
පුළුවන්කම තබා නෑ බෑ කියන්නෙ එපා
දුකට පිහිට වන්නට මැලි වෙන්න එපා
අයුක්තියට ඉඩදී පිට වෙන්න එපා

පෙරට තැබූ පය පස්සට ගන්න එපා
පස්සට ගන්න සිදුවන පය තබන්නෙපා
කණට ඇසුන දේ හැමදේ පිළිගන්න එපා
ඇසට පෙණුන දේ නොකියා ඉන්න එපා

ජයක් ලැබුණ විට අහසින් යන්න එපා
පරාජයේදී කටු පොරවා ගන්න එපා
උඩට නැංග ඉනිමග පෙරලන්න එපා
තරණය කළ ඔරුව කරගහ ගන්න එපා

දවල් නිදා කම්මැලියෙකු වෙන්න එපා
රෑ නොනිදා ලෙඩ කැඳවා ගන්න එපා
කළයුතු වැඩ මතුවට කල් දමනු එපා
බෑ කිය කියා අභිමානය නසන්නෙපා

ජනකවි ඇසුරිනි
**ටී.එම්.සෝමපාල - රිකිල්ලගස්කඩ**

## යසෝදරා වත..

සියවසක් පුරාවට
ඔබ නොවේ හිමියනි
දුෂ්කර ක්‍රියාවක නියැලුණේ..
දරන බව දැන ඔබ දළ රෙදි
දැන ඔබ වළඳන බව
සිඟාගත් පිඬුටික..
සිනිදු සළුපට,
රස බොජුන්, සැම අහර දැක දැක
ඉවත ලූයෙමි හිමි සඳ
ඒ සැම..
සඳකිඳුරු දා සිට බැඳිපෙම සිහිකර
දෙනෙත සැමගෙන් වසන්කර
හදවතින් හැඬුවෙමි හැමදින
සුව පහසු යහන් ගැබ දැක දැක
සැම රැය පහන් කළ
මෙයයි හිමියනේ යසෝදරා වත..

**සුදර්ශනි ජයසුන්දර**



## මව්කිරි සුවඳ

ගුරු පිය දහම දිවි මාවත එළිය කෙරූ
හිරු සඳු කිරණ මෙනි කළ ලොව අඳුර දුරූ
දරු සෙනෙහසින් ලොව මව් පදවි දැරූ
සරු දිවි කෙතට දිරියක් විය මව්ණි, ගරූ..

සිප්හල සෙවණ යට පෙර දින කළ අකුරූ
සිහිකළ දිවිය සැප සම්පත් ලද අයුරූ
ගත කළ මව් තුරුල සෙනෙහස පිරී මියුරූ
බිහිකළ මව නැති කළ දිවි මඟ අඳුරූ..

සව්මත් දිවිය ලද පැතුමෙන් අය දින්නම්
සම්පත් අතැර ලෝ දහමට නතු වන්නම්
මිනිසත් බව ලැබ දුන් මව් නම දින්නම්
මතුවන් ලොවකදී ඔබ කුස උප දින්නම්

ගතසිත විඩා මිනිසෙකු ලෙස මුදා හැරූ
විෂ්මිත හැඟුම් බර හෙට දින උදා කෙරූ
බත්පත බුදින විට සෙනෙහස සදා පෙරූ
බැති සිත මව් වදන සුරකිමි, පුදා ගරූ

මව් සෙනෙහස ගුණදම් සිහිකර දෙන්නේ
බිව් මව්කිරි සුවඳ දිවියට දිරියක් වන්නේ
කිව්වම ඔවා බස් සැමවිට පිළි ගන්නේ
අව් වැසි පීඩා නැත, මව් සෙවණක් දුන්නේ

කටුදෙණියේ
**සි.ති. ගමගේ**

## පෙණ පිඬක් උපමා වී..

හිමවත් පව් දෙසින්
ගලා එන නිල් ජල දහරා
සැඟවෙයි ගංගා නදී තෙරේ
ගල්කුළු අතරින් ගලායන
නදී ජල දහරා පෙණ බුබුළු නංවමින්
හැදී හැදී බිඳී යයි.
බිඳී බිඳී කැඩී යයි.
සම්මා සම්බුදුන්
දෙසූ දහම් මතක් වෙයි.
මේ අයෝධ්‍යාවේ ගංගා නදී තීරයේදී
සම්මා සම්බුදුන් වැඩසිටී.
මහ සඟුන් පිරිවරා,
තරු පිරිවරා බබළන සුපුන් සඳ
පරදවා
රිදීවන් ජල කඳකි මේ
විඩාබව නිමන්නේ
සිසිලුවූ සුළඟක්ය
නදී තෙරින් හමන්නේ
ගලායන ජල දහර විටෙක සුදු
පෙණ කැටිති මතුකරයි
සැදෙන්නා වූ පෙණ කැටිති විසිරී යයි.

පින්වත් මහණෙනි,
එලෙසින්ම රූපයේ ඇති
ස්වභාවයද මෙලෙසින්ම
බැලූ විට
රූපයේ නිසරු බව වැටහේ.
හිස් බව වැටහේ
තුච්ඡ බව වැටහේ,
රූපයේ හරයක් කොහෙන්
නම් දකින්නයද
සරත් කළ වැටෙන ලොකු
ජල බිඳිති මතක් වෙයි.
මහ වැස්ස ඇද හැළී
බොර වතුර ගලායයි.
වැහි බිඳිති බිම වැටී
දිය බුබුළු මතු කරයි.
හැඳී හැඳී මතුවෙනා
දිය බුබුළු බිඳී යයි.

පින්වත් මහණෙනි,
විඳීමත් එලෙසින්ම
නුවණින්ම බැලූ විට
හිස් දෙයක් ලෙසම වැටහේ.
තුච්ඡ දෙයක් ලෙසම වැටහේ
ඇත්තෙන්ම විඳීමේ හරය කුමක්ද?
පායනා කාලයේ ගිනි අව්ව පතිත වී
මිරිඟුවක් සැකසිලා ජලය සේ
පෙනෙන්නේ
නමුත් එය මිරිඟුවක් බව
නැණතියන් දකින්නේ,
එලෙසින්ම හඳුනා ගැනීම්,
මිරිඟුවක් ලෙසින් බැලූවිට
හිස් දෙයක් ලෙසම වැටහේ.
සැබෑවටම හඳුනාගැනීම්වල ඇති
හරය කුමක්ද?

පොරවක් රැගත් මිනිසෙක්
අරටු සොයනට ඇවිත්
කෙසෙල් ගස් කපමින්
පතුරු ගලවාලමින්
අරටු එහි සොයන්නේ
කිසි එලක් නොවන්නේ
සංස්කාරයන් පිළිබඳවද
නුවණින්ම බැලූ විට සංස්කාරයන්හි
හරයක් නොපෙනෙන්නේ.

සතර මං හන්දියේ
මැජික් කරුවෙක්ය සිටින්නේ,
ඔහු සෑම විටකදීම
රැවටීම් කරන්නේ,
කරුණු දන්නා දනන් හට
එය මැජික් නොවන්නේ,
එලෙසින්ම සියලු විඤ්ඤාණයේ
හරයක් කොහේ නම් දකින්නටද?
මෙලෙසින්ම සිතමින්
නුවණ මෙහෙයූ විට
පංච උපාදානස්කන්ධයේ
අවබෝධයෙන් කළකිරෙයි.
එවිට සිත නොඇලෙයි.
සිත එයින් නිදහස් වෙයි
නිවනට පත්වෙයි
උපතක් නැතිවෙයි.
දොහොත් නළලේ තබා
බුදුදහම පිළිපදී
මිනිස් ලොව අසිරිමත්
දහම් රැස් පැතිරිලා
සිත පහදා ගනු මැනවි
බොහෝ සැප ලැබෙන්නේ..

කැකිරාව, හිරිපිටියාගම
මාලනී මල්කාන්ති එදිරිසිංහ

# පිය සෙනෙහස




ගමටත් කලියෙන් කුඹුරට පායන හිරු මඬලයි පියාණෙනි
උදලු තලෙන් රන් කෙත අස්වද්දන ජීවන යතුරයි පියාණෙනි
ඉරගින්නේ මුතු ඇට වපුරන මගේ යෝද බලය වූ පියාණෙනි
ජීවිතයේ මහමෙර මුදුණත නැග අතවනපන් මට පියාණෙනි

සිරුරේ ලේවැල් වල දිව යන්නේ ඔබ මට දුන් දායාද වැලයි
අම්මා මෙන් මා කුස නොදැරුවත් නුඹ ඉසිලූ දුක් අහස උසයි
ලේ කිරි කර නොම පෙව්වත් නුඹ මට පෙවි සවියේ කිරි රස කදිමයි
ජීවන විල්තෙර කුසුමන් අතරේ ලෝවට උතුම් සියපත නුඹ මයි

වළාකුළේ රන් ඩා බිඳු සඟවා පොළවට මහවැසි හෙලන පියා
කරගැට පිරි සුරතින් මා පාසැල් යැව් අකුරු නුගත් මගේ පියා
මා දිවියේ පසුපස රැඳුනා වූ යෝධ පියවයි මගේ පියා
විරිය පෙරුම් පුරනා ඔබ නමදිමි දොහොත් මුදුන්දී සිරස නමා

වනතුරු වදුලේ පිස එන සුළඟින් ඔබේ සුවඳ තව ළං වේවා
කලාවැවේ නිල් දියවර අතරින් ඔබේ දිරිය බල පැති රේවා
උපදින සසරේ බිම්සර රජුවී නිවන් පුරේ මං හෙළි වේවා
ඔබෙ පිය සෙනෙහස මුළු මිහිතලයම නිවනා සෙත් පිරිතක් වේවා..

**පී.එම්.ආර්.ආර්. කාංචනමාලි ගුණතිලක**



# බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලකෂණ

බුදුරජාණන් වහන්සේ වනාහි අසම සම වූ ශාස්තෘවරයකු බව අපි දනිමු. උන්වහන්සේ තුළ ලොව කිසිදු මනුෂ්‍යයකුගේ නොමැති වූ මහා ලක්ෂණ තිස් දෙකක් වන අතර ඒවා දෙතිස් මහා පුරුෂ ලක්ෂණ නමින් හඳුන්වයි. එකී පුරුෂ ලක්ෂණ පිළිබඳව සවිස්තරාත්මකව හඳුන්වා දෙන්නාවූ සූත්‍ර දේශනාව ලෙස ලක්ඛණ සූත්‍රය පෙන්වා දිය හැකිය. එම සූත්‍ර දම් දෙසුමට අනුව ලොව වෙන කිසිදු කෙනෙකුට කොහෙත්ම ලැබිය නොහැකි මහා පුරුෂ ලක්ෂණ තිස් දෙකක් වන අතර දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇත්තෙකු ගිහිගෙය විසුවහොත් ඒකාන්තයෙන් සක්විති රජ වන අතර පැවිදි භාවය ලද හොත් බුදුබව ලබනු නියති.

සක්විති රජු යනු ගිහි දිවි පෙවෙතේ ලද හැකි ඉහළම තත්වය වේ. මුළු ලොවම ධර්මයෙන් පාලනය කරනු ලබන මහා ශ්‍රේෂ්ඨ රජු වන සක්විති රජු අතීතයේ කළ මහා පුණ්‍ය ශක්තිය නිසාම ලබන්නාවූ මහා බලයකි. සප්ත රත්නයක් පහළ වන සක්විති රජු හට සියලු භෝග සම්පත් ඇතිව සුජීවත් විය හැකිය.

සිදුහත් කුමරු ඉපදී දින කිහිපයකට පසුව පැවති නාමකරණ මංගල්‍යය හෙවත් නම් තැබීමේ උළෙලේදී බමුණෝ තම අදහස් ඉදිරිපත් කරමින් මෙම කුමරු සක්විති රජ හෝ බුදු බව ලබන බව පැවසූහ. එහිදී කොණ්ඩඤ්ඤ බමුණාගේ මතය වූයේ ඒකාන්තයෙන්ම සිදුහත් කුමරු බුදුබව ලබන බවය. මෙසේ මෙම බමුණන්හට පෙර නිමිති කීමට හැකිව ඇත්තේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් සමන්විත කුමාරයකු වූ නිසාය.

දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සැකෙවින් ගත්විට පළමුවැන්න ලෙස සුප්පතිට්ඨිතපාද පෙන්වා දිය හැකිය. එනම් කකුල බිම තැබූ විට යටිපතුල සම්පූර්ණයෙන්ම බිම ගැටී තිබීමය. දෙවැන්න ආයතපණ්හි ස්වභාවයයි. එනම් සාමාන්‍ය පුද්ගලයකුට වඩා විලුඹ දිගට පිහිටීමය. දීඝංගුලි හෙවත් දිග ඇඟිලි තිබීම ද තවත් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් එකකි. බ්‍රහ්මුජ්ජුගත්ත යනු බ්‍රහ්මයෙකුට මෙන් ඍජු ශරීරයක් පිහිටා තිබීමය. එයද බුදුරජාණන් වහන්සේගේ පිහිටා ඇති දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් එකක් ලෙස පෙන්වා දිය හැකිය.

බුදුරජාණන් වහන්සේගේ සිරිපතුලෙහි හෙවත් යටි පතුලෙහි අටෝරාශියක් මංගල ලකුණු ඇත. එනම් මගුල් ලකුණු එකසිය අටක් එක් කකුලක ද අනෙක් පාදයෙහි මංගල ලකුණු එකසිය අටක් ද වශයෙන් කකුල් දෙකෙහිම සිරිපතුල් වල මංගල ලකුණු දෙසිය සහසයක් ඇත. අටෝරාෂිය යන්නෙහි අරුත එකසිය අට යන්නය. එසේ හෙයින් එම පුරුෂ ලක්ෂණය ''හෙට්ඨාපාදතලේසු චක්කානි ජාතානි'' නම් වේ.

සත්තුස්සදා යනු බුදුරජාණන් වහන්සේ ශරීරයේ හත්තැනක උස්වීම්, මතුවීම් දක්නට තිබීමය. සාමාන්‍ය මිනිසුන්ගේ දක්නට නොමැති ස්ථාන හතක ශරීරය මසින් පිරී තිබීම ද දක්නට ඇත. තවද බුදුරජාණන් වහන්සේගේ අත්ල මෘදුයි. පතුල් හරිම සිනිඳු බවක් වේ. එබැවින් එය ද දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් එකකි. එය ''මුදුතළුනහත්ථපාද'' නම් වේ. බුදුරජාණන් වහන්සේගේ බොලටැහැ අනෙක් අයගේ පිහිටීමට වඩා උසින් ඇත. එය ''උස්සංඛපාද'' නම් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හඳුන්වන අතර උඩුකුරු වූ ලොම් ඇති බවින් යුක්ත වීම ද දෙතිස් මහා පුරුෂ ලක්ෂණයකි. එය ''උද්ග්ගලෝම'' නමින් හඳුන්වයි. එසේම බුදුරජාණන් වහන්සේගේ කලවයේ ස්වරූපය ඒණි මුවන්ගේ කලවයේ ස්වරූපයට සමය. එබැවින් එම පුරුෂ ලක්ෂණයට ඒණිජංඝා නම් වේ.

තවද අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේට මනාව පිහිටන ලද හිසක් ඇත. එය උත්හිසසීස නම් වේ. එසේම ඒකේකලෝමතා හා උණ්ණාලක්ඛණා යනුවෙන් හඳුන්වන්නේ ද තවත් පුරුෂ ලක්ෂණ දෙකකි. බුදුරජාණන් වහන්සේගේ එකී රෝම කූපයකින් එක ලෝමයක් පමණක් හටගැනීම සුවිශේෂී වූවකි.

එසේ හෙයින් ඒකේකලෝමතා නම් වූ පුරුෂ ලක්ෂණයෙන් යුක්තය. එමෙන්ම නළලේ ඇහිබැම් දෙක අතර දකුණු දෙසට කැරකුණු පුංචි ලොම් ගසක් බුදුරජාණන් වහන්සේගේ දක්නට ඇත. මෙය තවත් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයක් වන ''උණ්ණාලක්ඛනා'' නම් වේ.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙහි දත් හතලිහක් පිහිටා තිබීම ද තවත් පුරුෂ ලක්ෂණයකි. එය 'චත්තාළීසදන්තා' නම් වේ. දත් හතළිහම එකම උසින් එකම මහතින් එකම පිළිවෙලට පිහිටා ඇති බැවින් අවිවරදත්තා නම් වේ. එයද දෙතිස් මහා පුරුෂ ලක්ෂණින් එකකි. බුදුරජාණන් වහන්සේගේ අසාමාන්‍ය වූ අතිවිශාල දිවක් ඇත. එය ඕනෑම තැනකින් නැමිය හැකි මෘදු මොළොක් වූවකි.

මෙම මහා පුරුෂ ලක්ෂණය පහුතජිව්හා නම් වේ. බුදුරජාණන් වහන්සේගේ හඩ ඉතා මිහිරිය. විශේෂ ලක්ෂණ අටක් සහිත මෙම හඩ ඉතා මිහිරි බවින් යුක්තවීම දෙතිස් මහා පුරුෂ ලක්ෂණ යන්ගෙන් එකකි. එබැවින් බ්‍රහ්මස්සර නමින් එම පුරුෂ ලක්ෂණය හඳුන්වා ඇත. සීහහනු යන පුරුෂ ලක්ෂණයෙන් පෙන්වා දෙනුයේ බුදුරජාණන් වහන්සේගේ උඩුහනුව හා යටිහනුව සිංහයෙකුගේ යටි හක්ක වගේ හොඳින් පෘෂ්ටිමත්ව පිහිටා තිබීමය. මනා සුදු පැහැති දත් තිබීම සුසුක්කදාඨා නම් ද සමාන දත් තිබීම සමදන්තා නම් ද වේ. මෙම ලක්ෂණයන් ද දෙතිස් මහා පුරුෂ ලක්ෂණයට අයත්ය.

දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් තවත් එකක් ලෙස සුඛුමඡවි හෙවත් සිනිඳු සම පෙන්වා දියහැකිය. බුදුරජාණන් වහන්සේගේ සමෙහි සිනිඳු බව තවෙකෙකුට සමකල නොහැකිය. බුදුරජාණන් වහන්සේ රන්වන් පැහැයෙන් යුක්තය. එය ද පුරුෂ ලක්ෂණයක් වන අතර සුවණ්ණවණ්ණතා නමින් එය හඳුන්වයි. බුදුරජාණන් වහන්සේගේ ජනනේද්‍රිය, පුරුෂ ව්‍යඤ්ජනය පිහිටා ඇත්තේ ශරීරය ඇතුලතය. එය සුවිශේෂී වූ පුරුෂ ලක්ෂණයකි. එබැවින් එය කෝසෝහිතවත්ථගුය්හ නම් වේ.

උන්වහන්සේගේ ශරීරය උසේ තරමට මහතත් මහතේ තරමට උසත් ඇත. එය පරිමණ්ඩල ලක්ෂණයයි. නොනැමී උන්වහන්සේට තම දණහිස අතගෑ හැකිය.
එය ''අනෝනමජණ්ණුපරිමසනලක්ඛණ'' නම් වේ. තවද උන්වහන්සේගේ බඹයයි උසයි එක සමානය. එය නිග්‍රෝධපරිමණ්ඩලකාය නම් පුරුෂ ලක්ෂණයෙන් හඳුන්වයි.

බුදුරජාණන් වහන්සේගේ ශරීරයේ ඉදිරිපස මෙන්ම පසුපසත් සිංහයාගේ ඉදිරිපස කොටස මෙන් පරිපූර්ණව ඇත. එය දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් එකක් වන සීහපුබ්බද්ධකාය නම් වේ. රස නහර හත්සියයක් බුදුරජාණන් වහන්සේගේ දිවට සම්බන්ධ වී ඇති බැවින් දිවේ යමක් තැබූ සැනින් මුළු පෝෂණයම ශරීරය පුරා ක්ෂණිකව විහිද යනු ඇත. මෙම විශේෂ පුරුෂ ලක්ෂණය ද උන්වහන්සේ සතුය.

එය රසග්ගසග්ගිතා නම් වේ. ඉතාම නිල්වන් ඇස් දෙකක් ඇති බැවින් අභිනීලනෙත්ත යන පුරුෂ ලක්ෂණයෙන්ද එදා උපන් වසුපැටියෙකුගේ මෙන් දෙනෙත් ලද බැවින් ගෝපඛුම යන පුරුෂ ලක්ෂණයෙන්ද යුක්ත විය.

මේ අයුරින් අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේගේ දෙතිස මහා පුරුෂ ලක්ෂණයන් පෙන්වා දිය හැකිය. ඒ තුළින් හුදී බොදු ජනයාගේ සිත් සතන්හි අප තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවය තව තවත් තීව්‍ර වනු නිසැකය.

ආර්.එන්.එච්.එම්.සමන් ජයරත්න

# තමා තමා දෙස බැලීම

පංචේන්ද්‍රියන් වනාහි කාම ලෝකයේ සත්වයින් සතු ඔවුන්ගේ පැවැත්ම උදෙසා පවතින ඉඳුරන්ය. ඇසට රූපයත්, කණට ශබ්දයත්, නාසයට ගඳ සුවඳත්, ශරීරයට ස්පර්ශයක් වශයෙන් ඒවා පෝෂණය වන්නේය. මෙම පංචේන්ද්‍රියන් වලින් සැදුම්ලත් සත්වයා නිරන්තරයෙන් ඒවාට අවශ්‍ය ආහාර සොයා ගැනීමට වෙහෙසෙනු ඇත. ඒ සුඛ වේදනා වශයෙන් ද දුක්ඛ වේදනා වශයෙන් ද අදුක්ඛ සුඛ (මධ්‍යස්ථ) වශයෙන්ද බෙදෙනු ඇත.

නවීන විද්‍යාවට අනුව ශරීර පිළිබඳ විවිධ පරීක්ෂණ අද වෙනකොට සිදුවෙමින් පවතී. ඒ අනුව ශාරීරික කොටස් පිළිබඳ එකින් එක අධ්‍යයන කිරීමක් සිදු කරනු ඇත. ශරීරය ලෙඩ වීමෙන්, කැඩීමෙන්, බිඳීමෙන් සිදුවන හානිය වළක්වා ගන්නා ආකාරයත් ඒ සඳහා අවශ්‍ය ඖෂධත් සොයාගෙන ඇත. ශරීර අභ්‍යන්තර පිළිබඳ අද විනිවිධ දැකීමට තරම් යන්ත්‍ර උපකරණ ද සොයාගෙන ඇත. විද්‍යාව (Science) තුළින් ශරීරය පිළිබඳ බොහෝ දේ සිදු කරනු ඇත. වෛද්‍යවරු එවැනි පරීක්ෂණ සිදු කරන්නේ පොතපත කියවා එතුළින් කරුණු දැන එම විෂය පිළිබඳ නිපුණත්වයකට පත් වීමෙනි. එය බොහෝ දුරට භෞතික වස්තූන් හරහා සිදුවන ක්‍රියා දාමයකි.

සිත පිළිබඳ ලෝකයේ සැබෑ පරීක්ෂණය කළ ශාස්තෘවරයා වන්නේ බුදුරජාණන් වහන්සේයි. උන්වහන්සේ එහි පරතෙරටම ගියහ. එනම් බුද්ධත්වය අවබෝධ කර ගැනීමයි. එපමණක් නොව ශරීරය පිළිබඳ විනිවිද දැක කරුණු දේශනා කොට ඇත. අද නවීන විද්‍යාවෙන් ශරීරය පිළිබඳ කියන කරන දේ බුදුහිමි එදා ඒ පිළිබඳ ප්‍රඥා ඇසින් කරුණු ඉදිරිපත් කළහ. ධම්ම පදයෙ ජරා වග්ගය, මල වග්ගය ආදී තැන්වලදීත් පිරිත් පොතෙහි ගිරිමානන්ද බොජ්ඣඞ්ග ආදී සූත්‍ර තුළිනුත් ශරීරය හා එහි අන්තර්ගත කොටස් පිළිබඳ දේශනා කළහ. ඒවායේ ඇති යථා ස්වභාවය හරියට කපා කොටා බැලුවාක් සේ ඉදිරිපත් කළහ. වෛද්‍ය විද්‍යාව පරීක්ෂණ කොට සොයා ගන්නා දේ බුදුහිමි එදා බුදු ඇසින් දැක දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ සිත පිළිබඳ තම තමන්ටම බැලිය හැකි අයුරින් දේශනාවන් ඇසුරින් කරුණු ඉදිරිපත් කොට ඇත. ම.නි.''මජ්ජිම පණ්ණාසකයෙ ගහපති වග්ගයට'' අයත් ''අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය'' ඇසුරින් බුදුහිමි උපමාවක් භාවනා කොටගෙන රාහුල හිමිට සිත පිළිබඳ බැලීමට කළ දේශනාවක් අන්තර්ගතය. එය කෙටියෙන් පැහැදිලි කළොත් වැදගත්වේ යැයි සිතමි. රාහුල පොඩි හාමුදුරුවො අම්බලට්ඨික නම් කුටියෙහි වැඩ වසන සමයක බුදුහිමි උන්වහන්සේ මුල් කොටගෙන සියලු සත්වයාටම ධර්මයක් දේශනා කිරීමට සිතූහ. ඒ අදහසට අනුව බුදුහිමි සන්ධ්‍යා කාලයේ රාහුල හිමි වැඩ සිටින කුටියට වැඩම කළහ. රාහුල හිමි බුදුහිමි දැක ඉතා සතුටු සිත්ව පා සෝදා වැද නමස්කාර කොට පනවන ලද ආසනයෙ වැඩ ඉඳීමට සලස්වා ගිලන්පසාදිය ද පිළිගැන්වූහ.මෙහිදී රාහුල හිමිගෙ නිහතමානිකමද හොඳින් ම පැහැදිලි වේ. ඕනෑම චරිතයක් සකස් කර ගැනීමට රාහුල හිමිගෙ චරිත කතාව කියවීම වැදගත් යැයි මතක් කිරීමට කැමැත්තෙමි. ඒ අනුව බුදුරජාණන් වහන්සේ රාහුල හිමි සමඟ පිළිසඳරක යෙදුනහ. එය ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් බුදුහිමි හා රාහුල හිමි අතර සිදු වූවකි.එනම්,

| | | |
|---|---|---|
| බුදුහිමි | - | රාහුලය නුඹ කැඩපතය හඳුනනවා ද? |
| රාහුල හිමි | - | එසේය සුවාමීනි |
| බුදුහිමි | - | කැඩපත කියන්නේ කුමකට ද? |
| රාහුල හිමි | - | කණ්ණාඩියටයි ස්වාමීනි |
| බුදුහිමි | - | එය කුමක් සඳහා පවතින්නේ ද? |
| රාහුල හිමි | - | මුහුණ බලා ගැනීම සඳහායි ස්වාමීනි |

යම් කිසිවෙක් කැඩපතක් දෙස බලා තම මුහුනෙහි ඇති අපවිත්‍ර දෑ අයින් කරන්නේද? කොණ්ඩය අවුල් වී ඇත්නම් එය සකස් කර ගන්නේ ද? එලෙසම යමෙක් සිත නැමැති කැඩපත දෙස බලා සිතේ තිබෙන අපවිත්‍ර කුණු කසල ඉවත් කර ගන්නේ නම් ඔහු සිත දිනුමට මඟ හදා ගත්තෙකු වන්නේය. සිත පිළිබඳව විනිවිද දකින්නෙක් බවට පත් වන්නේය. ඔහු නිවන් මඟට යන පාර සකසා ගත්තෙකු වන්නේය. යනාදී වශයෙන් බුදුහිමි සිත පිළිබඳ තම නුවණින් තමන්ටම දැකීමට ඉඩ ප්‍රස්ථාව සලසා දී ඇත. මෙය බුදු දහමේ වීමංසාව යනුවෙන් දැක්වේ. එනම්, ඇති වන පවතින දේ පිළිබඳ විමසීමෙන් බැලීමයි. සුපරීක්ෂාකාරීවීම හෙවත් පරීක්ෂා කිරීම යනුවෙන් ද එය හැඳින්වීමට පුළුවන. තම තමා දෙසම බැලීම තුළින් තමන්ගේ සිතේ පවතින අකුසල මූලයන් හඳුනාගත හැකිය.

මෙය බැලූ බැල්මට සරල සංවාදයක් ලෙස පෙනුනද ඒ තුළ ගැඹුරු අර්ථයක් ලොවට දේශනා කොට ඇත. ශරීරය ඕනෑම කෙනෙකුට පෙනෙනු ඇත. එහි අඩුපාඩු කීමටත්, ඒවා සකසා ගැනීමටත් සත්වයාට පුළුවන. නමුදු සිත පිළිබඳ තව කෙනෙකුට නිර්ණය කිරීම අපහසු කාර්යකි.එයට හේතුව සිත තව කෙනෙකුට නොපෙනීමයි. පරචිත්ත විජානනය තිබෙන්නෙකුට සිත පිළිබඳ නිවැරදි විනිශ්චයකට ඒමට පුළුවන. එසේ නම් තම තමන්ගේ සිත පිළිබඳ නිවැරදිව දැකීමට සුදුසුම පුද්ගලයා තමාමය. තමාට තමාගේ සිත දැකීමට පුළුවන්කමක් ඇත. කැඩපතක් දෙස බලා මුහුණ සකස් කර ගන්නවා සේ තම තමා දෙස බලා සකස් කරගැනීම එයින් අවධාරණය කොට ඇත.

තම තමා දෙස බැලීම තුළින් සිතේ පවතින අපවිත්‍ර චේතනා මනාව දර්ශනය වේ. අපවිත්‍ර චේතනාව වන්නේ ලෝභය,ද්වේශය,මෝහය,මධමාන්‍ය, ඊර්ෂ්‍යා,ක්‍රෝධ යනාදියයි. එම අකුසල සිතුවිලි තමාව තමාව විනාශ කිරීමට පැමිණි සතුරන් බඳුය. සං:නි චිත්ත සූත්‍රය තුළින් චිත්තේ නීයතී ලෝකෝ යනුවෙන් සිත පිළිබඳ විවරණය කොට ඇත. සිත පිරිසිදු කර ගැනීමෙන් යහපත් ප්‍රතිඵලත් අපිරිසිදු කර ගැනීමෙන් අයහපත් ප්‍රතිපලත් ලැබිය හැක. එය චිත්ත න්‍යාමයයි.එසේනම් සිතේ පවතින ස්වභාවය සෑම පැත්තකින්ම යහපත පිණිස පවතින්නක් බව සිතිය යුතුය.

තමන්ගේ සිත පිරිසිදු කළ හැක්කේ අනුනට නොව තමන්ටමය.එයට හේතුව තම සිත පිළිබඳ විනිවිද දැකිය හැක්කේ තමන්ට පමණක් වීමය. පුහුදුන් සත්වයින්ගේ සිත් තුළ නිරන්තරයෙන් අකුසල් සිතුවිලි පැන නැගෙනු ඇත. පවුලක පියෙක් තමන්ගෙ දියණිය දෙස දියණියක් යන ආකල්පයෙන් බැලුවට වෙනත් දියණියක් දෙස ඒ ආකල්පය නැති වන්නට පුළුවන.මවක් තම පුතු දෙස බලා යන ආකල්පයෙන් බැලුවට වෙනත් තරුණයෙක් දෙස එම ආකල්පය නැති වන්නට පුළුවන. එයයි පුහුදුන් ස්වභාවය. මේ අයුරින් සෑම අංශයක් තුළම එවැනි ලාමක සිතුවිලි පහළවීම පුහුදුන් වැසියන් තුළ බොහෝ දුරට සිදුවීමට පුළුවන.එනිසා තම තමන්ගේ සිත් දෙස තම තමන්ම බැලීමට අවශ්‍ය වන්නේ, එම හේතුව නිසාය.

ලෝකයේ රහසින්වත් පව් නොකළ කෙනෙකු ඇත්නම් ඒ බුදුවරු ඇතුළු ඊට සමගාමී ව සිටින උත්තමයන්ය. නමුදු පුහුදුන් සත්වයා තුළින් රහසින් හෝ සැඟවුණු සිතින් හෝ අනන්ත අප්‍රමාණ පව් සිදුවීමට පුළුවන. සිතක් ඇතිව නැතිවන කාලය ඇසිපිය හෙලන කාලයෙන් කෝටි ලක්ෂ ගණනකින් කොටසක් තරමට අල්පය. ඒ අනුව එක සිතක් ඉපිද නැතිවනවාත් සමගම එසැනින් අලුත් සිතක් පහළවීම සිතෙහි ස්වභාවයයි. අභිධර්මය තුළ වැඩි දුරටත් සිත හා සිතුවිලි පිළිබඳ විස්තර ඇත. එයද කෙටියෙන් මතක් කිරීම සිත පිළිබඳ වැඩි අවබෝධය පිණිස සුදුසුයයි සිතමි.

1. සිත සමගම උපදී - (එකුප්පාද)
2.සිත සමගම නැතිව යයි - (ඒක නිරෝධ)
3.සිත ගත් අරමුණම ගනී - ( ඒකාලම්භන)
4.සිත ඒ අවස්ථාවේ ඇසුරු කරන චක්ඛු සෝත ආදී ප්‍රසාද වස්තුම ඇසුරු කොට පවතී -

15 පිටුවට....

කු/නික/වාරි රතනසෙල ඓතිහාසික මහ පිරිවෙනෙහි
නියෝජ්‍ය පරිවේණාධිපති
ගලගෙදර රතනවංශ හිමි.

# ප්‍රමාදය වරදක් ලෙස සළකා සෑදූ මිරිසවැටි මහා දාගැබ




සිරිලක එක්සේසත් කළ දුටුගැමුණු මහරජතුමා සම්බුද්ධ ශාසනයෙහි දියුණුව සඳහා රාජ්‍යයත්වය යොදාගත් රජෙකු ලෙස ලැබූ දුටුගැමුණු රජතුමා භික්ෂූන් වහන්සේලාට පූජානොකොට කිසිදු අහරක් අනුභව නොකෙලේය.ප්‍රමාද දෝෂයකින් මිරිස් ව්‍යංජනයක් භික්ෂූන් වහන්සේලාට පූජා කිරීමට අමතක විය. මෙම සිදුවීම රජතුමාගේ සිතට පීඩාවක් ගෙනදෙන කරුණක් බවට පත්විය. මෙම පීඩාවෙන් මිදීමට කල්පනා කළ රජතුමා ස්ථූපයක් සෑදීමට අධිෂ්ඨාන කරගෙන සිටියේය. දිනක් රජතුමා තිසාවැවේ ජලක්‍රීඩාවට යනවිට ජයකොන්තයද රැගෙන ගියේ සිරිතක් වශයෙනි.

ජල ත්‍රීඩාවට පෙර ජයකොන්තය නිදහස් භූමියක සිටුවා තබා ජලක්‍රීඩාවට සහභාගි විය.ජල ක්‍රීඩාවෙන් පසු එතැනට පැමිණි රජතුමාට ජයකොන්තය ගලවාගත නොහැකි විය. තම අභිලාෂය පරිදි ස්තූපයක් ඉදිකරන ලද මෙම ස්තූපය ''මිරිසවැටිය'' දාගැබ යන නමින් හැඳින්විය. මෙම රාජකීය පුණ්‍ය මහෝත්සවය සඳහා භික්ෂූන් වහන්සේලා මෙන්ම භික්ෂූණීන් වහන්සේලා ද දහස් ගණනින් සහභාගි වූ බව මහාවංශයෙහි සඳහන් වෙයි. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ආරාම කිහිපයක් ගොඩනැගූ බව වංශකතාවෙහි සඳහන් වෙයි. මෙම ස්තූපයේ ඇති විශේෂත්වය නම් බදාම කපරාරුවක් නොමැතිව මෙය ගොඩනඟා තිබීමය.සාංචි ස්තූපයේ ස්වභාවයක් මුල් කාලයේ මෙම ස්තූපයේ පැවැති බවට විශ්වාස කෙරේ. පසුකාලීන රජවරුන් වන පළමුවන ගජබා රජතුමා, වෝහාරික රජතුමා, පස්වන කාශ්‍යප රජතුමා මෙම ස්තූපය සහ ආරාම සංකීර්ණය ප්‍රතිසංස්කරණය කළ බවට ඉතිහාසගත තොරතුරු වලින් හෙළි වේ. පොළොන්නරු යුගයේ රජකළ පළමුවන පරාක්‍රමබාහු රජතුමා, නිශ්ශංකමල්ල රජතුමා යන රජවරුන් මෙම ස්තූපය සහ අවට සංඝාරාමයන්ද ප්‍රතිසංස්කරණය කළ බවට සාධක හමු වී තිබේ.ස්තූපයක් සඳහා සාදවා ඇති වාහල්කඩ විශේෂත්වයක් ගනී.

මෙම ස්තූපයේ සතර දිසාවෙහිම වාහල්කඩ සහ මලසුන් ගෙවල් සාදා තිබූ බවට නටඹුන් හමු වී තිබේ. බටහිර දිසාවෙහි වාහල්කඩ වර්තමානයේද දක්නට ලැබේ. වාහල්කඩ දෙපස උසින් අඩු කුලුණු දෙකක් ද ඇතුළතින් උස කුලුණු දෙකක් ද වේ. උසින් අඩු කුලුණුවල ඉදිරිපස මුදුනේ අඩකව දෙකක්ද ඒ අතර රේඛාවන්ද නිර්මාණය කර තිබේ. යටින් පතල දක්වා සිරස් තීරු දක්නට ලැබේ. අනෙක් උස කුලුණෙහි වාමනයෙකුගේ හිසමත තබාගත් පුන්කලසකින් පහළට නැගෙන කල්ප වෘක්ෂයක් හා එය මුදුනේ ඡත්‍රයට යට මල් දම්වලින් සරසන ලද ජයකොන්තය වේ. කුළුණු මුදුනේ සිංහරූප නෙලා ඇත. ස්තූපයේ විශ්කම්භය අඩි 168ක් වේ. උස අඩි 200කි. ගරාවැටීමෙන් පසු ප්‍රතිසංස්කරණය කරන ලද වර්තමානය වනවිට විශ්කම්භය අඩි 141කි. උස අඩි 192ක් යැයි ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වේ.

අනුරාධපුර යුගයේ නිර්මාණය වූ ස්තූපයන් අතරින් සුවිශේෂි ස්තූප නිර්මාණයක් ලෙසට මෙම ස්තූපය සැළකේ. රමණීය භූමි භාගයක ගොඩනගා ඇති මෙම ස්තූපය අලංකාර නිර්මාණයක් ලෙසට දැක්විය හැකිය. සොළොස්මස්ථානයට ද අයත්වන මෙම ස්තූපය දෙස්,විදෙස් සංචාරකයන්ගේ චිත්තාකර්ශනීය බවත් ඇති කරවයි. ලාංකික බෞද්ධ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වී ඇති මෙම ස්ථානය ආරක්ෂා කිරීම පෝෂණය කිරීම අප සැමගේ පරම යුතුකම වන්නේය. මෙම ඓතිහාසික වස්තූන් මතු පරපුරට දායාද කිරීම අපගේ වගකීමයි.

ඇම්.ඩී.විජයවර්ධන



# කොන්ද කන්ද විය

දඹදිව කොසඹෑ නුවර සිටි දහස් ගණනක් සංඝයා අතර කැපී පෙණුනු පුහුදුන් මහ තෙරවරු දෙනමක් වූහ. දෙදෙනා වහන්සේටම පිරිවර භික්ෂූන් පන්සීය පන්සීය බැගින් සිටියහ. එක් නමක් විනයධාරී භික්ෂු වරයෙකි. අනෙක් නම ධර්මධාරී භික්ෂු වරයෙකි.

එක් දිනෙක ධර්මධාරී මහ තෙරුනම වැසිකිළියට ගොස් සිරුරු කිස කොට ඉතිරි වූ ජලය බඳුනෙහිම තබා වැසිකිළියෙන් පිටතට ආවේය. ඉන් ටික වේලාවකට පසුව විනයධාරි තෙරණුවෝ වැසිකිළියට ගියවිට බඳුනෙහි ඉතිරි වී ඇති වතුර ටික දක ධර්මධාරී තෙරුන්ගෙන් මෙසේ විචාළහ.

ඔබ වහන්සේ සිරුරු කිසකර දෝවනය කොට ඉතිරි වූ වතුර ටික භාජනයෙහිම තබා පැමිණියේ ඇයිද? වතුර ටික ඉවත්කොට භාජනය මුණින් නමා පැමිණීම ශාසනික සම්ප්‍රදායයි. එය කැඩීම වරදකි. එයින් ඇවතක් සිදුවෙයි. එය සිහිපත් නොකළේ මන්ද?

එවිට ධර්මධර තෙරණුවෝ එය එසේ නම් එකී ඇවතට පිළියම් කරමි. පිළිතුරු දුන්හ. ඉන්පසු විනයධර තෙරණුවෝ එම ප්‍රකාශය විකෘති කොට තම ගෝලබාල අතවැසි භික්ෂූන් අමතා ඇවැත්නී, අර ධර්මචාරී තෙරනම ඇවතට පැමිණ නැවත ඇවත ගැන නොදනීයයි කීවේය. එවිට විනයධාරී ගෝලබාල පිරිස ධර්මචාරී භික්ෂුවගේ ගෝලබාල පිරිසට විහිළු තහළු කරන්නට වූහ. ඇවැත්නි, ඔබවහන්සේලාගේ ගුරුතුමා ඇවතට පැමිණ ඇවත ගැන නොදන්නා කෙනෙකි. එය ධර්මධාරීකමෙන් ඇති වැඩේ කුමක්ද?

මෙයින් කුපිත වූ ධර්මධාරී තෙරණුවන්ගේ ගෝල පිරිස තම ගුරුතුමන්ට මේ බව කියා සිටියහ. ඉන්පසු උන්වහන්සේලා විනයධාරී පාක්ෂිකයන්ට අමතා ඇවැත්නී, ඔබවහන්සේලාගේ ඇඳුරුතුමා බොරුකාරයෙකි. අසත්‍යවාදියෙකි. කලින් එකක් කියා පසුව තව එකක් කියයි. ඒ වුනත් මහා විනයධාරියෙකැයි කියා ගනියි කීහ. වැසිකිළි භාජනයේ ඉතිරි වූ මේ වතුර ටික කොසඹෑ නුවර මහා කලහයට මූලික විය. දෙදෙනෙක් අතර සිදුවූ කථාව අවසන් වූයේ කිසිවෙකුත් නොසිතූ ආකාරයෙනි. මේ කොසඹෑ භික්ෂූන් කෙන්ද කන්ද කරගත් සැටියැ.

පුහුදුන් පුද්ගලයන් තුළ ආශාව, මුළාව, සැකය, ක්‍රෝධය ඇතිවීම ස්වභාවයකි. එකී කෙලෙස් යටපත් කොට මුලිනුපුටා දැමීම බෞද්ධ පිළිවෙතයි. එදා කොසඹෑනුවර පෙර කී ප්‍රශ්නය ඇතිකරගත් විනයධාරී ධර්මධාරි දෙනමත්, ශිෂ්‍ය දෙපිරිසක් පෘථග්ජනයෝය. එනිසා හිතුවක්කාර වූහ. කාරණා කාරණ තේරුම් ගැනීමට අපොහොසත් වුහ. තමන් කරන දේ හරිය නිවැරදිය යන මිථ්‍යා විශ්වාසයෙන් නොමඟ ගියහ. ආරම්භය කුඩා ප්‍රශ්නයකි. ඇවත් දෙසාගෙන අවශ්‍ය පිළිවෙත් සපුරාලමින් එය අවසන් කරන්නට හොදටම ඉඩ තිබුණි.

එහෙත් දුරදිග නොබලා කරගත් වරද සුලුපටු නොවේ. පළමුව විනයධාරී, ධර්මධාරී දෙනම බිඳුනි. ඉන්පසු දෙපාර්ශවයේ ගෝලබාල පිරිස කෙටුනි. ටික දිනකින් ඒ ඒ භික්ෂූන්ට හිතවත් අය ඒ ඒ පැත්ත ගත්හ. අනතුරුව දායකයෝද දෙකඩ වූවෝය. ප්‍රශ්නය කොතරම් දුරදිග ගියාද කියතොත් බුදුරජාණන් වහන්සේගේ අවවාදය පවා කනකටවත් නොගත්හ.

බුදුරජාණන් වහන්සේගේ අවවාදය ද නොරිස්සූ එක් භික්ෂු නමක් උන්වහන්සේ වෙත ගොස් මේ ගැන ඔබ වහන්සේ කරදර සිත්තැවුල් ඇතිකර නොගනු මැනවි. අප මේ අවුල විසඳා ගන්නෙමු අපි එයින්ම ප්‍රසිද්ධ වන්නෙමු. මෙයට ඇඟිලි නොගසා විවේකීව තමන්ගේ පාඩුවේ සිටීම මැනවි.

එවිට තථාගතයන් වහන්සේ මහා කරුණාවෙන් ඔය ප්‍රශ්නය අත්හැර දමන්න. කෝලහල නොකරන්න. දබරකර නොගන්න. වාද විවාද නොකරන්නැයි මෛත්‍රී සහගතව අවවාද කරද්දීත් කලහකාරී භික්ෂූන් සැහැසිවූ තරම බුදුරජාණන් වහන්සේට නිහඬව සිටින ලෙස ඔවුන් කළ ප්‍රකාශයෙන් පැහැදිළි වෙයි. මේ සුළු කරුණ ප්‍රශ්නයක් බවට පත්කරගැනීමත් සමඟම වාදය දියුණු තියුණු වීමට පසුබිමේ හේතු රාශියක් විය. මේ වන විට සිවුකුලයට අයත් (ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර) එල නොලැබූ වැඩිදෙනා මේ අවුලට පැටලී ඇත. ප්‍රශ්නය නැගුනේ වතුර ටික ගැන වුවද, දබර කරගනිද්දී පළාත් භේදය කුල වාදය, භාෂා භේදය ඉස්මතු කරගෙන බැණ ගනිද්දී කුලමල කියා ගනිමින් වාර්ගික අඩුලුහුඩුකම්ද ඇද ගනිමින් වාද විවාද කළහ.

මෙයින් බලවත් කලකිරීමට පත් භික්ෂූ නමක් භාග්‍යවතුන් වහන්ස, අප කීවාට පිළිගත්තේ නැහැ. නයි පොලගුන් සේ කුලල් කා ගන්නවා, ඇනුම් පද උන්වහන්සේ වෙත ගොස් මේ ගැන ඔබ වහන්සේ කරදර සිත්තැවුල් ඇතිකර නොගනු මැනවි. අප මේ අවුල විසඳා ගන්නෙමු අපි එයින්ම ප්‍රසිද්ධ වන්නෙමු. මෙයට ඇඟිලි නොගසා විවේකීව තමන්ගේ පාඩුවේ සිටීම මැනවි.

එවිට තථාගතයන් වහන්සේ මහා කරුණාවෙන් ඔය ප්‍රශ්නය අත්හැර දමන්න. කෝලහල නොකරන්න. දබරකර නොගන්න. වාද විවාද නොකරන්නැයි මෛත්‍රී සහගතව අවවාද කරද්දීත් කලහකාරී භික්ෂූන් සැහැසිවූ තරම බුදුරජාණන් වහන්සේට නිහඬව සිටින ලෙස ඔවුන් කළ ප්‍රකාශයෙන් පැහැදිළි වෙයි. මේ සුළු කරුණ ප්‍රශ්නයක් බවට පත්කරගැනීමත් සමඟම වාදය දියුණු තියුණු වීමට පසුබිමේ හේතු රාශියක් විය. මේ වන විට සිවුකුලයට අයත් (ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර) එල නොලැබූ වැඩිදෙනා මේ අවුලට පැටලී ඇත. ප්‍රශ්නය නැගුනේ වතුර ටික ගැන වුවද, දබර කරගනිද්දී පළාත් භේදය කුල වාදය, භාෂා භේදය ඉස්මතු කරගෙන බැණ ගනිද්දී කුලමල කියා ගනිමින් වාර්ගික අඩුලුහුඩුකම්ද ඇද ගනිමින් වාද විවාද කළහ.

මෙයින් බලවත් කලකිරීමට පත් භික්ෂූ නමක් භාග්‍යවතුන් වහන්ස, අප කීවාට පිළිගත්තේ නැහැ. නයි පොලගුන් සේ කුලල් කා ගන්නවා, ඇනුම් පද කරන්නෙක්ය. ස්ත්‍රීන් කනවැද්දුම් කරන්නෙක්ය යන්නෙන් චෝදනා කළෝ එහෙයිනි. පන්සාලිස් වසක බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලය තුළම විවිධ මුහුණුවරින් සාසනික හානියට අභ්‍යන්තර බාහිර බලවේග පැන නැගී ඇත. සුන්දරී පරිබ්‍රාජිකාවගේ සිද්ධිය, චිංචිමානවිකාව, බුදුරජාණන් වහන්සේ මැරීමට දුනුවායන් යෙදීම, බිම්බිසාර රජ ඝාතනය, අජාසත් රජ බලයට පත්කිරීම, ශාක්‍ය සංහාරයට විඩූඩභ උසිගැන්වීම ආදී මේ සැම සිද්ධියකම පසුබිමේ ආගමික, වාර්ගික ප්‍රශ්න පැවැති බව විමසිල්ලෙන් බලනවිට දක්ක හැකිය. ප්‍රථම සංඝායනාවටත් මුල් වූයේ මෙසේ මෙරටින් ආ අනිසි බලවේග නොවේ යැයි කිව හැකිද?

කොසඹෑ නුවර භික්ෂූන්ටද මෙකී බලවේග අදිසි මගින් බලපා තිබේ. අර සුළු කරුණ සසුන නසන ගිනිජාලාවක් වීමට ආධාර වූයේ ඒ නිසාය. මේ සියල්ලම තියුණු නුවණින් දත් බුදුහාමුදුරුවෝ සාසන නාශක බලවේග ගැන අවබෝධ කරවනු පිණිසත් මහජන මතයකින් මහා සංඝයාගේ උඩගුබව සිඳලනු පිණිසත් පාරිලෙය්‍යය වනයට වැඩම කළහ. බුදුරජාණන් වහන්සේ හුදකලාව පාරිලෙය්‍යය වනයෙහි වෙසෙන බවත්, ඇතෙකුගේ සහ තවත් තිරිසන් ගත සතුන්ගේ ඇප උපස්ථාන ලබන බවත්, කටින් කට පැතිර ගියේය. දැන් බුදුරජාණන් වහන්සේ නුවණ ඇති ශ්‍රාවකයන්ගෙන් වෙන්ව වනගත තිරිසනුන් සමඟ විවේකීව වෙසෙතද යන රාවය භික්ෂු ගණයාට නොඉවසිය හැකි පහරක් විය.

දායකයෝ භික්ෂූන් වර්ජනය කළහ. ආහාරපාන නොලැබී ගියේය. ගරු සැළකිලි සිඳී ගියේය. යන එන සැම තැනම සංඝයාට දෝෂාරෝපණය ඇතිවිය. සියල්ලෝම අසරණ වූහ. අපට මෙතෙක් පහසුකම් ලැබුණේ කා නිසාදැයි යන්න සත් සුදක් සේ කා කාටත් අත්දැකීමෙන්ම පෙනී ගියේ එවිටය . බුදුරජාණන් වහන්සේ සොයා ගොස් වැඩමවාගෙන ඒමට මහජනයා බල කළහ. වාදකාරක භික්ෂූහු අවනත වූහ. ප්‍රශ්නය මුලදීම විසඳා නොගැනීම කෙන්ද කන්දක් බවට පත්වීමට හේතු වීය.

**රාණි ද සිල්වා**


කාලයාගේ ඇවෑමෙන්... භද්‍රා ළමා විය ඉක්මවා.. නව යොවුන් වියට එළැඹියාය...... භද්‍ර යෞවනයේ පසුවූ ඇය ඉතා රූමත් ...සිටු දියණියකි...
2
ථෙරී ගාථා ඇසුරෙනි
භද්‍රා කුණ්ඩලකේශී
දිනක්
නාඹුලා.. දන්නවද වැඩක්.... අපේ රජතුමාගෙ අග්‍ර පුරෝහිත තුමාගෙ පුතා සත්තුක ගැන
...ඔව්.. ඔව්.. බොහොම හැඩිදැඩි ලස්සන.. තරුණයෙක්..
ආන්න.. ඒ.. සත්තුක මොකක්ද ලොකු හොරකමක් කරලා... අහුවෙලාලු.. අද.. හෙට දඬුවම් නියම.. කරනවාලු
රාජ මාළිගාවේදී
අවසර රජතුමෙනි... දඬුවම් නියම කිරීම ..සඳහා.. පුරෝහිත ..පුත්...
ඔබවහන්සේ ඉදිරියට... පැමිණ වීමට.. අවසර ලබා දෙන්න..
හොඳයි.... අවසර ලැබෙනවා
..දැක තිබෙනවා.. ...මේ.. අය පැමිණ ..සිටින්නේ ඒ ගැන ..සාක්ෂි ලබාදීමටයි..
තරුණ විමසීමෙන් පසු රජතුමා.....
තරුණ විමසා බැලීමෙන් තේරුම් යන්නේ තමා මේ වරද කර ඇති බවයි... සත්තුක.. නුඹ කළ වරදට දඬුවම ....මරණයයි.....




# නොපෙනෙන දෙනෙතට දෙනෙතක් විය හැකිනම්...

නොපෙනෙන දෙනෙතට
දෙනෙතක් විය හැකි නම්
හඬ නැති මුවගට කටහඬ විය හැකි නම්
අහිමි වූ දෙපයට පා යුග විය හැකි නම්
පොඩි මිතුරෝ මම නුඹ සිප ගන්නම්

කළුවර අහසේ සඳක් වෙලා පැළ
එළි කළ හැකි නම්
නියං සමේ මහ වැවක් වෙලා
වාන් දැමිය හැකි නම්
පොඩි මිතුරෝ මම නුඹ සිප ගන්නම්

මං පෙත මහ නුග තුරක් වෙලා
සෙවණ සැදිය හැකි නම්
දාහය දුරලන පවන් සලා
සුළඟක් විය හැකි නම්
පොඩි මිතුරෝ මම නුඹ සිප ගන්නම්

ගේය පද - මහාචාර්ය සුනිල් ආරියරත්න
සංගීතය හා තණුව - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - විශාරද නන්දා මාලිනී



මේ පෘථිවි තලය තුළ මිනිසා නම් සත්ත්වයා සාර්ථකව පවතින්නේ ඔහු සතු අසීමිත හැකියාවන් සහිත මොළය නිසාය. මිනිසා වනචාරී යුගයෙන් ශිෂ්ටාචාර යුගයට පැමිණ සිය බුද්ධිය මෙහෙයවා විවිධ නව නිපැයුම් බිහි කරමින් පිට සක්වලට පවා සිය අණසක පතුරුවන්නට උත්සාහ දරමින් සිටී.

භෞතික වශයෙන් මිනිසා කෙතරම් දියුණුවක් ලබා සිටිය ද ඔහුගේ පැවැත්ම රඳා පවතින්නේ මානුෂීය සබඳතා මතය. නෑදෑ හිත මිත්‍ර සම්බන්ධතා, දූ දරු සබඳතා , අඹු සැමි සබඳතා ආදී වශයෙන් වූ අන්තර් පුද්ගල සම්බන්ධතා සමාජීය සත්ත්වයෙක් ලෙස නොනැසී ජීවත් වන්නට අත්‍යවශ්‍යය.

එහෙත් වර්තමානයේ අප දකින්නේ හැඟීම්බර මානුෂීය සබඳතා නොව යාන්ත්‍රීකරණය වූ මානව සබඳතාය. භෞතික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදල් පසු පස දිවයන මිනිසා නවීකරණය, සුඛෝපභෝගීත්වය උරුමකර ගත්ත ද එයින් සෑහීමට පත් වන්නට ඔහුට හැකි වී නොමැත. අධිකව වෙහෙසට පත්ව අභිප්‍රායන් ඉටු නොවීම පිළිබඳ කළකිරීමට පත් වන මිනිසාට තමා අතහැර දැමූ හෝ ඈත් කළ හැඟීම් බර සබඳතා සිහියට නැගෙයි . එහෙත් ඒ වන විට එම සබඳතා සියල්ල බිඳවැටී අවසන් ය.

මූල්‍යමය භෞතික ලොව තුළ අතර මං වූ මිනිසා ක්‍රියා කරනු ලබන්නේ පටු පරමාර්ථ මුල් කරගෙන ය. එනිසා මිනිසා ආත්මාර්ථය සාධනය කරගන්නටම වෙහෙස වෙයි. තම ආත්මාර්ථය උදෙසා ක්‍රියා කරන විට මිත්‍රත්වය , සහෝදරත්වය මෙන්ම තම මව, පියා, බිරිඳ, සැමියා, දූ පුතුන් ආදී කිසිදු සබඳතාවක් වැදගත් යැයි නොහැඟෙයි. සොරකම්,අල්ලස් හා දූෂණ , මිනී මැරුම් , ස්ත්‍රී දූෂණ හා ළමා අපයෝජන ආදී විෂමාචාරී ක්‍රියා ව්‍යාප්ත වන්නේ මේ ධර්මතා විහීන වීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

මනුෂ්‍යත්වයට උරුම වූ සංවේදීත්වය විනාශ වීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ මිනිස් වර්ගයා මෙලොවින් තුරන් වීමයි. එනිසා ක්ෂය වෙමින් යන මානව ධර්මතා යළි ගොඩ නැගීමට උත්සුක විය යුතුය. ඒ සදහා මූලික අඩි තාලම දැමිය යුත්තේ අපේ දරු පරපුර සුසංවේදී අය  බවට පත් කිරීමෙනි.

අතීතයේ දරුවන් සුසංවේදී අය බවට පත්කරනු ලැබුවේ මවගේ ප්‍රථම ආමන්ත්‍රණයත් සමගමය. මවගේ සොඳුරු නැළවිලි ගී හඬින් නැළවී සැනහී නින්දට වන් දරුවා සරළ ගී තනුවක රිද්මය හඳුනා ගනියි. මවගේත් පියාගේත් අනෙකුත් වැඩිහිටියන්ගේත් ළබැඳි ආදරය මැද දිවි ගෙවූ දරුවා ආදරය , කරුණාව, සංවේදී බව මනාව හඳුනා ගත්තේ ය. කවි, ගීත, කතන්දර , චිත්‍ර ආදිය මගින් ජීවිතයේ වින්දන පරාසය පුළුල් කර ගන්නට ඔවුන්ට හැකි විය.

එහෙත් වර්තමානයේ න්‍යෂ්ටික පවුල් ඒකකයක් තුළ භෞතික වස්තූන් මුදල් පසුපස යන සමාජයක දිවි ගෙවන දරුවන් ජීවිතය විඳීම වෙනුවට විඳවීම උරුම කර ගෙන සිටී. මානසික අවපීඩනයක් සහිත පරිසරයක ජීවිතය විඳවන දරුවෝ සිය පීඩනය පිට කරන්නේ තමාටත් සමාජයටත් අහිතකර අන්දමිනි. එහෙයින් යළිත් ඔවුන්ගේ හදවත ආමන්ත්‍රණය කළ හැකි ක්‍රමවේදයක් අප සොයා යා යුතුය.

සුනිල් ආරියරත්නයන් උත්සාහ දරන්නේ මෙලෙස දරුවන්ගේ හදවත ආමන්ත්‍රණය කරන්නට ය. දෙනෙත් නොපෙනෙන මිනිසෙකුට දෙනෙතක් සේම හඬ නැති මුවගකට හඬක් සේම අහිමි වූ දෙපයකට දෙපයක් සේම අසරණවූවන්ට ඉන් මදක් හෝ සහනයක් ලබන්නට උපකාර කළ හැකි නම් කෙතරම් අගනේ ද?

කළුවර පැතිරුණු අහසක අඳුර මිස අන් කිසිවක් නොපෙනේ. එය බලාපොරොත්තු වලින් තොර ජීවිතයකට සමාන කළ හැකිය. කිසිවක් නොදැනෙන නොපෙනෙ අඳුරු වූ ලොවක් එළිය කළ හැක්කේ සඳුගෙන් පමණි. බලාපොරො--ත්තුවක් නොමැති අසරණ ජීවිත වලට බලාපොරොත්තුවක් ලබා දිය හැකි නම් ඔවුන් ජීවත් වන්නට වෙර වීරිය ගනු ඇත.

නියං සමයට මහා වැවක් වීම ද ජීවිතයේ බලාපොරොත්තු අවසානය තෙක්ම සිඳී ගිය විට යළි ප්‍රාර්ථනා නැමැති දියවරින් ප්‍රාණය ලබා දීමකි.

සුනිල් ආරියරත්නයෝ ගීතයේ සෑම යෙදුමකින්ම අරුත් ගන්වන්නේ අසරණ වූ සමාජයට සරණක් වන ලෙස ය. ඔවුන්ට ජීවිතය සඳහා නැවුම් ඇරඹුමක් ලබා දෙන ලෙසය. ලොවක් සුන්දර කරන්නට හැකියාව ඇත්තේ ළමයින්ට ය. එනිසා ඔවුන්ට යහ මග පෙන්වා දෙමින් ඔවුන් වෙනුවෙන් යහපත් සමාජයක් ගොඩ නැගීම වැඩිහිටියන්ගේ වගකීම විය යුතුය. නොනිමි තරගයකට ඔවුන් මෙහෙයවනවා වෙනුවට ඔවුන්ට ජීවිතය වින්දනය කරමින් යහපත අයහපත තොරා බේරා ගනිමින් සමාජයේ ද යහපත උදෙසා සේවය කරන්නට යොමු කළ යුතුය.

සුනිල් ආරියරත්නයන් සිය ගීයට යොදා ගන්නා බස් වහර ද ඉතා ළගන්නා සුළු ය. දරුවන්ගේ හදවත ආමන්ත්‍රණය කරමින් ඔවුන් සුසංවේදී පිරිසක් බවට පත් කරන්නට ඔහු ගන්නා වෑයම අතිශය අගනේ ය. රෝහණ වීරසිංහයන් ගේ සංගීතය ද ගීතයේ හද බස තවත් අරුත් ගන්වමින් සංවේදී බවක් ඇති කරමින්  ගලා යයි. නන්දා මාලනියගේ දාර්ශනික හඬ මුසුව ගීතයේ ස්වරය හා අප සුසංයෝග කරවයි.

චාමිකා ජනානි ද සිල්වා

# පංච සීල පිළිවෙතින් මානව හිමිකම් රැකෙන හැටි



මානව අයිතිවාසිකම් ලෙස සැළකෙන්නේ මිනිසෙකු වශයෙන් උපත ලබාගත් තැනැත්තෙකුට ජන්මයෙන් හිමිවූ නිදහස භුක්ති විඳීමේ ඉඩ ප්‍රස්ථාව සැලසීමයි.

බුදු සමයේ මූලිකාංගයක් මෙන්ම ගිහි සමාජයේ නිත්‍ය සීලයක් වූ පංච සීල පිළිවෙත මානව අයිතීන් සුරැකීමේ නිවැරදි මාර්ගයක් වේ. ලෝකයේ මානව අයිතීන් උල්ලංඝණය කෙරෙන විවිධ අවස්ථා හා විවිධ සිදුවීම් ගැන නිරන්තරව අසන්නට ලැබේ. ඒ සියල්ලෙන් මිනිසාට ආරක්‍ෂා වීමට හැකි පහසු මෙන්ම යෝග්‍යය ප්‍රතිපත්ති මාලාව පංච සීලයයි.
බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී සීලය හඳුන්වා ඇත්තේ සම්පත්තියක් වශයෙනි. එයින් අදහස් කරන්නේ උදාර මිනිසෙකු වීමට සීලය සම්පතක් වන බවයි. බුදු දහම උගන්වන සෑම ආචාර ධර්මයකම පදනම වන්නේ කරුණාව හා මෛත්‍රියයි. කරුණාව ලෙස සැලකෙන්නේ දුකට පත් සත්වයන් සුවපත් කිරීමේ කැමැත්ත වන අතර මෛත්‍රිය යනු සියලු සත්ව වර්ගයාම සුවපත් වේවා දුකින් මිදේවා යන ප්‍රාර්ථනයයි. මේ හැඟීම් යමෙකු තුළ පවතින්නේ නම් ඔහු මානව අයිතිවාසිකම් සුරකින පුද්ගලයෙකු වන අතර අනිවාර්යෙන්ම ඒ තැනැත්තා පන්සිල් රකින කෙනෙකුද වනු ඇත.

'සෑම පුද්ගලයෙකුම ජීවත් වීමටත් නිදහසේ හැසිරීමටත් පෞද්ගලික ආරක්‍ෂාවටත් හිමිකම් ඇත' යනු මානව අයිතිවාසිකම් සම්බන්ධ විශ්ව ප්‍රකාශනයේ එක් කොටසකි. එහි ප්‍රධානම පරමාර්ථය වන්නේ මිනිස් ජීවිතය පිළිබඳ ආරක්ෂාවයි.

සමස්ථ ලෝකවාසී සත්ව ප්‍රජාවටම නිදහසේ ජීවත්වීමේ උරුමය හිමිකර දෙන වැදගත්ම ශික්ෂා පදය වන්නේ පංච සීලයට ඇතුළත් පළමුවැන්න වන **පාණාතිපාතා වේරමණි සික්ඛා පදං සමාදියාමි** යන්නයි තමන් තමන්ගේ ජීවිතයට වඩාත් ආශා කරන බව

'අත්තාහි අත්තනො නාතෝ කොහී නාථෝ පරෝසියා'අත්‍ථා නං උපමංකත්‍වා'නහනෙය්‍ය නඝාතයෙ

යන බුදු වදනින් පිළිඹිබු වන අතර එසේ තමන් ආශා කරන්නාක් මෙන් අන්‍යයන් ද ඔවුන්ගේ ජීවිතයට ආශා කරන බව සිතා කටයුතු කිරීමට පෙළඹීම මානව අයිතිය තහවුරු කරන්නකි. සෑම අවස්ථාවකම තමා උපමා කොටගෙන වේදනාවට දුකට හා මරණයට තමන් ද අකමැති බව සිතා ගැනීම මේ තත්ත්වය තවදුරටත් තහවුරු වන අවස්ථාවක් වේ. වෙනත් සත්වයකුගේ ජීවිතය තොර කිරීමෙන් වැළකීමට පොරොන්දු වීම පළමු ශික්ෂා පදයෙන්ම සිදුවන අතර එයම මානව අයිතිය පංචසීල පිළිවෙත හා බැඳී ඇති බවට වන සාධකයකි.

දිවි පැවැත්මේ අයිතිය මෙන්ම දේපල අයිතිය සම්බන්ධව ද මානව අයිතිවාසිකම් පිළිබඳ වන විශ්ව ප්‍රකාශනයේ ඇතුළත්ව තිබේ. කිසිවෙකු සතු දේපළ බලෙන් අහිමි කළ නොහැකිය යනු එහි සඳහන් වගන්තියකි. අනුන් සතු දෑ සොරකම් කිරීම භාණ්ඩය අයිති තැනැත්තාගේ කැමැත්තකින් තොරව තමා සතු කර ගැනීම නොකළ යුතු බව **අදින්නාදානා වේරමණි සික්ඛාපදං සමාදියාමි** යන පදයෙන් ප්‍රකාශ වේ. සොරකම යනු තවත් අයෙකුට හිමි දේපළක් අයිතිකරුවාට බලෙන් අහිමි කිරීමකි.

වර්තමාන සමාජයේ සිදුවන බොහෝ අපරාධ ගැටුම් කලකෝලාහල වැනි දෑ කුමන හේතුවක් පදනම් කොටගෙන ඇතිවී දැයි විමසා බලන්නෙකුට පෙනී යන්නේ බොහොමයක් හේතුවලට පදනම් වී ඇත්තේ පංච සීල ප්‍රතිපත්තියේ තෙවන ශික්ෂා පදය වන **කාමේසුමිච්ඡාචාරා වේරමණි** යන ශික්ෂා පදය ආරක්‍ෂා නොකිරීම බවයි. වැරදි කාම වස්තූන් කෙරෙහි ලොල්වීම මගින් වෙනත් තැනැත්තෙකුට හෝ තැනැත්තියකට මුහුණපෑමට සිදුවන දුෂ්කරතාව ඔහුගේ හෝ ඇයගේ අයිතිය පැහැර ගැනීමක් වේ.

තමා කැමති කෙනෙක් හා විවාහ වීම ඔහු හෝ ඇය සමඟ කැමති ප්‍රදේශයක ඔවුනොවුන් රුචිකරන පරිදි ජීවත්වීම මානව හිමිකමකි. කම්සැප විඳීම ගිහි සමාජයට අහිමි වූවක් නොවේ. බුදු දහමින් එයට ඉඩකඩ ලබා දී ඇතත් කාමයෙහි වරදවා හැසිරීම නොකළ යුත්තක් ලෙස දක්වා තිබේ. යම්කිසි පුරුෂයකු හෝ ස්ත්‍රියක විසින් යථෝක්ත වැරදි මග අනුගමනය කරන්නේ නම් ඒ හේතුවෙන් ඔවුන්ගේ පවුල් දිවිය විනාශ වී යයි.

ගෙදර දොර සාමය සමගිය නැතිව යයි. ඒ නිසාම මුලු මහත් සමාජයම නොසන්සුන් තත්වයට පත්වේ. අහිමි කාම වස්තූන් කෙරෙහි ඇලුම් කිරීමෙන් දෙමාපිය දූ දරු සබඳතා හා ස්වාමි භාර්යා සබඳතා කැඩී යාමක් සිදුවන බැවින් එය තවත් පිරිසක් සතුවන මානව අයිතිය අහිමි කිරීමකි. ඕනෑම දරුවෙකුට දෙමාපිය ආදරය සෙනෙහස කරුණාව නිරතුරුවම ලැබීමේ හිමිකම් තිබේ. වැරදි කාම සේවනයට යොමුවීමෙන් අවුල් වියවුල් වී යන පවුල් වලට අයත් දරුවන් හුදකලා බවට පත්වේ.

එබන්දක් සිදු වෙතොත් එයද දරුවන් උපතින්ම උරුම කරගත් හිමිකමක් නොලැබී යාමකි. දරුවන් සතු අයිතිය උදුරා ගැනීමකි.

බොරු කීමෙන් වැළකීම උසස් ගුණ ධර්මයක් මෙන්ම බෞද්ධ පිළිවෙත් අතර වැදගත් තැනක් හිමි කර ගනු ලබන්නකි. බොරු කියන හා බොරු කරන පුද්ගලයන් නිසා සමාජය දූෂිත වේ. මුසාබස් දොඩන්නාට සමාජයේ ගෞරවනීය ස්ථානයක් හිමි නොවේ. ඔහු කිසිවෙකු විශ්වාස නොකරන පිළිකුලට භාජනය වන්නකු වෙයි. බොරුවක් කියන අයෙකු එය කරන්නේ තමා සමඟ ජීවත් වන තවත් කෙනෙකු හා කණ්ඩායමක් මුලාවට පත් කිරීමේ අදහසිනි. යමෙක් සිතාමතාම තවත් කෙනෙකු මුලා කිරීම ඔහුගේ මානව හිමිකම උල්ලංඝණය කිරීමකි.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් විනය ශික්ෂාවන් පැනවීමේදී තමා සතු නොවන ගුණයක් තමන් වෙත ඇතැයි ප්‍රකාශ කිරීම එසේ ප්‍රදර්ශනය කිරීමට උත්සාහවත් වීම භික්ෂූත්වය පවා නැති වී යන වරදක් සේ හඳුන්වා දෙති. සතර පාරාජිකාවන්ගෙන් එය ද එකකි. අප වෙසෙන වත්මන් සමාජයේ නැති ගුණ පෙන්වන ප්‍රසිද්ධියේ මෙබඳු දේ ප්‍රකාශ කරන අය බොහෝ සිටිති. බෞද්ධ ඉතිහාසයේ එන පූල්ලතිස්ස තෙරුන් වහන්සේගේ කතා ප්‍රවෘත්තිය මෙයට හොඳම නිදසුනක් වේ. උන්වහන්සේ කළේ තමන් මාර්ගඵලලාභි වයෝවෘද්ධ මහා තෙරනමක් වශයෙන් පෙනී සිටිමින් පැමිණෙන සෙසු භික්ෂූන් වහන්සේලාගෙන් වැදුම් පිදුම් ගරු බුහුමන් ලැබීමයි. එතැන්හිදි පූල්ලතිස්ස තෙරුන් කළේ වෙනත් භික්ෂූන් වහන්සේලා සතු මානව හිමිකම් අහිමිකර දැමීමකි. කෙනෙකු ව්‍යාජ සහතික පත්‍ර සකසා ගෙන උසස් රැකියාවක් ලබාගත හොත් ඔහු කරන්නේ සැබැවින්ම එම තත්වයට හිමිකම ඇති අයගේ අවස්ථාව වැරදි ලෙස උදුරා ගැනීමකි. **මුසාවාදා වේරමණි සික්ඛාපදං සමාදියාමි** යන පොරොන්දුව මනාව ආරක්ෂා කිරීම මානව හිමිකම් රැක ගැනීමක් වශයෙන් පෙන්වා දිය හැකිය. අද ලෝකයම ගිලගෙන ඇති විශේෂයෙන් තරුණ පරපුර විනාශ කරන භයානක රකුසෙකුගේ තත්වයට පත්ව ඇති සුරාව හා වෙනත් මත්වන ද්‍රව්‍යයන්ගෙන් වැළකීම **සුරාමේරය මජ්ජපමා වේරමණී සික්ඛාපදං සමාදියාමි** පංච සීලයට ඇතුළත් ශික්ෂාවකි. බුදුරජාණන් වහන්සේ එබඳු ශික්ෂා පදයක් පනවන ලද්දේ සුරාව පුද්ගලයාගේ මදයට හා ප්‍රමාදයට හේතුවන නිසයි.

තමා උපයා ගන්නා මුදල් වැයකර තමාට මත්ද්‍රව්‍යය මත් පැන් පානය කිරීමේ අයිතියක් ඇතැයි කෙනෙකුට තර්ක කළ හැකිය. එහෙත් ඔහුගේ එම ක්‍රියාව නිසා සෙස්සන්ට හිරිහැරයක් දෙයිද ඒ මානව හිමිකම් විනාශ කිරීමකි. මත්පැනට ඇබ්බැහි වූ ඇතැම් පියවරු නිවසට පැමිණ ඔවුන්ගේම භාර්යාවන්ට හිරිහැර කරමිනි.

දරුවන්ට අධ්‍යාපන කටයුතුවලට කරන බාධාවකි. ඒ හේතුවෙන් ඔවුන්ගේ හිමිකම් නැතිවී යයි. තවත් අවස්ථාවක වාහනයක් පදවන රියදුරෙකු මත්පැන් පානයෙන් මහමඟ යන එන අයගේ ජීවිතවලට මහත් තර්ජනයක් කරයි නම් එයද මිනිසාට ඇති නිදහසේ ප්‍රයෝජනයක් නැතිවන මොහොතකි. පොදු වාහනයක හෝ පෞද්ගලික වාහනයක හෝ ප්‍රසිද්ධ ස්ථානයක අවිනීත ලෙස යමෙකු හැසිරෙතැයි සිතමු. එයද තමා අවට සිටින්නවුන්ගේ මානව අයිතියට බාධාවකි.

වර්තමාන ලෝකයේ මානව හිමිකම් සුරැකීම සම්බන්ධ විවිධ සංවිධාන බිහිවෙමින් අහිමිවන අයිතීන් රැක ගැනීමට නානා මාදිලියේ ක්‍රියා මාර්ග යෙදෙන බව පැහැදිලි කාරණයකි. එහෙත් මීට වසර 2551 කට පෙර බුදුරජාණන් වහන්සේ ගිහි සමාජයට නිරන්තරයෙන් ආරක්‍ෂා කිරීම පිණිස දේශනා කොට වදාළ පංච සීල පිළිවෙත ඕනෑම රටක ඕනෑම ජනතාවකට උචිත වන මානව හිමිකම් ආරක්‍ෂා කිරීමේ උසස් පොදු ප්‍රතිපත්ති මාලාවක් ලෙස හැඳින්වීම සුදුසුය.

බුදුරජාණන් වහන්සේ වැඩ විසූ වකවානුවේදි පමණක් නොව අප ජීවත්වන විසි එක්වන සියවසේදි ද අනාගතයේදි මිනිස් අයිතිය සුරැකෙන ලෙස පංචසීල පිළිවෙත ලොවට හඳුන්වා දුන්හ. මානව හිමිකම් යලි ආරක්‍ෂා කිරිමට වෙර දරන පුද්ගලයින්ට හා සංවිධාන වලට ඒ සඳහා පහසුවෙන් ක්‍රියාත්මක කල හැකි සාර්ථක වැඩ පිළිවෙලක් වන්නේ ජනතාවට පන්සිල් ආරක්ෂා කිරීමට පෙළඹවීමය.

මහේෂ් සේනාධීර

# පරහට තැවුල්වන උණුවෙයි සුදන හද එලෙසට උණු නොවෙයි එබැවින් වෙඬරු තද



දින සති මාස ගෙවෙමින් වසරක් ගෙවී ගොස් නව වසරක් උදාවීමට තවත් ඇත්තේ ටික කාලයකි. ඒ අපේ ගෙවී ගිය කාලය තුළ කෙතරම් නම් වෙනස්වීම්, අපේ ජීවිතය තුළ අපේ සමාජය තුළ සිදු වුවාද? කෙතරම් දුක්බර කතා පුවත් අපට අසන්නට දකින්නට ලැබුණාද? මල් වැනි කුඩා දරුවන් ඉතා අමානුෂික ලෙස ඝාතනයට ලක්වූවාද? ආදරණීය දෙමාපියන් දරුවන් විසින් කොපමණ පීඩාවට පත් වූවාද? මෙවන් දේ පිළිබඳව නැවත නැවත කතා කරමින් සිත් වේදනා ඇති කර ගැනීම මාහැඟි අන්දමට අනවශ්‍ය දෙයකි.

එසේ වුවත් මේ බෞද්ධ රට, මෙතරම් පිරිහීමට ලක්වූයේ කුමන හේතුවක් මතද යන්න මිනිසත් බවෙන් යුතු පිරිසට පැන නැගෙන ප්‍රශ්නයකි. අප ඒවාට විසඳුම් සෙවීමට යත්න දරන්නේ විපත සිදුවී හමාර වූ පසුවය. මේ ලිපිය ලිවීමට මා අදහස් කළේ ඒ පිළිබඳව කතා කීමට නොවේ.

අපේ සිංහල සාහිත්‍යයේ එන කෘතින්ගෙන් සමහරක් වත්මන් සමාජයේ සිදුවන විවිධාකාරවූ විපර්යාසයන්ට උචිත උපදේශයන් ඒවාට හේතූන් දක්වා තිබීම නිසා ඒ පිළිබඳව යමක් පැවසීම උචිත යැයි මා හට හැඟී ගිය හෙයිනි.

මා මාතෘකාව ලෙස යොදා ගත් පාඨය උපුටා ගනු ලැබුවේ එවන් අනගි කෘතියක් වන අලගියවන්න මුකවෙටි පඬිතුමා රචනා කළ "සුභාෂිතය" නම් වූ ඉතා වටිනා උපදේශ කාව්‍ය කෘතියෙනි. එහි වර්තමාන සමාජය තුළ පවතින දුසිරිත් දුරාචාර වළක්වාලීමට මිනිසෙකු සුමඟට ගැනීමට මහත් වූ පරිශ්‍රමයක් දරා ඇති බව අපට පෙනී යන කරුණකි.

එහි සඳහන් අන්දමට,

***මුදුවට සිනිදු වෙඬරුද සුදනන් හදද***
***සරිකොට කිවත් කිවි දන නොමවෙයි එලෙද***
***පරහට තැවුල් වන උණුවෙයි සුදන හද***
***එලෙසට උණු නොවෙයි එබැවින් වෙඬරු තද***

(සුභාෂිතය 61 කවිය)

එනම් කවියන් මෘදු ගතිය හැඳින්වීමට සිනිඳු වූ වෙඩරුත් සත්පුරුෂයන්ගේ හදවතත් සමාන යයි කියා ඇතත් එය එසේ නොවේ. අනුන්හට දුකක් ඇතිවූ කළ සුදනන්ගේ හදවත උණුවෙයි. වෙඩරු එලෙස උණු නොවෙයි. එනිසා වෙඩරු සුදනන්ගේ හදවතට වඩා තදය." යන්න කවියා පෙන්වා දෙයි.

මේ අන්දමට ඉතා වටිනා ඔවදන් රැසක් මෙම කෘතියෙහි සඳහන්ව ඇත. කවිය රචනා කළ මුකවෙටි පඬිතුමා දක්වන්නේ එසේ වෙඩරු වලට වඩා ඉක්මනින් අනුන්ගේ විපතකදී සත්පුරුෂයන්ගේ හදවත උණුවන බවයි. වෙඩරු එලෙසට උණු නොවන බව දක්වා ඇත්තේ සුදනන්ගේ හදවතට වඩා වෙඩරු තද බව හැඟවීමටය. නමුත් වෙඩරු ඉතා සිනිඳු වූ දෙයකි.

වත්මන් සමාජය දෙස බලන විට මෙම උපදේශය එදාට වඩා ගැලපෙන්නේ අදටය. අද සමාජයේ සිදුවන බොහෝමයක් විපත්වලට මූලික හේතුවක් වන්නේ සත්පුරුෂයන් දුර්ලභවීමයි. තමා පිළිබඳව පමණක් සිතන පිරිසක් බිහිවී සිටීමයි. බුදුන් වහන්සේ දෙසූ අන්දමට පළමුව තමා පිළිබඳවත් සිතිය යුතුය.

තමාට මෛත්‍රී කරගත යුතුය. නමුත් ඒ මෙත් සිත තමාගෙන් පටන්ගෙන මුලු විශ්වය පුරා පැතිරවිය යුතු බව බුදුන් වහන්සේ කරණීය මෙත්ත සූත්‍රයෙහි සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා යනුවෙන් දේශනා කර තිබේ. ඒ ආත්මාර්ථය පතා ගෙන දෙසූ දේශනාවක් නොවේ. සියලු සත්වයෝ සුවපත් වෙත්වා" යන උතුම් ප්‍රාර්ථනාවයි.

බොදුනුවන් වෙසෙන රටක් වන අප දේශයේ කෙතරම් නම් අපරාධ අකටයුතුකම් සිදුවනවාද? පෙරට වඩා අද අති දියුණු තාක්ෂණයක්ද පවතී. එනමුත් ඒ තාක්ෂණය පවා තමන්ගේ සහ අනුන්ගේ යහපත උදෙසා යොදා ගන්නේ කෙතරම් සීමිත පිරිසක්ද? මෙපමණ බණ දහම් අසා දන්පින් කරන රටක් ලොව කොතැනකවත් නැති තරම්ය. ලක්දිවට බුදුදහම ගෙන මිහිඳු හිමි වැඩිදා පටන් අපේ බොදු ජනතාව ඉතා දැහැමෙන් සෙමෙන් දිවි ගෙවූහ.

තමන් කෑමට ගත් බත් පිඩ පවා අනුන්ගේ කුසගින්න දුරුකිරීමට පරිත්‍යාග කළ ජාතියක වර්තමානය ඉතා සෝචනීයය. විපත දුටු තැන අත පොරවා බලා සිටි සිහලුන් එදා දක්නට ලැබුණේ නැත. එක හූ හඬකින් විශාල ප්‍රදේශයක් රැස්කිරීමට කටයුතු කළ පිරිසක් ලෙස එවකට මුලු ලෝකයම ශ්‍රී ලාංකිකයින් හඳුනාගෙන සිටියහ.

නමුත් අද සිදුවන මිනීමැරුම්, මංකොල්ලකෑම්, වංචා, දූෂණ දුටු විට ඒ දෙස බලා සිනාසීමට හෝ එය ඡායාරූප ගත කිරීමට බලාසිටින පිරිස බහුල වුවත් සිදුවන හානිය වළක්වාලීමට කටයුතු කරන පිරිස සීමිතය. ආත්මාර්ථකාමීන් පිරිසක් අප රට තුළ බිහිවෙමින් පවතී.

ඔවුන්ට අවශ්‍ය වූ දෙය දියුණු තාක්ෂනික මෙවලම් මගින් සිදුකර හමාර වී විපත දෙස බලන විට සිදුවීමට ගිය විපත සිදුවී හමාරය.

අනුන්ගේ විපතකදී හදවත කම්පා වෙයි නම් ඒ පුද්ගලයා කරුණාවන්ත යෙකි. බුදුන් වහන්සේ දෙසූ ලෙසට

**"පරදුක්ඛේ සති සාධුනං හදය කම්පනං කරෝතීති කරුණා"**

යනුවෙන් අනුන්ගේ දුකේදී හදවත කම්පා වෙයි නම් එය කරුණාවයි. නමුත් අවාසනාවකට අපට අද දක්නට ලැබෙන්නේ එවන් පුද්ගලයන් නොවේ.

මහලු මඩමේ සිටින මවුපියන් දරුවන් වෙනුවෙන් දහදිය වැගිරවූ, කඳුලැලි වගුරන විට ළමා නිවාසයේ මව්පිය සෙනෙහස නැති දරුවන් සෙනෙහස අයදින විට මහමඟ සිටින යාචකයන් කුසගිනි නිවා ගැනීමට දෑත දිගු කරන විට උපේක්ෂාවෙන් ඉවසා ඔවුන්ගේ දුකට මදක් කන් දුන්නොත් ඔබ අප හැමදෙනාගේම නෙතඟ තෙත්වනු ඇත. නමුත් අද දියුණු කාර්යබහුල ලෝකය මිනිසාගේ හදවත යාන්ත්‍රිකව හැඩගස්වා ඇත්තේය. ඒනිසාම මිනිසාගේ විවේකයද අඩුවී ඇත. ගුණදහම්, සාරධර්ම ඈත්වී ගොස්ය.

නමුත් අප මදක් සිතා බැලුවහොත් නිවස තුළින් දරුවන්ගේ හදවතට යහපත් ගුණදහම් සිරිත් විරිත් ඇතුළත් කළහොත් ආගම දහමට නැඹුරු කරන්නේ නම් ඒ තුළින් බිහිවන ලෝකය වෙඩරු පිඩක් නොවේ. සත්‍ය වශයෙන්ම එය කරුණාබර ලෝකයකි.

පරහට තැවුල්වන විට උණුවන හදක් ඇති සුදනන් පිරිසක් ජීවත් වන සමාජයකි. අනාගතයේදී අවාසනාවන්ත දේ ඇසීමට දැකීමට නොලැබෙනු ඇත. එසේනම් ජාති, ආගම්, කුලභේද, පක්ෂ පාට භේද නොසලකා එකම මවකගේ දරුවන් ලෙස විපත දුටු තැන නැගී සිටින අයුක්තිය, අසාධාරණයට හිස නොනමන ආත්මාර්ථකාමීත්වයෙන් තොර මෙත් සිතක් මෘදු හදක් ඇති පිරිසක් අප සමාජයෙන් බිහිවන්නට එක සිතින් පතන්නෙමු.

**එස්. දිල්රුක්ෂි**



# පස්කම් සැපයට ගිජුවී නොයමු අප සැම නිරයට

අද ලොව කැළඹෙන්නේ කරුණු තුනක් පාදක කරගෙනයි. පළමුවැන්න අධිසුඛෝපභෝගී ජීවන රටාවකට කැදර වූ බලවතුන් ලෝකයේ සම්පත් බහුතරයක් තමා සතුකර ගැනීමේ තෘෂ්ණා බරිත අධිවේගී ගමනයි. දෙවැන්න නම් තමන් පමණක් බලවතා විය යුතු යැයි පුද්ගලයින් හා රටවල් අසාධාරණ මිථ්‍යාමතයක එල්ලී තමා පරයා නැගී සිටින්නවුත් පාගා දැමීමට ගෙනයන තරඟකාරී ක්‍රියාමාර්ග. තුන්වැන්න නම් ඉහත කී දෙපාර්ශවය විසින් විශ්වයට මුදාහරින නරක දුෂ්ට සිතුවිලි තරංගයක් මගින් සත්ව සහතිකයේ පැවැත්මට සුභවාදී මෙහෙවරක් යෙදුනු ස්වභාව ධර්මයේ ක්‍රියාදාමය විකෘතිය ගෙන දෙන පීඩාවේ.

බුදුරජාණන් වහන්සේ පිවිතුරු දහම් මඟට පිටුවා විකෘති මානසිකත්වයෙන් යුක්ත වූ මිනිසුන් ගෙනයන මේ අපරාධකර ක්‍රියාමාර්ග අභිමුඛයෙහි අප කුමක් කළ යුතුද? නොදරුවන් රෙදිපිළි ගේ දොර අපිරිසිදු කරයි. වැඩිහිටියන් ඒවා පිරිසිදු කොට යථා තත්වයට ගනී. අනුවණා වූ මිනිසුන් ලෝකය වනසද්දී නැණවතුන් යළි යළිත් එය සනසාලිය යුතුය.

පව්කාරයන්ගේ සිත්වලින් මුදාහරින දූෂිත චේතනා මර්ධනය කොට බලවත් ලෙස නැගී සිටිය හැකි යහපත් චේතනා යහපත් මිනිසුන් විසින් මුදාහල යුතුය. ඉවසීම, කරුණාව, මෛත්‍රිය වැනි බුද්ධ පාක්ෂික සාධු චරියාවන් ඒ සඳහා යොදාගත හැකිය. දැවෙන සිත් නිවන්න, මෙත් වඩන්න, සෙත් පතන්න. එවිට අපට ලෝකය නිවැරදි කිරීමට දායක විය හැකිය. ධම්ම පදයෙන් උපුටාගත් මේ ගාථා ධර්මය කියවා බලන්න.

*" පුප්ඵානිහේව පචිනන්තං - බ්‍යාසත්ත මනසං නරං*
*සුත්තං ගාමං මහෝ ඝොව - මච්චු ආදාය ගච්ඡති "*

කාමය, ලෝක පැවැත්ම තහවුරු කරන තදබල බැඳීමකි. ලෝකය ලෙස අදහස් කළේ පෘතුවිය හෝ වෙනත් ග්‍රහලෝකයන් ගැන නොව අපගේ මේ ස්කන්ධ පංචකයයි. (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ) භාවය ලෙසද මේ ලෝකය හදුන්වයි. ආත්මභාවය ලෙස එයට උරුමයක් ද ලබාදී තිබේ. මේ ආත්මභාවය නැමැති ලෝකය මගේ ලෝකය ලෙස අයිතිකරගෙන සැප සොය සොයා වෙහෙසෙන්නේ කාමයේ උත්තේජනය පදනම් කරගෙනයි. වස්තු කාම, ක්ලේශ කාම යැයි කාමය දෙවැදෑරුම්ය. ගේ දොර, වතු පිටි, ඉඩ කඩම්, යාන වාහන, මිල මුදල් ඇඳුම් පැලඳුම් ආදී ආකර්ශනීය යුගලපද ලේඛනයකින් හඳුන්වා ඇති සකලවිධ වස්තු සියල්ල කෙරෙහිම අප තුළ ඇති ආශාව වස්තු කාම ලෙසත්, ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංච ඉන්ද්‍රියන් මගින් ලබාගන්නා පංචකාම (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ) කෙරෙහි පවතින දැඩි ආශාව ක්ලේශ කාම ලෙසත් බුදුදහමේ හදුන්වා තිබේ. මේ සියලු ආකාරයේ කාමයන් කෙරෙහි බැඳී ලද දෙයින් තුටු නොවී නොලද දෙය ගැනම සිත සිතා දුක් වෙවී අකුසල් සිත් උපදවා මරණින් පසු දුගතියෙහි උපදින බවයි. මේ ගාථා ධර්මයෙන් කියා දෙන්නේ.

සැවැත්නුවර පසේනදී කොසොල් රජතුමා දිනක් උඩු මහලේ සිට මහමග ගමන් කරන පිරිස් දෙස බලාසිටියදී සිත් පහන් කරවන දසුනක නෙත ගැටුණි. එනම් විශාඛා සිටු දියණිය අනේපිඩු සිටුතුමා ආදී සැදැහැ සිත් ඇති මහෝපාසිකාවනගේ නිවෙස් කරා දන් පිණිස වඩින භික්ෂූන් වහන්සේලාගේ දසුනයි.

අනතුරුව කොසොල් රජතුමා ද බුදුරජාණන් වහන්සේ බැහැදැක තම නිවසට ද දන් පිණිස වඩින ලෙස බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළහ. මේ අනුව සත්දිනක් මුළුල්ලෙහි බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දන් පිළිගැන්වූහ. සත්වන දිනයේ දී ද මහරජු පසුදින දානයට ආරාධනා කරද්දී බුදුවරු දින හතකට වඩා එකම ස්ථානයකින් නොවළඳන්නේ යැයි දේශනා කළ බුදුරජාණන් වහන්සේ එම ආරාධනාව ආනන්ද මහ තෙරුන් වහන්සේ වෙත භාර කළහ.

ආනන්ද මහ තෙරුන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ සතියක් එහි පිළිවෙලින් දන් වැළඳූහ. අටවෙනි දිනයෙහි කොසොල් රජතුමා රාජකාරී කටයුතු වෙනුවෙන් වෙන්වී දානමය කටයුතුවල යෙදීමට නොහැකි විය. රජගෙදරින් අණක් නොලැබුණු කල්හි එහි සේවක සේවිකාවෝද දන් පිළියෙල කිරීමෙහි නිරත නොවී සිටියහ. දානය පිණිස මාළිගාවට වැඩි බොහෝ භික්ෂූන් වහන්සේ බලා සිට කල් ඉකුත්ව ඇති බැවින් ආපසු වැඩම කළහ. එදින මහරජු පන්සීයක් දෙනා වහන්සේ සඳහා පිළියෙල කළ ආහාර එසේම තිබෙනු දැක කිපී බුදුන් වහන්සේ වෙත ගොස් භික්ෂූන් මා ගැන නොසිතා යාමට හේතුව කුමක්දැයි ප්‍රකාශ කළහ. එවිට තථාගතයන් වහන්සේ භික්ෂූන් අතර වරදක් නැත මහරජ, ඔබ කෙරේ මගේ ශ්‍රාවකයන් තුළ කිසිදු විශ්වාසයක් නැත. එනිසා එහි නොගියේය. යනුවෙන් වදාළ සේක. එහිදි තථාගතයන් වහන්සේ භික්ෂූන් අරඹයා කරුණු නමයක් පෙන්වාදී භික්ෂූන් වහන්සේලා එම ස්ථානවලට පමණක් යා යුතු යැයි දේශනා කළහ. එම ස්ථානයන් මෙසේය.

- භික්ෂූන් එනු දැක සතුටු සිතින් නැගිට සිටීම
- සතුටු සිතින් වඩා හිඳුවා පසග පිහිටුවා වැඳීම.
- සතුටු සිතින් සුදුසු අසුන් පනවා වඩා හිඳුවීම.
- ඇති දෙය නොසඟවා දීම.
- බොහෝ ඇතිවිට බොහෝ කොට දීම.
- මිහිරි දෙයම සකස් කොට දීම.
- දෙන දෙය සකස් කොට දීම.
- අනුමෙවෙනි බණ අසන්නට ලැදිව හිඳීම.
- බණ අසන විට කන්දී මනාව ඇසීම.

මෙම දේශනාව අවසානයේ රජතුමා තීරණය කළේ බුදුරජාණන් වහන්සේ ඥාතී සම්බන්ධතාවයක් තිබෙන නම් මෙතරම් මා අවතක්සේරු නොවනු ඇත කියාය. උන්වහන්සේ ඥාතී කුලයකින් විවාහයක් කරගතහොත් බුදුන් වහන්සේ ඥාති රජවරුන් නිතර මා හමුවීමට පැමිණේවි යැයි සිතා මට සරණ පිණිස දියණියක් එවන්න යැයි ශාක්‍යයන් වෙත පණිවුඩයක් යැවීය. කුලමානයෙන් මත්ව සිටි ශාක්‍යවංශිකයෝ තම වංශයට නොගැළපෙන රජකෙනෙකුට සිය කුමරියන් පාවාදීමෙන් සිය වංශයට සිදුවන හානිය සළකා මහානාම ශාක්‍ය රජහට දාව දාසියකගේ කුසින් උපන් වාසභ ඛත්තියා නම් තරුණියක් ඒවා කොසොල් රජ මුලා කළේය. ඇය නොබෝ කලකින් බිහිකළ පුතු විඩූඩභ නම් විය.

විඩූඩභ කුමරු දාසය වන වියට පත් කල්හි මුතුන් මිත්තන් දකින්නට කිඹුල්වතට ගොස් ආපසු පැමිණි විට දාසියකගේ පුතු වාඩිවූ පුටුව යැයි කියමින් සේවිකාවක් ඔහු පුටුව සෝදන්නට විය. විඩූඩභ කුමරුගේ සේවා භටයෙක් සිය ආයුධයක් අමතකවීම නිසා රැගෙන එන්නට ආපසු ගියවිට මේ ක්‍රියාව දුටුවේය. ඔහු සැනෙකින් පැමිණි කුමරුට සියලු තොරතුරු දන්වීය. කුමරු ඒ අසා කුපිතව යම් දිනක මා රජ වූ විට ඔවුන්ගේ බෙලි කපා ලේ වලින් මා හුන් ඒ පුටුව සෝදවමියි අදිටන් කොටගෙන සිටියේය. කොසොල් රජු මිය ගිය විට විඩූඩභ රජ පැමිණ නොබෝ දිනකින් ශාක්‍යයන්ට එරෙහිව යුද සෙනඟ පිරිවරා කිඹුල්වතට යාමට පිටත් විය.

බුදුරජාණන් වහන්සේ එදවස ලොව බලා වදාරා තම ඥාතින්ට එරෙහිව විඩූඩභ යුද වදින්නට සැරසෙන බව දැන එහි වැඩම කොට අතරමඟ තනි සෙවණ සහිත ගසක් මුල වැඩ සිටියහ. විඩූඩභ බුදුරජාණන් වහන්සේ දැක සමීපයට ගොස් වැඳ මෙසේ විමසයි.ස්වාමීනි, මේ ග්‍රීෂ්ම වෙලාවෙහි තුනී සෙවණැති ගස මුල වැඩ සිටින්නේ ඇයි? එවිට බුදුරජාණන් වහන්සේ ඥාතී සෙවණ සිසිල් වෙයි. යනුවෙන් දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ ඥාතීන්ට උපකාර පිණිස පැමිණි බව දැන විඩූඩභ ආපසු සැවැත්නුවරට ගියේය. මේ අයුරින්ම දෙවන තුන්වන වර ද සිදුවිය. සතරවන දින ද විඩූඩභ යුදයට ගොස් අචිරවතී ගඟ අසල කඳවුරු බැඳගෙන සිටියදී රාත්‍රී මහා ගංවතුරක් ගලා විත් විඩූඩභ රජු ඇතුළු පිරිස මුහුදට ගසා ගෙන ගියේය. මල් කඩ කඩා රැස් කරන තැනැත්තෙකු මෙන් මෙලොව පබ්කම් නැමැති මල් සොයන්නා වූ එහි තදින් ඇලුනාවූ සත්වයා නිදා සිටි ගමක් මහ මුහුදට ගසාගෙන යන පරිදි මෘත්‍යුමාර විසින් සතර අපාය නැමැති මුහුදට රැගෙන යයි.

මේ විෂකුරු සසරේ අප ලද මිනිසත් භාවය මුළාවට නොව සසරින් මිදීම පිණිස යොදාගෙන කටයුතු කිරීම වැදගත් බව මේ ධම්මපදයෙන් ප්‍රකාශ වෙයි. ඔබ සැමට ඒ දහම් මඟ විවර වේවා.

ශාස්ත්‍රපති
වික්‍රමසිංහ අතපත්තු

04 පිටුවෙන්....

# ආර්ය විනයට අනුව පාපයන්ගෙන් මිදෙන අයුරු

සසරට ඇද දමන සසර අනේක විධ දුක් හා අපා දුක් ඇති කරවන මේ මුසාව සංයෝජනයකි. නිවන වසාලන නීවරණයකි. මෙලොව වශයෙන් පිරිහීමට පත්වේ. මානසික පීඩනය අසහනය ඇති කරයි. එබැවින් නුවණ මෙහෙයවා මෙම සංයෝජනයෙන් මිදී සිටින්නාහුගේ සිත මෙලොව වශයෙන් සතුටට, ප්‍රීතියට, සැනසීමට පත් කරයි.

**04. කේලාම් කීම, පරුෂ වචන කීම නම් අකුසල කර්ම දෙකද ඉහත අයුරින් බලන්න.**

**05. පරිත්‍යාගය දියුණු කොට ගිජු ලෝභය ප්‍රහාණය කරන්න.**

ඉහත කරුණ සම්බන්ධයෙන් ආර්ය ශ්‍රාවකයා ප්‍රඥාවෙන් මෙසේ විමසිය යුතුය. ගිජු ලෝභය හෙවත් දැඩි ලෝභය ඇති කර ගැනිමෙන් පුද්ගලයා මෙලොව, පරලොව දෙලොවම පරිහාණියට පත්කරගනියි.

දැඩි ලෝභයෙන් කටයුතු කරන්නාට ඥාති සම්පත්තිය හා මිතුරු සම්පත් හීනවේ. දනක්, පිංකමක් කළත් ලෝභ සිතුවිලි නිසා එයින් සාර්ථක ප්‍රතිඵලයක් ගෙන නොදේ. ඇසුරු කරන්නන්ට මහා කනස්සලු ඇති කරයි. බුද්ධිමතුන්ගේ ගර්හාවට ලක්වේ. ජීවිත අවසානයේ එතෙක් පැවති ගිජු ලෝභය සිහිවී සතර අපායට පත්වේ. ගිජු ලෝභය හේතුවෙන් මෙලොව සහනය නැතිවේ. පරලොව සුගතියද අහිමි වේ. තමා විසින් කරන ලද අකුසල් නිසා තමාගේ සිත තමාටම දොස් නගයි. එබැවින් ගිජු ලෝභය සංයෝජන උපදවන්නක් බව දැන දෘඪ අධිෂ්ඨානයෙන් බලා ගිජු ලෝභය අත්හැරිය යුතුය.

**06. නින්දා අපහාස නොකිරීම භාවිතයෙන් නින්දා අපහාස ප්‍රහාණය කිරීම.**

ඉහත දැක්වූ කරුණු අනුව මෙහි ඵල විපාක විසඳාගත යුතුය.

**07. ක්‍රෝධ උපායාස නොකිරීම භාවිත කිරීමෙන් ක්‍රෝධ උපායාස ප්‍රහාණය කළ යුතුය.**

ක්‍රෝධය යනු දැඩි ලෙස වෛර බැඳගැනීමයි. උපායාස යනු ක්‍රෝධය කරණකොට ගෙන යම් යම් ස්ථාන හා අවස්ථාවල වචන මගින් හා ක්‍රියා මගින් කම්පනය ඇති කිරිමයි.

මෙයද ඉහත අයුරින් ප්‍රඥාවෙන් බලා මේ හේතුවෙන් ලැබෙන මෙලොව පරලොව දඬුවම් බලා ක්‍රෝධ උපායාස දුරුකර ගත යුතුය.

**08. අනතිමානීබව ඇති කර ගැනීමෙන් අති මානය ප්‍ර හාණය කිරීම.**

මානයෙහි අවස්ථා තුනකි. එනම් නිහතමානිබව, අනතිමානි බව හා අතිමානයයි. නිහතමානිබව යනු නි + හත + මාණී = නි යනු නැත යන්නයි. හත යනු ඒකාන්තයෙන් මානි යනු මානය. එනම් මානය සම්පූර්ණයෙන් නැතිකළ යන්නය. එනම් රහතන් වහන්සේය. අනාගාමි උතුමන් ලඟද මානය තිබේ. මානය යනු තමා පිළිබඳවත් අනුන් පිළිබදවත් විවිධාකාරයෙන් මැන බැලීමයි.

අතිමානය යනු මානයේ උපරිම කාලයයි. එම උපරිම බව යම් පමණක් වර්ධනය කරගෙන අවබෝධයෙන් බුදුමඟ යන ශ්‍රාවකයා අනතිමානිවේ. අනතිමානිබව නැති කර ගැනීමට තමා පිළිබඳවත් අන්‍යයන් පිළිබඳවත් සත්‍ය හා සාධාරණ ලෙස ප්‍රඥාවෙන් බැලිය යුතු එනම් තමා යනු දෙතිසක් වූ පිළිකුල් සහගත කොටස්ය. එසේම නාම රූප සමුදායක් පමණි. ආදී වශයෙන් දැකීමය.

මෙම කරුණු අට පිළිපැදීමෙන් වුවද ආර්ය විනයෙහි සෑම ආකාරයකින්ම සියළුම ව්‍යවහාර සමුච්ඡේද නොව බව තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළහ. මෙය පැහැදිළි කිරීමට බුදුරජාණන් වහන්සේ උපමා කීපයක් දේශනා කොට වදාළහ.

"පෝතලීය කුසගින්න නිසා පීඩිත වූ බල්ලෙකුට ලේ පමණක් තැවරුන මස් රහිත කටුවක් ලැබේ. පින්වත දැන් බල්ලා කරන්නේ කුමක්ද? මුලින් ලේ ටික ලෙවකා මස් රසය ඇත්තේ ඇතුලතැයි සිතා ඉතාම වෙහෙස වෙමින් මස්කටුව හපයි. එයින් ඔහුගේ අරමුණ සම්පූර්ණවේද? නැත.

කුසගින්නෙන් පීඩිත වූවහු තවතවත් අසරණ වෙයි. එනිසා බුද්ධ ශ්‍රාවකයා නුවණින් කල්පනා කරන්නේ බුදුරජාණන් වහන්සේ කාමයට උපමා කොට තිබෙන්නේ සාගින්නට ලැබෙන්නේ මස් කටුවක් බවය. කුසගින්නට ආහාරයට ගත නොහැකි කටුවක් හපා වෙහෙසට පත් වන්නේ කෙසේද මිහිරක් සුවයක් ලැබෙතැයි සිතා කාම ගෝචරවූවන් එයින්ම වෙහෙසට පීඩාවට පත්ව මතු භවයද අපාගත කරගනී.

එසේ නම්, ඇස, කණ, නාසය, දිව, ශරීරය කියන ආයතන පහ පිළිබඳවත් භාෂිතයට අනුව ගිජුලිහිණියෙක් මස් කැබැල්ලක් ගෙන පියාසර කරන වට පසුපස හඹාඑන අනෙකුත් පක්ෂීන්ගෙන් විඳින පීඩාව සේ හොඳින් දැවෙමින් තම අතින් අල්ලාගෙන සිටින කණ හුල සේ සියලු මාර්ගයන් අතහැර මහා ගිණි අඟුරු වලක් වෙත යන්නා සේ කිසිදා සත්‍ය නොවන සිහිනයක් සේ මෙම ඉන්ද්‍රිය පහ තුළින් ගෝචර කරගන්නාවූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නිසා ඇති කරගන්නා වූ කාමයන් හේතුවෙන් බොහෝ දුක් උපදවන බවය. එබැවින් සීල, සමාධි, ප්‍රඥා උපදවා ගෙන සෝවාන් ආදී මගඵල ලබාගැනීමෙන්ම මෙම සක්කාය දිට්ඨි ආදී සංයෝජන සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම තුළ ආර්ය විනයෙහි කර්ම

මහ නිවන ලබත්වා.

06 පිටුවෙන්....

තමන්වත් පුළුස්සා මරාදමතැයි සිතා පසේ බුදුරදුන්ගේ ලෝමයකටවත් හිංසා කරන්නට ඒ ගින්න හේතු නොවූවත් සිතින්සිතාම පසේ බුදුන් දවමියි සිතා ගිණි දැල්වීම හේතුවෙන් මේ කාන්තා පිරිස කල්පයක් අපාදුක් විඳ මේසා විශාල ධර්මාවබෝධයකුත් ලැබ ගිණි වැදී මියැදෙන්නට හේතු වූ බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළසේක.

12 පිටුවෙන්...

සිතෙහි ස්වභාවය වන්නේ අන්‍යෝන්‍ය වශයෙන් සිතුවිලි සමග එකට බැඳී පැවතීමය. ලොව දෙවියෙක්, මනුෂ්‍යයෙක්, බුදු කෙනෙක් වන්නේද මනුෂ්‍යාමය. එලෙස විෂම බවක් පවතින්නේ සිත අපවිත්‍ර කර ගැනීම හා පිරිසිදු කර ගැනීම තම තමාම කරන කාර්යක් බැවිනි. ජෝන් මිල්ටන් නම් කවියා සඳහන් කොට ඇත්තේ සිතට අවශ්‍ය නම් අපාය තුළ දෙව් ලොවක් ද දෙව්ලොව තුළ අපායක්ද මැවිය හැකි බවයි.

සිතේ පිරිසිදුබව කායික නිරෝගිතාවය වැඩිවීමට සෘජුවම බලපානු ඇත. බොහෝ දුරට 80% ක් 85% මානසික රෝග පවතින බව අද වෛද්‍ය විද්‍යාව තුළින් සොයාගෙන ඇත. දිනකට සිතක සිතුවිලි 60000ක් ඉපදෙන බව අද මනෝ විද්‍යාඥයින් සොයාගෙන ඇත. ඒ අනුව නිරන්තරයෙන් සිත පිළිබඳ හැරී බැලීම වැදගත් වේ. එදාටත් වඩා අද සිත අපිරිසිදුවීමේ ක්‍රම වැඩිය.ඉන්ද්‍රියන් වලට බොහෝ දුරට ගැටෙන්නෙම අසුභ දේවල්වීම එයට හේතුවයි. ඒ නිසාම සිත නීරෝගිමත් කර ගැනීමටත්, සිත දියුණුකර ගැනීමටත්, සිත පාලනය කර ගැනීමටත්, සිදු වී ඇත. ඒ අනුව පුහුදුන් සත්වයෝ තම තමාම දෙස තම තමාම බලා සිතේ ස්වභාවය හඳුනාගෙන එය සසර ගමනට අහිතක් නොවන ආකාරයෙන් රැකබලා ගැනීමටත් සිත දියුණු කර ගැනීමටත් උත්සාවත් වෙත්වා.

# දශබලධාරි වූ බෝධිසත්ත්වයෝ



බෝධි සත්ත්වයෝ මහා බල සම්පන්නය. මේ නිසාම උන්වහන්සේ දශබලධාරී ලෙසද හඳුන්වන්නාහුය. එය භාවිතයක් පමණක් නොව සැබෑවටම බලසම්පන්න බව මේ ආකාරයයි බෞද්ධ සාහිත්‍යය ග්‍රන්ධවල සඳහන් වේ. එය මෙසේ දක්වා ඇත.


- "නාරායණ" බලයෙන් ඡද්දන්ත ඇතුන් දසදෙනෙකුගේ බල ඇති බව
- "උපොසථ" කුලයෙන් සියක් ඇතුන්ගේ බල ඇති බව
- "හෙම" කුලයෙන් දහසක් ඇතුන්ගේ බල ඇතිබව
- "මඞගල" කුලයෙන් දස දහසක් ඇතුන්ගේ බල ඇති බව
- "ගන්ධ" කුලයෙන් ලක්ෂයක් ඇතුන්ගේ බල ඇති බව
- "පිඞ්ගල" කුලයෙන් දශලක්ෂයක් ඇතුන්ගේ බල ඇති බව
- "තම්බ" කුලයෙන් කෙළක් ඇතුන්ගේ බල ඇති බව
- "පණ්ඩර" කුලයෙන් දස කෙළක් ඇතුන්ගේ බල ඇති බව
- "ගඞ්ගෙය්‍ය" කුලයෙන් කෙළ සීයක් ඇතුන්ගේ බල ඇති බව
- "කාලාවක" කුලයෙන් කෙළ දහසක් ඇතුන්ගේ බල ඇති බව
- මධ්‍යම පුරුෂ ගණනායෙන් දස කෙළ දහසක් පුරුෂයන්ගේ බල ඇති බව

මෙවන් වූ එකොළොස් දහස් එක්සිය එකොළොස් කෙළ එකොළොස් ලක්ෂ එකොළොස් දහස් එක්සිය ගුණයේ බලවත් වූ හෙයින් බෝධි සත්ත්වයෝ දශ බලධාරී වන සේක.

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 නොවැම්බර් - 2564 ඉල් කලාපය

# පිවිකාරයා

# දෙලොවම තැවෙයි



සතුන් මැරීම, සොරකම් කිරීම ආදී පස්පව් දස අකුසල් කළ තැනැත්තා තමන් කළ පව්කම් සිහිකරමින් මෙලොවදී තැවෙන බවත් මෙලොවදී කළ කර්මවල විපාක වශයෙන් මරණින් මතු සතර අපායාදී දුගතිවල ඉපිද දුක් විඳින බවත් බුද්ධ දේශනාවේ සඳහන් වේ. මේ බව ප්‍රකාශවෙන දේශනා අතර ධම්මපදයේ යමක වග්ගයේ 17 වන ගාථාවෙන් කළ පැහැදිලි කිරීම ගැන අවධානය යොමුකරමු.

ඉධ තප්පති පෙච්ච තප්පති
පාපකාරී උභයත්ථ තප්පති
පාපං මේ කතන්ති තප්පති
භිය්‍යො තප්පති දුග්ගිතිං ගතෝ

ධම්මපදයේ ඇතුලත් සෑම ගාථා ධර්මයකටම යම් නිධාන කථාවක් පවතී. ඉහත දැක්වූ ගාථාව දේවදත්ත තෙරුන්වහන්සේ දුගතිගාමී වීම පිළිබඳ කළ දේශනාවකි.

අනෝමා නදී තීරයෙහි පිහිටි මල්ලරට අනුපිය නම් වූ අඹ උයනක බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරද්දී අසූ දහසක් පමණ ශාක්‍ය වංශික කුමාරවරු පැවදිබව ලැබූහ. ඒ අතර සුවිශේෂී වූ කුමාරවරු හය දෙනෙක් වූහ. එනම්, භද්දිය, අනුරුද්ධ, භගු, කිම්බල, දේවදත්ත යන අයයි. මොවුන් අතරින් භද්දිය තෙරුන් වහන්සේ නොබෝ දිනකින් ත්‍රිවිද්‍යාලාභී වූහ. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද දිවැස් ලැබ රහත් වූහ. ආනන්ද කිම්බිල යන තෙරුන් වහන්සේලා ද පසුකාලීනව රහත්වූහ. දෙව්දත් තෙරුන් වහන්සේ රහත් නොවූහ. එහෙත් ලෞකික සෘද්ධිබල ලබා සිටියහ. එම සෘද්ධිබලය මහා බලයක් ලෙස පෙන්වා බිම්බිසාර මහරජපුත් අජාසත්ත කුමරු පහදවාගෙන නොයෙකුත් වැරදි මගපෙන්වීම් ලබාදුන්හ.

අජාසත්ත කුමරු සිය පියා ඝාතනය කොට පිතෘඝාතක අකුසල කර්මය සිදුකර ගත්තේය. බුදුන් වහන්සේ කෙරෙහි බැඳුණු දැඩි වෛරයක් නිසා බුදු පදවිය ලබා ගැනීම පිණිස විවිධ පාපකර්මවල යෙදුනු දේවදත්ත තෙරුන් සංඝ භේදය හා බුද්ධ ශරීරයේ ලේ සෙලවීම යන ආනන්තරිය පාප කර්මවල යෙදීම නිසා රහත් නොවී අවීචිමහා නරකයට පත්විය. ඒ සංවේගදායී අවස්ථාව මදක් සිහිකර බලමු.

බුදුන් වහන්සේ ඇතුළු මහා සංඝ පිරිවර කෙරෙහි පහන් සිත් ඇති සැදැහැතියෝ විවිධ අයුරින් උන්වහන්සේලා පිදූහ. අසූමහ ශ්‍රාවකයන් වහන්සේලා කෙරෙහි ද මහජන ප්‍රසාදය වැඩිවූහ. දෙව්දත් තෙරුන් කෙරෙහි කිසිදු ප්‍රසාදයක් නැත.

මේ බව දැන බුදුන්වහන්සේගෙන් භික්ෂු සංඝයා පාළනය කිරීමට වරමක් (අවසරයක්) ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේගෙන් එය ප්‍රතික්ෂේප විය. පසුව භික්ෂූන් වහන්සේලා කෙරෙහි පංචවරයක් පනවන ලෙස ඉල්ලා සිටියහ. එනම්

1. භික්ෂුව දිවි හිමියෙන් ආරණ්‍ය ගත විය යුතුය.
2. භික්ෂුව දිවි හිමියෙන් රුක්ඛමූල ගත විය යුතුය.
3. භික්ෂුව දිවි හිමියෙන් මස් මාංශ අනුභව නොකළ යුතුය.
4. භික්ෂුව දිවි හිමියෙන් පිණ්ඩපාතික විය යුතුය.
5. භික්ෂුව දිවි හිමියෙන් පාංශුකූල චීවරය පමණක් දැරිය යුතුය.

ඒ සියල්ල ද බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ කල්හි සංඝ භේදය කොට ශ්‍රාවකයින් වහන්සේලා පන්සිය නමක් බුදුරජාණන් වහන්සේගෙන් වෙන්කරගෙන ගයා ශීර්ෂයට ගොසු විසූහ. පසුව අගසව් දෙනම එහි ගොස් උන්වහන්සේලාට නිවන් අවබෝධ කරවා රැගෙන ආහ. පසුව නව මසක් ගිලන්ව සිටි දෙව්දත් තෙරුන් බුදුන් දකිනු කැමතිව හඬා වැළපුනහ. දෙව්දත් තෙරුන් යහනක තබා භික්ෂූන් වහන්සේලා විසින් ඔසවාගෙන එන අතරතුර දෙව්රම් වෙහෙර සමීපයෙහි පොකුණ අසල පිපාසයට පැන් ඉල්ලා සිටියදී පැන් බීමට බිමට බසිත්ම පොළව පලාගෙන අවීචිමහා නරකයට ඇද ගෙන ගිය බව සඳහන් වේ. අවසන් මොහොතේ ඔහු බුදුන් සරණ ගියද කළ මහා පාපකර්මවල විපාකය බලවත් විය. මේ සිදුවීම පිළිබඳ සංවේගය පලකළ තථාගතයාණෝ ඉහත දැක්වූ දේශනාව සිදුකළහ.

මේ අනුව පව්කරන පුද්ගලයා මෙලොවදී තැවෙයි. පරලොවද තැවෙයි. දෙලොවම තැවෙයි. මා විසින් පව්කරන ලදැයි සිහිකොට තැවෙයි. දුගතියට ගොස් බොහෝ සේ තැවෙයි. මෙහිදී දුගති ලෙස දැක්වෙන්නේ නරක, තිරසන්, ප්‍රේත, අසුර යන අපාය සතරයි. නරකය, සංජීව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහා රෞරව, තාප, ප්‍රතාප අවීචි යනුවෙන් අටවැදෑරුම් වේ. මේ නරකයන්හි පරිවාර නරක දාසයක් ද ඇත. සියළු නරකයන් එකසිය තිස් හතකි.

තිරිසන් යෝනියේ උපන් සත්වයෝ කාමයෙන් හා බියෙන් තැවෙන්නෝය. යමෙක් මෝහයෙන් මුළාවී අකුසල් කරයි ද ඔවුහු තිරිසන් අපායට පත් වී බොහෝ දුක් විඳිති. ප්‍රේත භවය සම්පූර්ණයෙන්ම සැපයෙන් තොර වූවකි. දන් නොදීම, ඊර්ෂ්‍යා කිරීම, ලෝභකම, දස අකුසල් කිරීම අනුන්ගේ ලාභ වැළැක්වීම, මව්පියන් කෙරෙහි විලිබිය නැතිබව, පින්කරන අයට හිරිහැර කිරීම, අනුන්නට පරිභව කිරීම, අල්ලස් ගැනීම, අගතියෙන් වැඩ කිරීම ආදී අකටයුතු මගින් ප්‍රේත ලෝකයෙහි උපදින බව සඳහන් වේ. ඔවුන් සා පිපාසා දෙකින් පීඩා විඳිමින් කෙළ සොටු මළ ආදිය කමින් දුක් විඳිති.


අසුර යෝනිය යනු මුව්න් බැහැර උඩට හෝ යටට නෙරාගිය දත් පිහිටා ඇති සත්ව කොටසකි. දෙවියන්ට සතුරු වූ බැවින් අසුර නම් වේ. අසුරයෝ ප්‍රධාන වශයෙන් දෙකොටසකි. එයින් වේපචිත්ති නම් අසුරයන් දෙවියන් සමානව සැප විඳිති. කාලකඤ්ජ නම් අසුරයෝ දුක් විඳිති.

මේ අනුව මග වරදාගත් එවන් චරිත පිළිබඳව සිතා නිවන් මග සුචරිතවත් මාර්ගයක් ඔස්සේ පවතින බව තේරුම්ගෙන අපිදු අපායගාමී පිළිවෙත් අතහැර දුකින් මිදෙමු. විපත හා සැපත ඇස් මනාපිට පෙනී පෙනී පාපයන් තුළින් පහත් වින්දන නොලබා උතුමන් ඇසුරු කොට උතුම් පිළිවෙත් පිළිපැද සසරින් මිදෙමු.

කුරුණෑගල විශුද්ධායන විද්‍යායතන පිරිවෙන් ආචාර්ය
ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු

## - ධම්මපදයෙන් -





## " යහමඟ සුව.... "

කැටමුගුරු ගෙන
තලා තවකෙක්
සැප හොයයි නම්
කෙනෙක් මෙලොවේ...
ඔහුට කිසි ගැලවුමක්
නම් නැත,
පරලොවදී දුක් නියත වේ...

බයයි දඬුවම්වලට කව්රුත්
බයයි මරණෙට යන්ට කව්රුත්
ඒවගෙයි ලොව සෑම සතෙකුම
සිතව් ! ඒ වග මිනිසුනේ....

කව්ද අකමැති සැප විඳින්නට
කව්ද කැමතී දුක් විඳින්නට
සිතා ඒ ගැන අනුන් නොතලා
සොයමු සුව දෙන යහමගේ...

දණ්ඩ වග්ග (129/1 - 132/4 ඇසුරිණි)

*පී.එම්. අභංගම*